
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2557ක් වූ වප් මස (ව්‍යවහාරික වර්ෂ 2013 ඔක්තෝබර්)

24 වෙනි කලාපය




රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය




# ගඟට කපන ඉනි...








ගඟකට කපන ඉනි ගඟ දිය ගෙන යන්නේ
අහකට යනව මිස නැත පිහිටට එන්නේ
මහ වැඩ ලෙසට පුහු වැඩටම වෙහෙසෙන්නේ
සහයට නොමැත ඒ වෙහෙසෙහි එල දෙන්නේ

කරන්නට ලොවේ බොහො වැඩ ඇතත් හොඳ
දරන්නට නුවණ ඇති මිනිසුනුත් මඳ
මැරෙන්නට කලින් ලොකුකම් කළත් බැඳ
හැරෙන්නට බැරිය පරලොව ගියොත් සඳ

කෙටි කලකට ලැබුව මනුසත් භවෙහි සිට
ගැටී ගැටී යනෙන උන් ලොව වස්තුවට බට
මිටි බැඳ ගන්න ඉර හඳ තරු කළද වට
හිටි හැටියේම මියයයි දුක් ඉතිරි කොට

මුදලින් කාලයෙන් වෙහෙසින් ඉතිරි කර
සදමින් යමක් ගන්නට හැකි විටදී හර
යොදමින් පුහු වැඩට කාලය මුදල වෙර
අදමින් දිවි ගෙවා වැනසෙති මෙලොව හැර

මෝහෙන් ලොවේ ඇන්දෙන මනුසත දිනක
දේහෙන් විසල්මුත් යහපත් නැත තැනක
දාහෙන් දිවි ගෙවා එල්ලීගෙන කුණක
නාහෙන් අඬනමුත් නැත නියැලෙන පිනක

රන් මෙන් වටින කාලය කෙළියට නොයවා
පින් දම් වැඩ කරනු මහ මුනි බස කියවා
සුන් බුන් වෙලා යන ලෝකෙක තතු සොයවා
ගොන්කම් නොකර ඉනු ලොව ගනුදෙනු පියවා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# ගුණ උපහාර පූජාවන්ගේ වටිනාකම...

දෙමවුපියන්ට, වැඩිහිටි ඥාතීන්ට, ගුරුවරුන්ට වැඳීම හෙළ බොදු සිරිතක්. මේ වැඳීම විශේෂයෙන් බොදුනුවන් අතර පවතින, අනෙකුත් බොහෝ පිරිස් අතර නැති විශේෂ චාරිත්‍රයක්. ''අපි කාටවත් වඳින්නෙ මොකටද? මනුස්සයො කවුරුත් එක සමානයි. එක් කෙනෙක් තව කෙනෙකුට වඳින එක මනුස්සකමට නොගැලපෙන දෙයක්....'' මෙහෙම භෞතිකවාදී අදහස් දරන පිරිස් සමාජයේ ඉන්නවා. මනුස්සයො කවුරුත් එක සමානයි කිව්වට, උපයන කොට නම් එහෙම දෙයක් නෑ. බොහෝ උදවිය උත්සාහ කරන්නෙ තමන්ගෙ ගොඩ ලොකු කර ගන්න මිසක් හැමෝටම සමානව බෙදන්න නෙවෙයි. කොහොම හරි මේ චාරිත්‍රය හෙලා දකින අය, හොඳ බෞද්ධයො කියල කියන අය අතරෙත් ඉන්නවා.



අපි මුලින්ම වඳින්න ඉගෙන ගන්නෙ අම්මටයි, තාත්තටයි. අම්මට වඳින්නෙ කොහොමද?

**දස මාසේ උරේ කත්වා**
**- පෝසේසි වුද්ධිකාරණං**
**ආයු දීඝං වස්සසතං**
**- මාතු පාදං නමා මහං...**

දස මාසයක් උරයක (ගැබ නමැති උරය) හිඳුවා ගෙන, (මට) කයක් ගොඩනගා ගැනීමට පෝෂණය ලබාදීමෙන් කරන ලද උපකාරයට වසර සියයක් ආයුෂ ලැබේවා... යි පතා මම ඔබේ පායුග වඳිමි. මේ තමයි අපි මුලින්ම ඉගෙන ගන්න ගුණ උපහාර වන්දනාව. ''මට කයක් ලබා ගැනීමට උපකාර වූ....'' කියන ගුණය සිහි කරලයි වඳින්නෙ. ඒක ගුණයක් වෙන්නෙ කොහොමද? මවු කෙනෙක් තමන්ගෙ කුසට ආව දරුවා කළුද, සුදුද, ලස්සනද, විරූපිද, රෝගියෙක්ද, අනාගතයේදී හොර තක්කඩියෙක්, බේබද්දෙක් වෙයිද, මහා පඬිවරයෙක් වෙයිද, සත්පුරුෂයෙක්ද, අසත් පුරුෂයෙක්ද.... ආදී මේ කිසි දෙයක් දන්නෙ නැති වුනාට, අවංකව දයානුකම්පාවෙන්, ගැබ නොහෙලා ජීවිතය රැක දෙනවා, පෝෂණය කරනවා. කුසෙන් බිහි වුනාට පසුවත් කැත කුණු නොබලා පිරිසිදු කරල, ලේ කිරි කරල පොවල පෝෂණය කරනවා. මෙන්න මේ අවංකකමට තමයි කය නමා වන්දනා කරන්න සුදුසු වෙන්නෙ.

ඒ වගේම පියාට වඳින්නෙ කොහොමද?

**වුද්ධිකාරෝ අලිංගිත්වා**
**- තුම්හිත්වා පිය පුත්තකං**
**රාජ මජ්ජං සුප්පතිට්ඨං**
**- පීතු පාදං නමා මහං**

වුද්ධිකාරෝ - අභිවෘද්ධිය කරා, අලිංගිත්වා - දුව, පුතා කියල ස්ත්‍රී පුරුෂ ලිංග භේදයක් සලකන්නෙ නැතිව කාගෙත් අභිවෘද්ධිය, යහපත තකා කටයුතු කරනවා. තුම්හිත්වා පිය පුත්තකං - ප්‍රිය පුතෙක් වශයෙන් යම් කිසි බයක් සැකක් නැතිව ඉන්න මග සකස් කරල දෙනවා, කටයුතු සලස්වල දෙනවා. රාජ මජ්ජං සුප්පතිට්ඨං - රාජ මධ්‍යයට මනා සේ පිහිටන්න පුළුවන් විදියට දරුවෙක් හදල දෙනවා. ඒ කියන්නෙ රජ්ජුරුවන්ගෙ රාජ්‍ය සේවකයෙක් විදියට රාජ උදහසට ලක් නොවී, රාජ්‍ය තාන්ත්‍රිකයෙක් විදියට රාජ සභාවට යන්න පුළුවන් වෙන්න මග සකස් කරල දෙනවා. එහෙම කළාම හොරෙක් විදියට නෙවෙයි නියම රට වැසියෙක් විදියට පෙනී සිටින්න පුළුවන්. පංච දුස්චරිතයන්ගෙන් වෙන් වෙලා රාජ මධ්‍යයට හරියට යන්න පුළුවන් විදියට මනා සේ පිහිටන්න උදව් කරන්නෙ තාත්තා. පීතු පාදං නමා මහං - එබඳු මග පෙන්වා දුන්නා වූ පියාණන්ගේ පාදය මම වඳිමි.

මේ තමයි ගාථාවෙන් කියවෙන නියම අර්ථය. හරි ගැඹුරු දෙයක් මෙතනින් කියවුණත් අද වෙනකොට අර්ථය වැහිල ගිහින්, නිකං ගාථාව කියල වඳිනව මිසක් මොකක්ද කිව්වෙ කියලවත් දන්නෙ නෑ.

මේ තමයි අම්ම තාත්ත දරුවන් හදල ඔවුන්ට සලකන හැටි. නමුත් දේපල, ඉඩකඩම් වගේ තමන්ට උපයා ගත හැකි දේවල් උපයා නොගෙන සමහර දරුවො, උඹ මට මොනවද කරල තියෙන්නෙ... කියල අම්ම තාත්තගෙන් අහනවා. ඉතින් අම්ම තාත්ත දන්නෙත් නෑ උත්තර දෙන්න. පැත්තකට වෙලා දුක් වෙවී, අපි දුක් විඳල දරුවො හැදුවෙ මෙහෙම අහන්නද... කියල හඬා වැටෙනවා. ඇයි? තමන් කරන දේ ගැන හරි අවබෝධයකින් කටයුතු කරල නැති නිසා. ඒ නිසා මතු කණගාටු නොවෙන්න කටයුතු කරන පිරිසක් වෙන්න නම්, කරන කියන කටයුතු ගැන අපි හොඳින් දැනුවත් වෙන්න ඕන.

''ඔව ආමිස පූජා. ඔව කරල නිවන් දකින්න පුළුවන්ද? නිවන් දකින්න නම් භාවනා කරන්න ඕන...'' මේ වගේ දේවල් තමයි අද වැඩිපුරම අහන්න ලැබෙන්නෙ. ආමිස පූජාවකත්, ප්‍රතිපත්ති පූජාවකත් වෙනස දැනගත්ත නම් මේ ප්‍රශ්නය විසඳෙනවා. බඩගින්නෙ ඉන්න කෙනෙකුට නැවතත් බඩගිනි වෙනකල් තමයි ඒ කෑම ටිකේ ප්‍රයෝජනය තියෙන්නෙ. ආ.... ආ.... කියල දුන්න මිසක්, ඒ ගත්ත පුද්ගලයට වෙනත් යහපතක් වුනේ නැත්නම් ඒක ආමිස දානයක්, ආමිස පූජාවක්. ගේ දොර, ඉඩකඩම් දුන්නත් ඒවායින් යහපත් ප්‍රයෝජනයක් ගත්තෙ නැත්නම් ඒවත් ආමිස පූජාමයි.

ප්‍රතිපත්ති කියන්නෙ සංස්කෘත වචනයක්. ඒකෙ පාළි වචනය තමයි පටිපත්ති. පටි + පත්ති කියන්නෙ, බැඳීම් පැත්ත දමන (බිඳ දමන) කියන එක.

නියම හෙළ වදන තමයි පිළිවෙත් (පිළි + වත) කියන්නෙ. ඒ කියන්නෙ පාපයට ලජ්ජා බය ඇති කරන වැඩ පිළිවෙළ. මේ අනුව සත්වයා සසරට බැඳිල ඉන්න දස සංයෝජන බිඳ හරින පූජා තමයි ප්‍රතිපත්ති පූජා කියන්නෙ. දස සංයෝජන බිඳ දැමූ බුදු, පසේ බුදු, මහ රහත් උතුමන් සහ ආර්‍ය මාර්ගය වඩන ආර්‍යන් උදෙසා ඒ අයගෙ ගුණ සිහි කරල කරන පූජාත්, තමන්ගෙ දස සංයෝජන බිඳ හැරිල නිවන් දකින්න උපනිශ්‍රය වෙනවා.

ලෝක සත්වයා අවිද්‍යාවත්, තණ්හාවත් නිසා ජාති, ජරා, මරණ.... ආදී එකොලොස් මහා ගින්නකින් දැවි දැවී, සතර අපාවල අනන්ත දුක් විඳිනවා. මේ මහා දුක් ගිනි කඳෙන් සදහටම නිදහස් වෙන්න මග හෙළි කරන්නෙ බුදුන් වහන්සේලා. දීපංකර බුදු පා මුලදී සතර පද ගාථාවක් අහල නිවන් දකින්න පින් පිරිල තිබුණ සුමේධ තාපසතුමා ''මම වගේ කෙනෙක් තනිවම නිවන් දකින එක තරම් නොවෙයි, මේ බුදුන් වහන්සේ වගේ මමත් බුදු වෙම්වා ලෝකයාත් සසර දුකින් මුදා, මමත් නිවන් දකිම්....'' යි මහා දයානුකම්පා සහගත උත්කෘෂ්ට ප්‍රාර්ථනාවක් කළා. ඒ වගේ දිගු ප්‍රාර්ථනාවක් නිසා, සමහර අත්බැව්වලදී අසත්පුරුෂ ඇසුරට වැටිල කරපු අකුසල් හේතුවෙන් අපා දුක් විඳින්නත් සිද්ධ වුනා.

සාර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මේ විදියට දුක් විඳිමින් තමයි පාරමිතා පිරුවෙ. සියලු බුදුවරයන් වහන්සේලා මේ වගේ අසංඛ්‍ය කල්ප ගණන්, ලෝක සත්වයා කෙරෙහි මහා දයානුකම්පාවෙන් බුදු බව පතා, අප්‍රමාණ දුක් විඳිමින්, මිහිරි වූ නිවන සඳහා පරතෙරටම (පාරමී) ගුණ දම් පුරල තියෙනවා. ඒ පුරන ලද ගුණ කදම්භය අසීමිතයි. එයින් උපදවාගත් ඥාන විද්‍යා අසීමිතයි. දේශනා කරපු තිලකුණු, සිවු අරිසස් (චතුරාර්ය සත්‍යය), පිළි සමුපා (පටිච්ච සමුප්පාදය), අරි අටඟි මග ආදී ධර්මස්කන්ධයත් සත්‍යයි. ඒ දෙසූ මග අනුගමනය කළොත් නිවන ප්‍රත්‍යක්‍ෂ කරගන්න පුළුවන් කියන විශ්වාසයෙන් ඒ මග අනුගමනය කරල, ප්‍රත්‍යක්‍ෂ කර ගෙන, ධර්මය දේශනා කරන මහා සංඝ රත්නයත් වන්දනීයයි.

බුද්ධ දේශනාවෙ හැටියට ලෝකෙ හැම දෙයක්ම ක්‍රියාත්මක වෙන්නෙ හේතු - ඵල දහම අනුව. එහෙම නම් **ගුණවත් කෙනෙකුගෙ ගුණ වර්ණනා කරල පූජා පැවැත්වීමෙන්, තමන්ටත් වර්ණනා කළ හැකි යහපත් ගුණ පිහිටනවා.** තුන් ලෝකාග්‍ර වූ බුදු පියාණන් වහන්සේගේ අනන්ත බුදු ගුණයන්ට උපහාර පූජා තැබීමෙන් තමන්ටත් මාත්‍ර වශයෙන් හරි බුදු ගුණ පිහිටනවා. බුදු හිමි දෙසූ ශ්‍රී සද්ධර්මයේ ගුණ සිහි කරල පූජා තැබීමෙන් ධර්මයේ ගුණ මතු වෙවී ධර්මයේ සත්‍යතාවය තමන්ටම වැටහෙන්න පටන් ගන්නවා. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණ පුරපු මහා සංඝ රත්නයේ ගුණ සිහි කර පූජා පැවැත්වීමෙන් ඒ ගුණ තමා තුලත් පිහිටනවා. ලෝකයේ අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාවය වටහා ගෙන, යම් කෙනෙක් නිවනම ශාන්තයි, ප්‍රණීතයි කියන අදහසින් මේ විදියට සූවිසි ගුණ සිහි කරල උපහාර පූජා කිරීමෙන්, ඒ අයට නිවන් මග වැඩීමට තියෙන විවිධ බාධක කරදර දුරු වෙලා, යහපතින් අභිවෘද්ධියෙන් ජයග්‍රහණය කරන්නත් හේතු වාසනා ලැබෙනවා.



ත්‍රිවිධ රත්නයේ ගුණ අනන්තයි. **අනන්ත ගුණ සිහි කරල කරන පූජාවෙන් ලැබෙන පිනත් අනන්තයි.** සැපයි, සතුටුයි කිය කියා පෙර ඇති කරගත් සසර ගනුදෙනු දුක් විඳ විඳා ගෙව ගෙවා යන එක තමයි අපි සසර පුරාවටම කරන්නෙ. දෙමවුපියන්, සහෝදර සහෝදරියන්, ශිල්ප ඉගැන්වූ ගුරුවරුන්, උදව් උපකාර කළ ඥාති හිත මිතුරන්, ඒ ඒ අත්බැව්වලදී රැකීරක්‍ෂා, වෙළහෙළඳාම්, ව්‍යාපාර ආදිය උපයා සපයා දුන් පිරිස් සංසාරයේ කොතැනක හිටියත් මේ මහා පින, ඒ අය විසින් කරන ලද පිනක් සේ චිත්ත ප්‍රසාදයෙන් අනුමෝදන් වෙත්වා...! එසේ අනුමෝදන් වීමෙන් සුඛිත මුදිත වෙත්වා...! සුවපත් වෙත්වා...! ඒ පින් අනුමෝදන් වීමෙන් සසර ණය ගනුදෙනුවලින් අපි නිදහස් වෙත්වා...! මේ විදියට කියල මේ මහා පින විහිදුවා පතුරුවා පිහිටුවන්න ඕන. මෙහෙම ඥාන සම්ප්‍රයුක්තව ප්‍රාර්ථනා කරල ණයෙන් නිදහස් වෙන්න පුළුවන්.

අද අපි හොඳ අය වුනාට, අනන්ත සසර ගමනේ මෙතෙක් දුර එනකොට, අපට බුදුවරු පන් ලක්‍ෂ දොලොස් දහස් විසි අටකටත් වඩා හමුවෙලා තියෙනවා. ඒ කියන්නෙ ගෞතම බුදුන් වහන්සේ පෙරුම් පුරන්න පටන් ගත්තු දවසෙ ඉඳල මේ දක්වා පහළ වෙච්ච බුදුවරුන් සංඛ්‍යාව. එතකොට ඊටත් පෙර ඉඳන්ම අපට ලොවුතුරා බුදුන් වහන්සේලා හමුවෙලා තියෙනවා. ඉතින් ඒ අනන්ත කාලය තුළ අපි බුදු බණ ඇහුවත් පිළිපැදල නෑ. ඒ නිසා තමයි මේ මහා දුක් ගිනි කඳ නොදැක, සසර තවමත් සැපයි කියල හිතන පිරිස් ඉන්නෙ. මේ සා දිග සසර ගමනෙදි අපි අනෙක් අයට අනන්ත අප්‍රමාණ හිංගි හිංසා කරල තියෙනවා. ඒවට දුක් විපාක විඳලත් තියෙනවා. නමුත් මතක නෑ. තව විඳින්න ඉදිරියටත් ඉතුරු වෙලා තියෙන්න පුළුවන්. මෙන්න මේ දුක් විපාක අතරින් බරපතල විපාකවලින් නිදහස් වුනේ නැත්නම් නිවන් මාර්ගයට බාධා පැමිණෙනවා. සූවිසි බුදු ගුණ උපහාර පූජාවලින් ලැබෙන පින, අපි අතින් වැරදි අසාධාරණ හිංගි හිංසා සිදු වූ ලෝක සත්වයින් සසර කොතැනක හිටියත් ඒ අයට විහිදී පැතිරී පිහිටනවා. මේ පින් අනුමෝදන් වෙත්වා! පින් අනුමෝදන්ව සුඛිත මුදිත වෙත්වා! මතු සසර වසනා තාක් එවැනි අවැඩ අසාධාරණයන්ට පත් නොවෙත්වා! සුවපත් වෙත්වා! මම ද මින් මතු එවැනි අවැඩ අසාධාරණ හිංගි හිංසා නොකරමියි... කියා පින් අනුමෝදන් කිරීමෙන් බොහොම-යක් පාප විපාකවලින් (ආනන්තරීය පාප කර්ම වැනි බරපතල අකුසල් නොවන) නිදහස් වෙන්න පුළුවන්. මේ විදියට කටයුතු කිරීම ණය නැති බව, වරදක් නැති බව කියන ගුණ පූර්ණ කර ගන්න වැදගත් වෙනවා.

පූජාවකදී තැන්පත් කරන පූජා වස්තු අනුව ලැබෙන ආනිසංස දැනගැනීමත් වැදගත්. අපි මල් පූජා කරල නිවන් ප්‍රාර්ථනා කරනවා. නමුත් මල් පිදීමේ අනුසස් හැටියට ලැබෙන්නෙ භෞතික සම්පත්. ඒ සම්පත් නිවන් දකින්න මග පුරන අයට ප්‍රයෝජනවත් වෙනවා. නමුත් මල් ගැන විදර්ශනාත්මකව මෙනෙහි කිරීමෙන්, ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත බව වටහා ගෙන නිවන් දකින්නත් පුළුවන්. මේ විදියට පූජා වස්තු අනුව ලැබෙන සම්පත් නිවැරදි විදියට ප්‍රයෝජන ගන්න අපි දැනුවත් වෙන්න ඕන.

දුප්පත් පොහොසත්, සුරූපී විරූපී කාට වුනත් ජලයේ සිසිල් ස්වභාවය එක වගෙයි, පිපාසය නිවෙන ගුණය කාටත් එක වගෙයි, බුදු හාමුදුරුවන්ගෙ මහා ☞

කරුණා මෛත්‍රී ගුණයත් හේතු වාසනා තියෙන සියලු ලෝ සතුන්ට එක වගේ සිසිලයි. ඒ ධර්මය හේතු වාසනා තියෙන සියලු ලෝක සත්වයන්ගේ දුක් ගිනි දාහයන් නිවනවා. ඒ නිසා ධර්ම රත්නය ප්‍රණීතයි. (පාණීය හිත =පානයට හිත) ඒ මහා සංඝ රත්නයේ කරුණා මෛත්‍රී ගුණයත් හේතු වාසනා තියෙන සැමටම එක වගේ සිසිලයි. මෙන්න මේ කරුණා මෛත්‍රී සිසිල් ගුණ සිහි කරල, සිසිල් පැන් වර්ග, ප්‍රණීත පාන වර්ග පූජා කරනවා. ආනිසංස හැටියට සියලු දුක් ගිනි, දාහ ගිනි නිවී සුවපත් වෙන්න හේතු ලැබෙනවා.

බුදු දහම අහල ඒ දහම් මග යම් කෙනෙක් පිළිපදිනව නම්, ඔහු හෝ ඇය සතුන් නොමරන නිසා සතුන්ට ආයු දානය ලැබෙනවා. සොරකම් නොකරන නිසා අන් අයගෙ දේපල සැපය රැකෙනවා. කාම මිථ්‍යාචාර නැති නිසා සුචරිතය ආරක්‍ෂා වෙනවා. බොරු, කේලම්, පරුස වචන, හිස් වචන නොකියන නිසා අන් අය අතර සමගිය රැකෙනවා. සමගිය බලයක්. මත් ද්‍රව්‍ය භාවිතා නොකරන නිසා, නිලයෙන්, බලයෙන්, ධනයෙන් මත් නොවන නිසා නුමුලාව (මුලා නොවී) තම කටයුතු කර ගැනීමට ප්‍රඥාව වැඩෙනවා. ඒ උතුම් ශ්‍රී සද්ධර්මය දේශනා කරපු නිසයි ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වැඩෙන්නෙ. ආර්ය මාර්ගය වඩන කෙනෙකුට භෝජනයක් දීමෙන්, ඒ අයගේ ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වඩන උතුම් ධර්ම දාන ගුණයට උපහාර වශයෙන් භෝජන, පළතුරු, කැවිලි ආදිය පූජා කරනවා. ආනිසංස හැටියට ආයු, වර්ණ... ආදිය ලැබෙනවා. ප්‍රඥාව ලැබීමෙන් නිවන් අවබෝධ කර ගන්න හේතු වාසනා ලැබෙනවා.

බොරු කිව්වම කට ගඳ ගහනව කියල අපේ පැරණි මවුවරු දරුවන්ට අවවාද කළා. දුසිරිත් දුගඳ වදන්, බොරු, කේලම්, පරුස වචන, හිස් වචන දුගඳයි. සුචරිතවත් දහම් වදන්, ගුණ වදන් සුවඳයි. සුචරිත වචන අතරින් ශ්‍රේෂ්ඨ වෙන්නෙ ශ්‍රී සද්ධර්මය ප්‍රකාශ කරන වචන. ''සුගන්ධිකාය වදනං...'' ආදී වශයෙන්, සංවර කර ගත් කය, වචනය සුවඳයි කියල මේ දහම් සඟරාවේ 22 කලාපයෙන් පැහැදිලි කළා. එහෙනම් කය, වචනය සංවර කර ගන්න දහම් පද දේශනා කළ මුඛ සුගන්ධ ගුණයට, ඒ වගේම ඒ දහම් පද ලොවට විද්‍යමාන කරන මහා සංඝ රත්නයේ මුඛ සුගන්ධ ගුණයට උපහාර වශයෙන්, මුඛ රෝග දුරු කරන සුගන්ධවත් දැහැත් පූජා කරනවා. ආනිසංස හැටියට සද්ධර්මය අහන්න අවස්ථාව ලැබෙනවා. අදටත් පිරිත් දේශනාවකට, ධර්ම දේශනාවකට භික්ෂූන් වහන්සේලාට ආරාධනා කරන්නෙ දැහැත් වට්ටියක් පිළිගන්වල. නිතර බණ අහන අපිට එහෙම අවස්ථාවක් ලැබිල තියෙන නිසා, මේ සම්පත්තිය සුළුවෙන් හිතන්න හොඳ නෑ. පැය 24 ම ගුවන් විදුලි, රූපවාහිනී මාධ්‍යවලින් ධර්ම දේශනා ප්‍රචාරය වෙනවා. **ඒත් නිවන් දකින බණ අහන්න ලැබෙන පිරිස කොයි තරම් සීමිතද කියල මේ තුන් ලෝකයේම ඉන්න සත්වයින් එක්ක සසඳල බැලුවොත්, නිය පිටට ගත් පස් පිඩක් වගේ පිරිසකටයි** කියල බුදු හාමුදුරුවො පෙන්වා දුන් උපමාවේ සත්‍යය වැටහෙනවා.

අවිද්‍යාවත්, තණ්හාවත් නිසා අනන්ත සසරේ ජාති, ජරා, මරණ... ආදී අනන්ත දුක් විඳවන මේ පංච උපාදානස්කන්ධයට මොන තරම් කැමති කැමති දේ ලැබුණත් ඇතිවීමක්, සෑහීමක් නෑ. නැවත නැවත පතනවා. හරියට නැවත නැවත හැදෙන රෝගයක් වගේ. මේ මහා භව රෝගයෙන් නිදහස් වෙන මහා ඖෂධය තමයි සද්ධර්ම මාර්ගය. මේ ඖෂධ ධර්ම දාන ගුණයට උපහාර පිණිස ඖෂධ පූජා කරනවා. ආනිසංස හැටියට රෝග පීඩාවලට සුදුසු ප්‍රතිකාර ලැබෙනවා. නිවන් දකින්න උපනිශ්‍රය වෙනවා.

දිබ්බ චක්ඛු, දිබ්බ සෝත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුස්සති, චුතූපපාත, ආශ්‍රවක්ෂය කියන ඥාන 6 ක් බුදුන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයන් වහන්සේලාට තියෙනවා. ඒ වගේම ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය, මහා කරුණා සමාපත්ති ඥානය, ආසය අනුසය ඥානය, යමක මහා ප්‍රාතිහාර්ය ඥානය, අනාවරණ ඥානය, සර්වඥතා ඥානය කියන මේ ෂඩ් අසාධාරණ ඥාන බුදුන් වහන්සේට පමණක් පිහිටනවා. තුන් ලෝකයම ජයගත් ජය කණුවක් වගේ උන් වහන්සේගේ ශ්‍රී දේහය වටා සය වර්ණ රශ්මි ධාරාවක් බැබලෙනවා. මේ ජය සංකේත කරන සය මහා ඥානත්වය, සය වර්ණ රශ්මි මාලාව සංකේත කරන්න සය වර්ණ කොඩි පූජා කරනවා. ඒ වගේම කෙලෙසුන් නැසූ බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා සුද්ධයි. අහසක් වගේ ගුණවත් ඒ සුද්ධ පිරිසගේ අනන්ත ගුණ සිහි කරල සුදු කොඩි අහසේ එල්ලල පූජා කරනවා. ඒ සංඝයා වහන්සේලා විවිධ ඥාන, විවිධ ගුණ ඇති පිරිස්. (උදා :- මුගලන් මහ රහතන් වහන්සේ ඍද්ධි බලයෙන් අග්‍රයි. සීවලී මහ රහතන් වහන්සේ වැඩියොත් දානය වරදින්නෙ නෑ.) ඒ විවිධ ගුණ සිහි කරල, විවිධ වර්ණ කොඩි වැල් පූජා කරනවා. සිවුවනක් බුදු සවු පිරිසට බුද්ධ, ධම්ම, සංඝ ත්‍රිවිධ රත්නය වියනක් වගේ සෙවණ සලසනවා. අනන්ත අහස වගේ මේ ලැබෙන රැකවරණය අසීමිතයි. ඒ අනන්ත අහස වැනි සෙවණ සිහි කරල, මහ සෙවණක් වගේ වියන් අහසෙ අතුරල පූජා කරනවා.

මේ විදියට ගුණ සිහි කරල කොඩි, වියන් පූජා කිරීමෙන් ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය, ආරක්ෂාව නිරතුරුව ලැබෙනවා. (**කොඩි විනාශ වුනාම කොඩිවින කියල කියනවා. ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලැබෙන විදිහට කටයුතු නොකිරීමත් කොඩි විනයක්**. ඒ වගේම වින බන්ධන දුරු කර ගන්නත් කොඩි පූජා කරනවා.)

බැලු බැල්මට බෝධිය කියන්නෙ වෘක්ෂයක් තමයි. නමුත් ඈත අතීතයේ බුදු දහම නොතිබුන යුගයක තිබ්බ්ච ගස්, ගල් ඇදහීම වගේ වෘක්ෂ වන්දනාවක් නෙවෙයි මේ බෝධි පූජාව කියන්නෙ. සාරා සංඛ්‍ය, අටා සංඛ්‍ය, සොළොසා සංඛ්‍ය කල්ප ලක්ෂ ගණනින් පාරමිතා පුරපු බෝසතාණන් වහන්සේලාගේ, ඒ මහා පාරමිතා ගුණ බල මහිමයෙන්, සහජාත ප්‍රත්‍යයෙන් පහළ වෙලා, දස මාර සේනා පරදවා පළවා හැර බුදු බව ලබන්න මහා සේවනයක්, පරිසර ශාන්තියක් උදා කර දුන් බෝධි ගුණ පිරි ජය ශ්‍රී මහා බෝධි වෘක්ෂය සිහි කරලයි බෝධීන් වහන්සේලාටත් පුද පූජා පවත්වන්නෙ. බුදු මුවින්ම දේශනා කරල තියෙනව, මා නැති අවස්ථාවල විහාරයට එන උපාසක උපාසිකාවන්ට කියන්න බෝධියට පූජා කරන්න, ඒ පූජාව මට කළ පූජාවක් හා සමාන වෙනව, පිනේ අඩුවකුත් නෑ කියල. ඒ අනුව තමයි ආනන්ද හාමුදුරුවන් බෝධි ශාඛාවක් රෝපණය කළේ.

''සබ්බං රසං ධම්ම රසෝ ජිනාති...'' සියලු රසයන් අතරින් ධර්ම රසය අග්‍රයි. සදාකාලික දුක් ගිනි නිවන අමෘත පානය තමයි ධර්මය. අරි අටඟි මග නමැති දම් පැන් අට සිහි කරල ප්‍රණීත පාන වර්ග අටක් (අෂ්ඨ පාන =අඹ, ජම්බු, ඇට් කෙසෙල්, මස් කෙසෙල්, ඕලු, උගුරැස්ස, මිදි, මී පැණි) පූජා කරනවා. ආනිසංස හැටියට අමෘත පානය හෙවත් නිවන් දකින සිරි සදහම් අහන්න හේතු වාසනා ලැබෙනවා.

''මම'' කියන මෝහාන්ධකාරය දුරු කරන කරුණු හතර තමයි සිවු අරිසස්. සිවු අරිසස් අවබෝධ කරගන්න චතු මධුර (ගිතෙල්, වෙඬරු, මී පැණි, උක් සකුරු) පූජාව හේතු වාසනා වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )**
**කඩවත**

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

**4 වන කොටස**

පදුමුත්තර බුදු පියාණන් වහන්සේ වැඩ හිටපු කාලයක හංසවතී කියන නුවර හිටපු එක්තරා කුල කාන්තාවක් උන්වහන්සේ ගැන පැහැදුනා. ඒ මොහොතෙ උන්වහන්සේ, ඒ කාලෙ මහණ වෙලා හිටපු රූක්ෂ (කර්කෂ) චීවර දරන එක්තරා මෙහෙණින් වහන්සේ නමක් ගැන ගුණ වර්ණනා කරමින් තමයි හිටියෙ. පදුමුත්තර බුදු පියාණන් වහන්සේ ගැන පැහැදිලා හිටපු මේ කුල කාන්තාවට, අර රූක්ෂ චීවර දරන මෙහෙණින් වහන්සේ ගැන උන්වහන්සේ කරපු ගුණ වර්ණනාවටත් හිත ගියා. ඒත් එක්කම, අනේ මටත් මෙහෙම වෙන්න තිබුන නම් කියල ප්‍රාර්ථනාවක් කළා .

දැන් මේ ටික කියවන කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවන්. ''එහෙම ප්‍රාර්ථනාවක් කරපු පමණින් ඉෂ්ඨ වෙනවද? ඒකට මොකුත් කරන්න ඕන නැත්ද? හරි ලේසියිනෙ වැඩේ! සල්ලිකාරයෙක් දැකල අනේ මටත් මෙහෙම වෙන්න තිබුන නම් කියල ප්‍රාර්ථනා කරල මලක් පූජ කරල එන්න විතරයිනෙ තියෙන්නෙ!'' ඇත්තටම එහෙම වෙන්න පුළුවන්ද? එහෙම වෙනව නම් ඒ ක්‍රමය මොකක්ද? ඒක හරියට දැන ගන්න ඕන. ධම්ම පදයේ යමක වර්ගයේ මෙහෙම ගාථාවක් තියෙනවා.

**මනෝ පුබ්බංගමා ධම්මා**
**- මනෝ සෙට්ඨා මනෝමයා**
**මනසා චේ පසන්නේන**
**- භාසතිවා කරෝතිවා**
**තතෝනං සුඛ මන්වේති**
**- ඡායාව අනපායිනී**

ධර්මයෝ සිත පෙරටු කොට ඇතියහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇතියහ. සිතින්ම උපදනාහ. ඉදින් පහන් සිතින් කියන්නේ නම් හෝ කරන්නේ නම් හෝ ඒ හේතුවෙන් සැපය ඔහු කැටුව යෙයි. නොහැර කැටුව යන සෙවණැල්ල මෙනි.

මෙතන බුදුන් වහන්සේ උපමා දෙකක් පෙන්වනවා. එකක් පහන් සිත, අනෙක සෙවණැල්ල. දැන් පහනකින් මොකක්ද වෙන්නෙ? හරි සරල උත්තරයක් තියෙන්නෙ, ආලෝකය ලැබෙනවා. එතකොට පහන් සිත කියන්නෙ මොකක්ද? උපමාව තේරුම් ගන්න ඕන. පහනකින් එලිය දෙනව වගේ, පහන් වූ සිතක් කියන්නෙ ආලෝකමත් වූ සිතක්. ඉතින් අර ඉහත කියපු රූක්ෂ සිවුරු දරන මෙහෙණින් වහන්සේ ගැන කරපු ගුණ වර්ණනාවට මේ කුල කාන්තාවගේ හිත පහන් වුණා, ආලෝකමත් වුණා. හැබැයි ඒ මෙහෙණින් වහන්සේ කවුද කියලවත් දන්නෙ නෑ. නෑදෑයෙක් හෝ ළඟ හිතවත් කෙනෙකුත් නෙවෙයි. ඒත් ඒ උත්තමාවිය කෙරෙහි මේ කාන්තාව පැහැදුනා. පැහැදුනා නම් පැහැදුනේ ඒ මෙහෙණින් වහන්සේගෙ ගුණයට. එතකොට ඒ ගුණය කොහෙන්ද ඒ මෙහෙණින් වහන්සේට පිහිටියෙ? ඒ මෙහෙණින් වහන්සේ සියලු කෙලෙස් නැසූ අරිහත් උත්තමාවියක්. එතකොට පිහිටියේ සාසන ගුණය. සුපටිපන්නාදී වශයෙන් කියන අප්‍රමාණ සඟ ගුණ. ඒ ගුණ කෙරෙහි තමයි පැහැදුනේ. ඉතින් ඒ කුල කාන්තාවගේ සිත



පහන් වෙන එක ගැන අහන්නත් දෙයක්ද?

ඒ වගේම බුදුන් වහන්සේ නමක් උපමාවක් දෙන කොට නිකන් කටට ආව පළියට කියන්නෙ නෑ. ඒ උපමාව සර්ව සම්පූර්ණයි. අඩුත් නෑ, වැඩිත් නෑ. ඒක වැරදියි, මෙහෙම කිව්වොත් තමයි හරි කියල කියන්න පුළුවන් සමතෙක් මේ තුන් ලෝකෙම නෑ. ඉතින් උන්වහන්සේ ඉහත ගාථාවෙන් දුන්න දෙවන උපමාව තමයි සෙවණැල්ල. අන්ධකාරයක් තියෙන තැනක සෙවණැල්ල කොහොමත් පේන්නෙ නෑ. තියෙනවද කියල හොයන්නත් බෑ. එතකොට සෙවණැල්ලක් තියෙන්න නම් එතන අඩු තරමෙ කුඩා හෝ ප්‍රමාණයකින් ආලෝකයක් තියෙන්න ඕන. ආලෝකයේ ප්‍රමාණයට තමයි සෙවණැල්ලෙ තීව්‍රතාවය එන්නෙ. ඉතින් අප්‍රමාණ ගුණ ගැන පැහැදුන සිතක ආලෝකය මෙච්චරයි කියල කියන්න පුළුවන්ද? ලැබෙන විපාකයත් ඒ හා සමානයි. අර සෙවණැල්ලෙ විපාකය වගේ. ඒ විපාකය එන්නෙත් අර ආලෝකය තිබුණම වැටෙන සෙවණැල්ල වගේ සිත පහන් වෙලා තිබුනොත් විතරයි. ඉතින් එහෙම පහන් සිතින් කරපු ප්‍රාර්ථනාවක් ගැන කවර කතාද? මෙහෙම පැහැදුන සිතකින් තමයි, මටත් ඒ වගේ වෙන්න තිබුණ නම් කියල ප්‍රාර්ථනාවක් කළේ. ඉතින් මේ ප්‍රාර්ථනාවෙ මුල, මැද, අග සියල්ලම පදුමුත්තර බුදුන් වහන්සේ සර්වඥතා ඥාණයෙන් දැකල අනුමෝදන් කරල අනුමත කළා. මෙතැන් පටන් එන සිය දහස් වෙනි කල්පයේ ගෞතම නම් බුදුන් වහන්සේ යටතේ මේ කුල කාන්තාව ගෝතමී නමින් අරිහත් වෙන බවට උන්වහන්සේ ප්‍රකාශ කර සිටියා.

එතැන් පටන් ඒ කුල කාන්තාව දිවි හිමියෙන් බුද්ධ සාසනය කෙරෙහි පැහැදිලා කටයුතු කළා. මරණින් මතු තව්තිසා දෙව්ලොව ඉපදුණා. ''ප්‍රාර්ථනා කළා, එතැනින් වැඩේ ඉවරයි'' මෙහෙම දෙයක් බුද්ධ සාසනය තුළ නෑ. ඒ ප්‍රාර්ථනාව මුදුන් පත්වෙන්න කටයුතු කරන්න ඕන. ඒ ශක්තිය ධෛර්යය මුලින්ම ප්‍රාර්ථනා කරපු මොහොතෙ නැගුන ශක්තියෙන් ලැබෙනවා. සසර තුළ අතපසු වීම් වෙන්න පුළුවන්, ඒත් ඒ අතපසු වීම් තුළින් මුලින් ගොඩනගපු ශක්තිය යටපත් වෙන්නෙ නෑ. ඒක තමයි පාරමිතාවක තියෙන බලය. කොහේ ගියත්, කරපු ප්‍රාර්ථනාව පුරුද්ද නැගිල එනවා. මේකට හොඳ උදාහරණයක් තියෙනවා. මේ කුල කාන්තාව නැවත ධම්මා කියන නමින් කාශ්‍යප බුදු පියාණන් වහන්සේ වැඩ හිටපු කාලෙ රජ මාලිගාවක ඉපදුණා. ඇය සමග තවත් සහෝදරියන් හය දෙනෙකුත් හිටියා. සමණී, සමණගුත්තා, භික්ඛුණී, භික්ඛුදාසිකා, සුධම්මා හා සංඝදාසිකා කියන ඒ සහෝදරියන් 6 දෙනා තමයි පිළිවෙලින් ගෞතම බුද්ධ සාසනයේ ඛේමා, උප්පලවණ්ණා, පටාචාරා, කුණ්ඩලා, ධම්මදින්නා කියන තෙරණියන් වහන්සේලා සහ විශාඛා උපාසිකාව කියන්නෙ. ඉතින් කාශ්‍යප බුදුන් වහන්සේගෙන් බණ අහල පැහැදීමෙන් එදා ඒ අය මහණ වෙන්න තීරණය ☞

කළා. ඒත් ඒ කුමාරිකාවන්ගෙ පියා ඒකට අවසර දුන්නෙ නෑ. නමුත් ඒ අය නොපසුබට උත්සාහයෙන් මාලිගාව තුලම අවුරුදු 20,000 ක් කුමරි බඹසර රැක්කා. (අවුරුදු 20,000 ක් කියන්නෙ ඒ කාලෙ තිබිච්ච පරමායුෂ.)

ඊට පස්සෙ මේ කුල කාන්තාව මනුස්ස ලෝකයෙන් චුත වෙලා නැවතත් තව්තිසා දෙව්ලොවම උපදිනවා. ඊට පස්සෙ ගෞතම බුදුන් වහන්සේගෙ කාලයේ දුගී පවුලක ඉපදිලා නැවත මහ සිටුවරයකුගෙ පුතෙක් සමග විවාහ වෙලා, දරුවෙක් ඉන්න මවක් බවට පත්වෙනවා. ඊළඟට ඒ දරුවා සෙල්ලම් කරන, කවටකම් කරන, හිනාවෙන, ඇවිදින වයස එනකොටම මියයනවා. මේ මවට, ඒ කියන්නෙ කිසාගෝතමියට මේක දරාගන්න බැරිව යනවා. තමන්ගෙ දරුව මියගියා කියල කොහෙත්ම විශ්වාස කරන්නෙ නෑ. ඇත්තටම මනස වික්ෂිප්ත වෙච්ච මොහොතක්. මේ හොඳට ඇවිද ඇවිද සෙල්ලම් කර කර හිටිය ළමය නැති වුණයි කියල කොච්චර කිව්වත් විශ්වාස කළේ නෑ. දරුවව සනීප කරගන්න හැම තැනම අරගෙන දිව්වා. ගෙනියන්න පුළුවන් හැම වෙද මහත්තයෙක් ගාවටම ගෙනිච්චා. ඒ හැම තැනකින්ම, දරුව මියගිහින් හොඳ කරන්න බෑ කියල කිව්වට විශ්වාස කළේ නෑ. පෙර පදුමුත්තර බුදුන් වහන්සේ වැඩ හිටපු කාලයේ කරපු ප්‍රාර්ථනාව මුදුන් පත්වෙන්න ඕන සුදුසු කාලය ඇවිත් තිබුණ නිසා තමයි ඇයට එහෙම අවස්ථාවකට මුහුණ පාන්න සිද්ධ වුණේ. දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන් ඇයි දෙයියනේ එහෙමත් වෙන්න පුළුවන්ද, කොච්චර පින් දහම් කරපු කෙනෙක්ද, ඇයි එහෙම දෙයක් වුනේ කියල.

සසර ගමන අපි නිතරම එන්නෙ යමකට ඇලිල, එහෙම නැත්නම් ඒ ඇලුන දේට විරුද්ධව ආපු දේකට ගැටිල. එහෙමත් නැත්නම් ඒ ඇලීම ගැටීම කියන දෙකට නොදැන මුලා වෙලා. දැන් මේ මහ ධනවත් පවුලක සිටු කුමාරයකුගේ බිරිඳ. ඕන තරම් සැප සම්පත් තිබුණා. ලස්සන, ඇවිදින, සින්දු කියන කෙලිලොල් හුරුබුහුටි ළමයෙකුත් හිටියා. ඉතින් එහෙම ඉන්න කෙනෙකුට නිකන්වත් හිතෙයිද මහණ වෙන්න යන්න ඕන කියල? ඉන්න තැන මොකක්ද කියල වැටහෙන්න නම් මේ සසර බය තේරෙන යමක් සිද්ධ වෙන්නම ඕන. හැමෝටම එහෙම වෙනව කියනව නෙවෙයි. ඒත් නිමිති එන විදිහ විවිධාකාරයි. නමුත් මේ කිසාගෝතමියට සිද්ධ වුනේ අම්ම කෙනෙකුට දරාගන්න බැරි දෙයක්. මොන ධනය, බලය තිබුනත් මහා ශෝකයකට, හඬා වැලපීමකට පත් වෙන්න සිද්ධ වුණා. ඒකයි සිහි මුලා වෙලා අර දරුවව ගෙනියන්න පුළුවන් හැම වෙද මහත්තයෙක් ගාවටම ගෙනිච්චෙ. ඔහොම අරගෙන යන කොට තමයි, පෙර ධර්මතාවයෙන් අර කරපු ප්‍රාර්ථනාවේ වාසනාව පැදුනේ. මේ වෙලාවෙ පාරෙ යන මනුස්සයෙක් කිව්වා, නැගණිය ඔය දරුව සනීප කරන්න පුළුවන් මම දන්න එක වෙද මහත්තයෙක් ඉන්නව, අන්න ඔහු ගාවට ගෙනියන්න, ඒ වෙද මහත්තය නම් අනිවාර්යයෙන්ම සනීප කරල දෙයි කියල. දැන් මේක ඇහිච්ච ගමන් ඇය, කොහෙද ඉන්නෙ, කොහොමද යන්නෙ කියල ඇහුවා.

ඉතින් පාර අහගෙන බුදු පියාණන් වහන්සේ වැඩ ඉන්න තැනට ගිහින්, ස්වාමීනී ඔබ වහන්සේට පුළුවන්ද මගේ පුතා සනීප කරල දෙන්න කියල ඇහුවා. එතකොට බුදු පියාණන් වහන්සේ ඔව් මට පුළුවන් කියල කියනවා. ඉතින් සනීප කරන්න මොනවද ඕන කියල අහනවා. අබ ඇට ටිකක් ඕන කියල බුදුන් වහන්සේ උත්තර දෙනවා. දැන් ඉතින් මේක අහපු ගමන් අබ සොයාගෙන දුවන්න පටන් ගත්තා. එතකොට බුදුන් වහන්සේ ඇයට කියනව, පොඩ්ඩක් ඉන්න, එක දෙයක් මතක තියාගන්න, අබ ඇට ගේන කොට මතක ඇතුව ඒ ගෙදර දුවෙක් හෝ පුතෙක් හෝ කවුරු හරි ඥාතියෙක් නොමළ ගෙදරකින් ගේන්න ඕන කියල. ඉතින් ඇය ඒකට එකඟ වුණා. හැම නගරයකම, හැම ගෙදරකටම මේ මැරිච්ච ළමයත් අරගෙන ගියා. ගිහින් අබ ඉල්ලුවා. ඒ මිනිස්සු අබ ගෙනත් දුන්නා. අර ප්‍රශ්නෙ ඇහුවා. මේ ගෙදර කවුරු හරි මියගිහින් තියෙනවද? ඉතින් ඒ මිනිස්සු පුදුම වෙලා වගේ, මොකද නැත්තෙ අපේ ආතා, මුත්තා, තාත්තා සේරම මියගිහින්, මේ ගෙදර ඉන්න අයට වඩා මැරුණ අය වැඩියි කියල උත්තර දුන්නා. අපෝ මට මේ අබ එපා කියල එතනින් වෙනත් ගෙදරකට යනවා. එතනත් අර ප්‍රශ්නෙම අහනවා. එකම උත්තරේ තමයි ලැබෙන්නෙ. දැන් නගරය පුරා අබ හොයාගෙන යනවා. හොඳටම හෙම්බත් වෙලා. දවස් ගාණක් අර දරුවගෙ මළකුණ අරන් ගියපු නිසා ඒකත් කුණු වෙන මට්ටමට ඇවිල්ල. මෙහෙම යන කොට ටික ටික හිතන්න පුළුවන් තත්වෙට ඇගේ මානසිකත්වය පත්වුණා. මේ හැම ගෙදරකම එක් කෙනෙක් හෝ මැරිල තියෙනවා. මරණය කියන එක පොදු දෙයක්. මේ නගරයේ ජීවත් වෙලා ඉන්න අයට වඩා මැරිච්ච අය වැඩියි. මටත් ඒක පොදුයි, මගේ පුතාටත් පොදුයි. දැන් මෙහෙම හිතෙන කොට නැවතත් ගෙවල් ගානෙ යන්න හිත දුන්නෙ නෑ. අර මළකුණ කැළෑවට විසිකරල නැවතත් බුදුන් වහන්සේ හමුවෙන්න ගියා.

ඉතින් බුදුන් වහන්සේ දන්නවා මේ තැනැත්තියට ධර්ම දේශනා කරන්න මේක තමයි සුදුසුම මොහොත කියල. උන් වහන්සේගේ අනාවරණ ඥාණයට කිසි දෙයක් වහන්න බෑ. කිසාගෝතමියගෙන් අහනව, ඉතින් අබ ලැබුනද කියල. ඇය දුන්න පිළිතුර තමයි, අබ නම් හැම ගෙදරකින්ම ලැබුනා ඒත් කෙනෙක් මරණයට පත්නොවෙච්ච ගෙයක් හොයා ගන්න බැරි වුණා කියන එක. මේ නගරයේ ජීවත් වෙලා ඉන්න අයට වඩා මැරිච්ච අය වැඩියි. බුදුන් වහන්සේ ඇයට මනා උපමාවකින් ධර්ම දේශනාවක් කරනවා. මේ මරණය කියන එක ලෝක සත්වයාට පොදු දෙයක්. අනේ මගෙ පුතා, දුව, අම්ම, තාත්ත කියල ඇලිල වෙලිල ඉන්නවා. ඊට පස්සෙ දන්නෙම නැතුව මැරිල අපාගත වෙනවා. ඒක හරියට නිදාගත්ත ගමකට එකපාරටම ආපු මහ ගංවතුරකින්, ඒ මුළු ගමම හේදිලා මුහුදට ගියා වගේ. ඉතින් ඇයට තිබිච්ච අත්දැකීමත් එක්ක පෙර පාරමිතා ශක්තියත් නැගිල ආවා. ඒ දේශනාව අවසානයේ ඇය සෝවාන් වුනා. ඊට පස්සෙ කිසාගෝතමී තෙරණින් වහන්සේ නමින් මහණ වුනා.

මේ විදියට මහණ වුනාට පස්සෙ එක්තරා මොහොතක, පහන් දැල්ලක් දැකල විදර්ශනා කරන්න පටන් ගත්තා. මේ තෙල් බින්දු බින්දු ඇවිත් පත්තු වෙවී පහන් දැල්ලක් ඇති වෙනවා. ඒ දැල්ල ටික ටික උඩට ගිහින් නැති වෙලා යනවා. මෙහෙම එක තැනකින් උපදිනවා. ඒක ටික වෙලාවක් පැවතිලා උඩින් විනාස වෙලා යනවා. තෙරණින් වහන්සේට මරණය පිළිබඳ හොඳ අත්දැකීම් තිබුණා. ඒ අනුව විදර්ශනා කළා. මේ ලෝක සත්වයොත් මෙහෙම උපදිනවා. යම් කාලයක් ජීවත් වෙනවා. ඊට පස්සෙ මිය පරලොව යනවා. බොහෝ අය අපාගත වෙනවා. නොවිඳනා දුක් විඳිනවා. මෙහෙම ගමනක හරයක් තියෙනවද? දැන් තෙරණින් වහන්සේගෙ මනස ඉතාම හොඳ සමාධියකට ආවා. මේ විදියට තමන් වහන්සේගෙ ශ්‍රාවකයෙක් හෝ ශ්‍රාවිකාවක් මාර්ගඵල අවබෝධයකට මනස සැකසෙන මොහොත බුදුපියාණන් වහන්සේ නමකගේ මහා කරුණාවට, සර්වඥතා ඥාණයට අහුවෙනවා. ඉතින් උන් වහන්සේ ඒ වගේ මොහොතක මහා ආලෝකයක් විහිදුවමින් එතනට සෘද්ධියෙන් වැඩල ධර්ම දේශනාවක් කරනවා. ඒ දේශනාවට කියන්නෙ සාමුක්කංසික දේශනාව කියල. ඒ විදියට වැඩිච්ච මනසට ගැලපෙන දහම් කරුණු තමයි ඒ දේශනාවෙන් පහදල දෙන්නෙ. කිසාගෝතමී තෙරණියත් ඒ දහම අහල සියලු කෙලෙසුන් නසා අරිහත්වයට පත් වුණා.

*අපදාන පාලිය 2-2 කිසාගෝතමී ථේරාපදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# අණවින කොඩිවින, සාප කිරීම් ආදිය හැමෝටම නොවදින්න හේතුව සහ කර්ම විපාකයන්ගේ වෙනස්කම් නිසා ඇතිවන ලෙඩ රෝග කරදර

*(පසුගිය කලාපයෙන් - හෝවහ අඬෝවැඩියාවලින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි.....)*

මේ දහම් සඟරාවේ මේ දක්වා පල වූ ලිපි පෙළකින් මනුස්සයින්ට විවිධ ලෙඩ රෝග කරදර ඇතිවෙන ගුප්ත පැතිකඩවල් කීපයක්ම විග්‍රහ කළා. මිනී අළුවලින් කරන අණවින කොඩිවින, නොයෙක් යන්ත්‍ර මන්ත්‍ර ආදියෙන් කරන හදි හූනියම්, නූල් පැන්නුම්, වැල් පැන්නුම්, රූපයට කරන කටු ගැසීම්, කටහඬ අල්ලා කරන ඇණ ගැසීම්, පිල්ලි යැවීම්, වස්කවි කීම්, සාප කිරීම්, ඇස්වහ, කටවහ, හෝවහ, අඬෝවැඩියා ආදී වශයෙන් දීර්ඝ විස්තරයකින් ඒ බව හෙලි දරව් කළා.

දැන් කෙනෙකුට මෙහෙම ප්‍රශ්නයක් එන්න පුළුවන්. ''ඔය කියන ක්‍රමවලින් ඔච්චර ලොකු දෙයක් කරන්න පුළුවන් නම්, එහෙම ලෙඩ රෝග කරදර ඇති කරන්න පුළුවන් නම්, මේ රටේ දූෂණ වංචා, හොර මැරකම්, අසාධාරණකම් ආදිය කරන සමහර නායකයො, මැති ඇමතිවරු, මන්ත්‍රීවරු ඕවායින් මෙල්ල කරන්න බැරි ඇයි? ඒ වගේ වැඩ කරන අය ඇයි ඔය වගේ දේවල්වලින් දඬුවම් දීල පලවා හරින්න බැරි?'' දැන් මේ විදියට නොයෙක් තර්කවාද එන්න පුළුවන්. මොකද අද වෙනකොට රටේ ලෝකෙ මිනිස්සු විවිධ පිල්වලට බෙදිල, නොයෙක් විදියට එකිනෙකාට අවලාද නගාගන්න පිරිස්, ගහ මරාගන්න පිරිස් වැඩිවෙලා, ඒවායින් පරාජයට පත්වෙන පිරිස් විරුද්ධ පාර්ශවයන්ට විවිධාකාරයෙන් සාප කරනවා, යක්ෂ අමනුස්ස කොට්ඨාශවලින් වැඩගන්න විවිධ ගුබ්බෑයම්වලට ගිහින් පොල් ගහනවා, පලිගන්න බලනවා. ඒ වගේම කිසිම පැත්තක් නොගෙන මධ්‍යස්ථ වශයෙන් කෙනෙක් හිතල බැලුවත්, ඇත්ත වශයෙන්ම මේ වෙන කොට ඇතිවෙලා තියෙන විපරීත දූෂිත සමාජ පරිසරය නිසා සිද්ධ වෙන විවිධ අයුතු අසාධාරණකම් දැකල අර වගේ අදහස් එන්නත් පුළුවන්. දැන් මේ ඒ ගැන තමයි විග්‍රහ කරන්නෙ.

යම් කිසි තැනක තත්ත්ව තානාන්තර දරන, ලෝක සම්මතයේ උසස් තැනක ඉන්න කෙනෙකුට ඒ අවස්ථාව ලැබෙන දහම් න්‍යාය මොකක්ද කියල බොහෝ උදවිය දන්නෙ නෑ. නමුත් ඒ පිළිබඳව බුදුන් වහන්සේ නොයෙක් අවස්ථාවල දේශනා කරල තියෙනවා. අපදාන පාළියේ ඒ වගේ අවස්ථා බොහෝකොටම සඳහන් වෙනවා. ඒ අනුව **බුදු, පසේ බුදු, මහ රහත්, මහ සෘෂිවරු... ආදී උත්තමයන්ට දන් දීපු අය මහ කෝටිපතියො වෙලා උපදිනවා. ඒ වගේම රටක නායකයො, රජ්ජුරුවො, ජනපති, අගමැති, මැති ඇමති... ආදී වශයෙන් තනතුරු ලබන්න හිමිකම් ලැබෙන්නෙත් පෙර අත්බැව්වලදී බුදු, පසේ බුදු, මහ රහත් ආදී උතුමන්ට දන් දීම්, ආරාම පූජා කිරීම්, ඇප උපස්ථාන කිරීම් ආදී විශේෂ පූජාවන් කරල ඒවායින් නැගිච්ච පිනක විපාකයක් විදියට.** ඒ පිනේ විපාකයට ලැබෙන ප්‍රතිඵලය තමයි ඒ. මේ නිසා බුදු, පසේ බුදු, මහ රහත් වගේ බලවත් උතුමන්ට, එහෙම නැත්නම් මහ සෘෂිවරුන්ට කවද හරි ඇප උපස්ථාන කරපු ශක්තියක් නැත්නම් කර්ම විපාක වශයෙන් රජ, මැති ඇමති, මන්ත්‍රීවරු වෙන්න බෑ. එහෙම විපාකයක් ඇදිල ආවොත් තමයි කවදහරි රටක ඒ වගේ තත්ව තානාන්තර දරන්න පුළුවන් වෙන්නෙ. ඒකට සාමාන්‍ය පිනක් ප්‍රමාණවත් වෙන්නෙ නෑ. අර වගේ මහ බලවත් පිනක් කරල තියෙන්න ඕන. එතකොට කෝටි ගාණක් වටිනා ඒ ජාතියේ පිනක් කරපු, ඒ වගේ කෝටි ගණනකට හම්බවෙන්නෙ නැති අවස්ථාවකින් පිනක් කරල, සාමාන්‍ය පින් දහම් අභිබවා ගිය පුණ්‍ය විපාකයක් එල දෙන්න ඕන. උදාහරණ විදියට නිවන් දකින දහම දුර්ලභ කාලයක පහළ වෙච්ච රහතන් වහන්සේ නමකට දානයක් දෙන්න ලැබෙනව කියන්නෙ ඒ වගේ අති දුර්ලභව ලැබෙන අවස්ථාවක්. ඒ වගේම බුදුවරයන් වහන්සේ නමකට දානයක් දෙන්න ලැබෙනව කියන්නෙ කෝටි ගණනකින් නෙවෙයි, අනන්ත කාලයකට-වත් ලබන්න බැරි වාසනාවක්. ඒක අප්‍රමාණ පිනක්.



දැන් මේ කියන විදියේ පෙර කරපු පින් තියෙන අය තමයි අද වුනත් ඒ ඒ තනතුරු දරන්නෙ. එහෙම නැතිව නිකන්ම ලැබෙනව නෙවෙයි. එතකොට ඒ පින එල දෙන කොට, විපාකය ක්‍රියාත්මක වෙනකොට, ඒක නැති කරන්න අර වගේ යන්ත්‍ර මන්ත්‍ර, අණවින කොඩිවින, හදි හූනියම් ආදී උපක්‍රමවලින් බෑ. ලෞකික වුනත් ඒ විපාකය හරි බලවත්. වෙලාව ආවට පස්සෙ බඹර වැල්ලෙ ගැහුවත් කැරකෙනව කියන්නෙ මේ වගේ අවස්ථාවලට තමයි. ඒ විපාකය බලවත් වෙලා ආවම, ඒ පුද්ගලයගෙ ශරීරය වටේ තියෙන කිරණ ශක්තියත් හරි බලවත් වෙනවා. ඒ වගේ වෙලාවට මොනව ☞

කළත් ඒ පුද්ගලයව මෙල්ල කරන්න බැරිව යනවා. ඒක මහ බලවත් පුණ්‍ය විපාකයක්. ඒ වෙලාවෙදි කොඩිවින කරල, සාප කරල මෙල්ල කරන්න හැදුවට ඒව වදින්නෙ නෑ. නැත්නම් දවසකට කොච්චර නම් රටේ නායකයන්ට, මැති ඇමතිවරුන්ට සාප කිරීම්, දෙස් දෙවොල් තැබීම් කරනවද? නමුත් එහෙම කරපු පළියට වදින්නෙ නෑ.

නමුත් මේ කාරණය දන්නෙ නැති විවිධ භෞතිකවාදී පිරිස් තර්ක කරනවා, එහෙනම් ඔච්චර බලයක්, ක්‍රමයක් තියෙනව නම්, මිනිස්සු පන්නන්නත් පුළුවන්නම්, අද මේ හොරකම් කරන විවිධ දූෂණ වැඩ කරන සමහර මැති ඇමතිවරු, මන්ත්‍රීවරු පන්නන්න බැරිද, මෙච්චර අසාධාරණ කම් කරන අයට තියෙන බලය මොකක්ද කියල. මෙතනදි දැනගන්න ඕන අනෙක් කාරණය තමයි, හොර මැරකම් දූෂණ ආදී ක්‍රියාකාරකම් කියන්නෙ වර්තමානයේ ඒ අය විසින් ගොඩ නගන හේතුව. ඒකෙ විපාක එන්නෙ දැන් නෙවෙයි මතුවට. එතකොට දැන් විඳින පුණ්‍ය විපාකය කියන්නෙ පෙර කරපු අර ජාතියේ යහපත් කටයුතුවල පුණ්‍ය ඵලය. ඒ නිසා දැන් හොරකම් කළත්, මොන විදියෙ අකටයුතුකම් කළත් ඒව දැන් ඵල දෙන්නෙ නෑ. දැන් ඵල දෙන්නෙ පෙර කරපු හොඳ විපාක. පෙර කරපු ඒ යහපත් කටයුතුවලට ලැබිච්ච පුණ්‍ය ඵලයෙන් තමයි අද විවිධ ලෞකික සැප සම්පත්, බලය ආදිය පාවිච්චි කරන්න හිමිකම ලැබිල තියෙන්නෙ. නමුත් කවදහරි ඒ ඵලය ගෙවිල ඉවර වෙච්ච දවසට දැන් කරන පාපකර්මවලින් අපාගත වෙන්නත් ඉඩ තියෙනවා. එදාට මේ දැන් කරන අයුතු අසාධාරණකම්වල විපාකය ක්‍රියාත්මක වෙලා මහා අන්ත තත්වයකට පත්වෙනවා. සමහර විට තිරිසන් වෙලා අනාගතයේදී දහ දුක් විඳින්නත් පුළුවන්. එහෙම වෙච්ච අවස්ථාත් ඉතිහාසයෙ ඕන තරම් තියෙනවා. හැබැයි ඒ පෙර කරපු පිනෙන් නෙවෙයි, දැන් කරගන්න පාපයෙන්. ඒක වෙනම අංශයක් (මේ පිළිබඳ විශේෂ විග්‍රහයක් ඉදිරියේදී බලාපොරොත්තු වන්න)

ඉතින් මෙහෙම අය රටේ ලෝකෙ ඉහල තැන්වල ඉන්නවා. නමුත් ඒ කාරණය මිනිස්සු දන්නෙ නෑ. මොන අසාධාරණකම් කළත් ඒ වගේ අය අණවින කොඩිවින කරල, සාප කරල පන්නන්න බෑ. හැබැයි සාමාන්‍ය මට්ටමේ උදවියට ඒ වගේ අණවින කොඩිවින ආදිය බොහෝකොටම වදිනවා. මොකද ඒ අයට අර වගේ බලවත් පුණ්‍ය විපාකයක් ක්‍රියාත්මක නොවන නිසා. ඉහළ තානාන්තර දරන ප්‍රබල අයට ඒ වගේ දේවල් නොවදින්නත්, සාමාන්‍ය අයට වදින්නත් හේතුව ඕකයි. නමුත් ක්‍රමය දන්නෙ නැති නිසා මේ වගෙ තර්කවලින් භෞතිකවාදීන් ජයග්‍රහණය කරනවා.

ඒ වගේම මෙතනදි තවත් නොපෙනෙන පැත්තක් ක්‍රියාත්මක වෙනවා. මේ වගේ අණවින කොඩිවින ආදී ක්‍රමවලදී, ගුප්ත ලෝකයෙන් ඒවාට සම්බන්ධ විවිධ අමනුස්ස පිරිස් ක්‍රියාත්මක වෙන බවත් පසුගිය කලාපවලින් විස්තර කළා. මනුස්ස ලෝකෙන් දෙන යම් යම් දොල පිදේනි අරගෙන ඒවට කැමති අමනුස්ස කොටස් ඒ වගේ ක්‍රියාකාරකම්වලට අනුබල දෙනවා. නමුත් අපේ රටේ සමහර ප්‍රභූ පිරිස් ගත්තමත්, විශේෂයෙන් බොහෝ බටහිර රටවල නායකයින් ගත්තමත් මේ වගේ ගුප්ත පැති විශ්වාස කරන්නෙ නෑ. ඒවට සම්බන්ධ වෙන්නෙත් නෑ. එතකොටත් අර ගුප්ත ලෝකයේ ඒ වගේ වැඩවලට සම්බන්ධ අමනුස්ස පිරිස් ඒවට සම්බන්ධ වෙන්නෙ



නැතිව ඒ මිනිස් ඇසුරෙන් ඉවත් වෙලා ඉන්නවා. මොකද ඒ අයට මොකවත් ලැබෙන්නෙ නැති නිසා. මේ විදියට සමනන්තර අනන්තර ප්‍රත්‍යයෙන් සමනන්තරය පූර්ණ නොවීම නිසත් ඒ වගේ අයට අණවින කොඩිවින නොවදින්න මේ කාරණයත් එක හේතුවක් විදිහට බලපානවා.

ඒ වගේම සමහර රටවල, සර්ව බලධාරී හැටියට සළකල පුද්ගලත්වයෙන් අරගෙන ඒ අයට සම්බන්ධ යම් ප්‍රධාන දෙවි කෙනෙක් අදහනවා. එතකොට ඒ දෙවියන් ප්‍රධාන බලවේගයක් බවට පත් වෙලා තමන් අදහන තමන්ගෙ පිරිසට රැකවරණය දීල අර අමනුස්ස කොටස් පලවා හරිනවා. මේ කාරණයත් සමහර රටවල නායකයන්ට බලපානවා. හැබැයි මේ එක පැත්තකින් විතරයි. නමුත් අනෙක් ක්‍රමවලින් කරන සාප කිරීම් ආදිය බලපානවා. ඒවා වදින්නෙ නැත්තෙ අර කියපු පුණ්‍ය ශක්තියේ බලවත්කම නිසා. වැදුනොත් වදින්නෙ ඒ පුණ්‍ය විපාකය ගෙවිල ඉවර වෙච්ච වෙලාවක තමයි. නමුත් එහෙම විපාකයක් ආවත්, ඒ නිසා ඒක සිද්ධ වුනයි කියන එක පිලිනොගැනීම වෙනම කාරණයක්. මොකද ඒක නොපෙනෙන පැත්තක් නිසා. මේ කාරණය අද වෙනකොට සැඟවිලා තියෙන නිසයි මේ විදියට විග්‍රහ කළේ.

ඒ වගේම මනුස්සයින්ට කායික වශයෙන් හැදෙන රෝගාබාධවලට විවිධාකාරයෙන් කර්ම විපාක කියන ඒවත් සම්බන්ධ වෙනවා. කර්මය මුල් කොට ගෙන, දායාද කොට ගෙන, උපත කොට ගෙන, නෑයා කොට ගෙන, පිළිසරණ කොට ගෙන මේ ආදී විවිධාකාරයෙන් අනන්ත කාලයක පටන් ලෝක සත්වයා සැරිසරන සසර ගමනෙදි, මේ කර්මය සත්වයා පස්සෙන් එන හැටි බුදුන් වහන්සේ විවිධ අවස්ථාවන්වලදී මනාව පෙන්වා දීල තියෙනවා. ඒ වගේ කර්මයක් එක්ක සම්බන්ධයක් තියෙන නිසාම තමයි, ඒකට බාහිර පරිසරයත් සකස් වුනාම කර්මය සම්බන්ධ වෙලා ඒ ඒ රෝග වර්ධනය වෙන්නෙ. හැබැයි පරිසරය සකස් වෙච්ච පලියට එකම පරිසරයක ඉන්න හැමෝටමත් එකම අවස්ථාවෙදි රෝගාබාධ හැදෙන්නෙ නැත්තෙ, මේ අචින්ත්‍ය වූ කර්ම විෂයේ තියෙන විවිධත්වය නිසා. ඒ වගේම බාහිර පරිසර වෙනස් වීම්වලදී කර්ම විපාකය වුනත් එල්ල කරල කෙලින්ම එන්නෙ නෑ. වක්‍ර විදියට තමයි බොහෝකොටම සම්බන්ධ වෙන්නෙ. හැබැයි එහෙම එල්ල කරල එන ඒවත් තියෙනවා. ඒවට තමයි කර්ම විපාකජ ආබාධ කියල කියන්නෙ. එහෙම නැති ඒව තමයි උපක්‍රමික ආබාධ කියල කියන්නෙ.

කොහොම හරි මේ **කර්ම විපාකජ ආබාධයකින් ඇතිවෙන වෙනස තමයි ඒ රෝගාබාධය ඉස්සෙල්ලම හැදෙන්නෙ මනුස්සයගෙ ඇස්ට්‍රල් බොඩි හෙවත් මනෝමය කාය කියල හඳුන්වන අභ්‍යන්තර කයට.** ඊට පස්සෙ තමයි ඒක මේ සනීහවන වෙච්ච මස්ලේ කයට පරිවර්තනය වෙන්නෙ. කර්ම විපාකයම මුල්කරගෙන එන ඒ වගේ සමහර කර්ම විපාකජ ආබාධවලට (ආනන්තරීය පාපයන්ගේ ශේෂ වශයෙන් සහ වෙනත් බලවත් කර්ම විපාකයන්ගෙන් එන) තමයි බාහිර ලෝකෙ බෙහෙත් නැත්තෙ. මේ නිසා හොඳ කරන්න පුළුවන් කර්ම රෝග කියල හඳුන්වන ඒවට තමයි ඔය කිරණ ප්‍රතිකර්ම ආදී වශයෙන් බෙහෙත්

හේත් තියෙන්නෙ. එතනදි සනීප කරන්න පුළුවන් කර්ම විපාකජ රෝගවලදී මනෝමය කයට ශක්තිය දීල ඒක සුද්ද කරනවා. ඒ අනුසාරයෙන් කායික රෝගය සනීප වෙනවා. මේ එක ක්‍රමයක්.

හැබැයි මහ බලවත් කර්ම ශක්තියකින් හටගත් රෝගාබාධයක් නම් ඒක අපට සුද්ද කරගන්න බෑ. මොකද ඒක මනෝමය කයටම කාවැදිච්ච එකක්. සාමාන්‍ය රෝගාබාධයක් කියන්නෙ මනෝමය කයට නැතිව මස්ලේ කරජ කයට හැදෙන රෝගයක්. ඒක මනෝමය කයට යන්නෙ නෑ. ඒකට බෙහෙත් ප්‍රත්‍ය වෙනවා. බෙහෙත්වලින් සනීප කරන්න පුළුවන්. හැබැයි ඒකත් නිකන් හැදෙනව නෙවෙයි. කර්මය මුල් කරගෙනම තමයි බාහිරින් වුනත් එන්නෙ. නමුත් නියම කර්ම විපාකජ රෝග කියල කියන්නෙ මනෝමය කය මුල් කරගෙන එන රෝගවලට. අනෙක් ඒවත් කර්මය මුල් කරගෙන බාහිරින් එන රෝග.

ඒ නිසා තමයි බුදුන් වහන්සේට දෙව්දත් තෙර ගල් පෙරලුවම කර්මය හේතු වුනයි කියල කියන්නෙ. ඒ කියන්නෙ උන්වහන්සේ පෙරුම් පුරණ කාලයේ පෙර අත්බැවක ළමයෙක් වෙලා හිටපු අවස්ථාවක, පසේ බුදුවරයන් වහන්සේ නමකට කැටපෝලයකින් විදපු ගලක් නිසා ආපු කර්ම වේගයක් ඇදිල ඇවිත්, දෙව්දත් පෙරලපු ගලකින් පතුරක් ශ්‍රී පාදයේ වදින්න හේතු වුනා කියල. ත්‍රිපිටකයේ එන පුබ්බකම්මපිලෝතිකාවදානයේ මේ විදියට උන් වහන්සේට කර්ම විපාක 12 ක් එල දීපු හැටි විස්තර කරල තියෙනවා. බුදුන් වහන්සේට කර්ම විපාකජ රෝග ආපු හැටිත් ඒකෙ විග්‍රහ වෙනවා. මේ කාරණය මිලින්ද ප්‍රශ්නෙදි නාගසේන හිමියන් මිලිඳු රජ්ජුරුවන්ට විග්‍රහ කරන කොට, කර්ම විපාකජ ආබාධයක් කියල නොපෙන්වා උපක්‍රමික ආබාධයක් විදියට තමයි විග්‍රහ කරල තියෙන්නෙ. ඒකට හේතුව තමයි මේ කර්ම විපාකජ ආබාධ කියල හටගන්න රෝග, අභ්‍යන්තරයෙන් එන මහ බලවත් දෙයක්. නමුත් කර්ම විපාකය සෘජුවම සම්බන්ධ වෙන්නෙ නැතිව ඒක මුල් වෙලා උපක්‍රමයක් වශයෙන් එන ආබාධයක් නිසා තමයි උපක්‍රමික ආබාධ කියල කිව්වෙ. නමුත් කවුරු උපක්‍රම යෙදුවත් කර්ම විපාකයකුත් ඒකට ඇදිලා එනවා. හැබැයි පූර්ණ කර්ම විපාකය එතනදි පළවෙනි වෙන්නෙ නෑ. පළවෙනි එක තමයි මනෝමය කය ඇතුලින් එන කර්ම විපාකජ ආබාධ කියල කියන්නෙ.

**බුදුන් වහන්සේට ලෝහිත-පොක්ඛලං (ලේ පොකුරු ගැසීම) රෝගය හැදුනෙ කවුරුවත් කරපු දේකින්වත්, දීපු දේකින්වත් නෙවෙයි. ඒක පූර්ණ කර්ම විපාකයකින් ආපු කර්ම විපාකජ රෝගයක්. ඒ වගේම උන් වහන්සේට නිතර හැදෙන හිසේ කැක්කුමක්, කොන්දෙ කැක්කුමක් තිබුනා. ඒකටත් බාහිර සම්බන්ධයක් තිබුනෙ නෑ. ඒවත් කර්ම විපාකජ ආබාධ.** ඒ නිසා තමයි ඒවායෙ කර්ම ශක්තිය තියෙන කල් ඒවා හොඳ කරගන්න බැරි වුනේ. ඉතින් ඒවට බෙහෙත් කළත් ඒ කර්ම ශක්තිය තියෙන කල් ඒ රෝගාබාධ පවතිනවා. කර්ම විපාකය ගෙවෙන කල්ම ඒ ඒ කාලවල ඒවා තිබුනා. නමුත් ගල් පෙරලීම එහෙම එකක් නෙවෙයි. ඒක අර උපක්‍රමික ආබාධවලට වැටෙන්නෙ.

ඒ වගේම සුන්දරී පරිබ්‍රාජිකාව මරල හංගල කරපු අභූත චෝදනා, චිංචි මානවිකාව දර මිටියක් බැඳගෙන ඇවිත් කරපු අභූත චෝදනා ආදියත් කර්ම විපාක එක්ක සම්බන්ධයි. නමුත් ඒවා දෙවනි වෙනව මිසක් මූලික නෙවෙයි. ඒව තමයි උපක්‍රමික කරදර හෝ ආබාධ විදියට ගැනෙන්නෙ. ඒ කියන්නෙ බාහිර පුද්ගලයන් සම්බන්ධ වෙලා උපක්‍රමවලින් කරන්නා වූ දේවල්.

ඊළඟට වා, පිත්, සෙම් ආදිය මුල් කර ගෙන රෝග හට ගන්නා තවත් ක්‍රමයක් තියෙනවා. ඒවත් සනීප කරගන්න පුළුවන් රෝග. උදාහරණ විදියට යමෙකුට වාත විපරීතයක් එනව නම් ඒවට වාත සමුට්ඨාන කියල කියනවා. (සම + උට්ඨාන = සමග නැගී සිටිනවා. උදාහරණ : වාතය සමග නැගී සිටින්නේ වාත සමුට්ඨාන, කර්මය සමග නැගී සිටින්නේ කම්ම සමුට්ඨාන) සමහර අයට කොස් වගේ ආහාර ජාති කෑවම වාතය ඇවිස්සෙනවා, වාතයට අගුණ දේවල් කෑවම වාතය කුපිත වෙනවා. ඒ වගේම මීට පෙර මේ දහම් සඟරාවෙන් විග්‍රහ කරපු රක්ත උෂ්ණ රෝගය පිත කුපිත වීමෙන් එන පිත්ත සමුට්ඨාන රෝගයක් ලෙස තමයි ගැනෙන්නෙ. ඒ නිසා තමයි ඒව බෙහෙත්වලින් හොඳ කරගන්න පුළුවන් වෙන්නෙ. ඒ වගේම සෙම කුපිත වීමෙන් එන සෙම්ම සමුට්ඨානා තමයි සෙම් ගෙඩි, පපුවේ සෙම, පීනස ආදී වශයෙන් එන්නෙ. ඊළඟට විවිධ ප්‍රදේශවලට ගියාම තියෙන විවිධ සීත උෂ්ණ, කාලගුණික දේශගුණික වෙනස්කම් නිසා ඇතිවෙන රෝගාබාධ තමයි ඍතුපරිණාමජ ආබාධ (ඍතු වෙනස්කම් නිසා ඇතිවෙන) වශයෙන් ගැනෙන්නෙ.

දැන් ඉතින් මෙච්චර කලක් මේ දහම් සඟරාවෙ ලිපි මාලාවකින් විග්‍රහ කරපු මේ වගේ විවිධ රෝගාබාධ කරදර ආදිය එන හැටි දහමට අනුව තේරුම් අරගෙන, ඒ වගේ කර්ම විපාකයන්ට ගොදුරු නොවී ඉන්න, ඒ ලිපිවලින් ඉදිරිපත් කරපු ධර්මානුකූල විසඳුම් අනුගමනය කරල, මෙලොව පරලොව අභිවෘද්ධිය සලසගෙන, අවසානයේ කිසිම රෝගාබාධයකට ලක්නොවෙන අමා මහ නිවන් සුවය ලබාගන්න අදිටන් කරගන්න.

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වවුල් සංබාරයේ හැටි ....



වහගෙන අවුල් කළ පාපෙට පෙර කාලේ
ගැලපෙන ගති රුවක් ලැබුණා මේ තාලේ
වැනසෙන විලස කිච් බොරු කේලම් රාලේ
සිහි වෙනවාද කළ පව් එල දුන් කාලේ

කන බොන කටින් මළපහ කෙරුමටද වුණා
උඩ යට මාරු වී එල්ලී ඉන්ට වුණා
ඇස් ගෙඩි මොටද මේ ලෝකෙම අඳුරු වුණා
අවුලෙන් අවුල අද වවුලෙක් වෙන්ට වුණා

පබැඳුම: **මුරුතමුරේ ධම්මින්ද හිමි**

# ලෞකික අභිවෘද්ධිය සලසන වටිනා දහම් කොටස් ත්‍රිපිටකයෙන් ගිලිහී ගිය හැටි....

*(පසුගිය කලාපයෙන් - පස් පොළක් නීච කළ හෙළයේ මහා වංශ කතාව....)*

පසුගිය කලාපයෙන් ඉදිරිපත් කරපු විග්‍රහයේදී ත්‍රිපිටකයේ යම් යම් සූත්‍ර කොටස් හැලී ගොස් ඇති බවත්, පාලි අර්ථයන් හොඳින් ගැලපුනත් සිංහල පරිවර්තනයේ දෝෂ තියෙන බවත් එක්තරා තැනක සඳහන් කළා. දැන් එතකොට ඇයි මේ සමහර සූත්‍ර කොටස් හැලුවෙ? මොන වගේ ඒවද ඒ විදියට හැලුවෙ? ඇයි සමහර කොටස් ඉතිරි කළේ? පරිවර්තන දෝෂ ආවෙ කොහෙන්ද?... මේ ආදී ලෙසින් කෙනෙකුට විවිධ ගැටලු එන්න පුළුවන්. ඒ පිළිබඳව කරන විස්තර ඉදිරිපත් කිරීමක් තමයි මේ.

මේ ත්‍රිපිටකය හොඳින් විමර්ශනය කරල බලන කොට පෙනී යන කරුණක් තමයි, නිවන් දකින ධර්මය සඳහන් වෙන පාලි සූත්‍ර කොටස් කිසිදු විකෘති කිරීමකින්, ඉවත් කිරීමකින් තොරව නිරුපද්‍රිතව තියෙන බවත්, ඒ වගේම ලෞකික වශයෙන් මනුස්සයින්ට එදිනෙදා වැදගත් වන්නා වූ සූත්‍ර කොටස් යම් ප්‍රමාණයක් ඉවත් කරල තියෙන බවත්. මේකට හේතුවක් තියෙනවා. **ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වෙච්ච භික්ෂූන් වහන්සේලා ලෝකයේ කලින් කල පහල වෙනවා. එහෙම පහළ වෙන අයට නිවන ගැන ප්‍රශ්නයක් නෑ. ඒකෙ වටිනාකමක් නෑ. එතකොට ඒ අයට වටිනාකමක් තියෙන හැටියට පේන්නෙ ලාභ, කීර්ති, ප්‍රශංසා ලබා ගන්න පුළුවන් යම් කිසි ලෞකික සාරත්වයක් පෙන්වල තියෙන සූත්‍ර කොටස් තමයි.** එදත් ඒ වගේ පහළ වෙච්ච අයට ඒව වටින බව පෙනිච්ච නිසා තමන්ගෙ වාසියට හරවගත්තා. ඒ කියන්නෙ තමන්ගෙ තත්ත්වය රැකගන්න ඒ කොටස් හැංගුවා. එහෙම හංගන කොට එදා විශේෂ වෙච්ච මොනව හරි පුස්කොල පොත් ආදිය ලියල තිබුණ නම්, ඒව අද වගේ ගොඩක් තිබුණෙ නෑ. සමහර වෙලාවට එක රටකට, ජනපදයකටම පොත් කිහිපයයි තිබුණෙ. ඒකත් තිබුනෙ ප්‍රධාන මූලස්ථානවල. එතකොට ඒවත් අද වගේ හැමෝටම පරිහරණය කරන්න, ලේසියෙන් ලබාගන්න පුළුවන් තත්ත්වයක් තිබුණෙ නෑ. උගන්වන්න මූලාශ්‍ර වශයෙන් තිබිච්ච පොත් කිහිපයක් තමයි තිබුණෙ. ඒව පරිහරණය කළෙත් ඒ කාලෙ ලෝක සම්මතයේ හිටපු මහාචාර්ය, ආචාර්ය වගේ නායක හාමුදුරුවරු. ඒව පරිහරණය කරන කොට මන්තර සාස්තර, පිරිත් ආදියෙන් නොයෙක් එල ප්‍රයෝජන ගන්න පුළුවන් බව ඒ අය දැක්කා. ඉතින් ඒවායින් ලෞකික ප්‍රයෝජන ගත්තම මිනිස්සුන්ගෙන් ලාභ, කීර්ති, ප්‍රශංසා ලබන්න හරි පහසුයි. ඒ නිසා ඒ පත්ඉරු කොටස් ගලවල හංග ගත්තා. ඊට පස්සෙ අනික් සැරේ බලන කොට ඒ ඉවත් කර ගත්තු පත් ඉරු නැත්නම් නැවත ගන්න තැනක් නෑ. මොකද එදා අද වගේ තාක්ෂණයක් තිබුණෙත් නෑ.

අදත් මේ කාරණය අපට අත්



දකින්න තියෙන දෙයක්. ඒ කියන්නෙ ඔය හුඟක් වටිනවයි කියන පොත් තියෙන මහජන පුස්තකාලවල සමහර පොත්වල මැද අතරින් පතර පිටු නෑ. ඒවා බලල තමන්ට වැදගත් කියල හිතෙන සමහර කොටස් යම් යම් අය ගලවගෙන ගිහින්. ඉතින් අද තාක්ෂණය හැම තැනම තියෙන නිසා ඕන තරම් පිටපත් කරගන්න පුළුවන් වුනාට එදා එහෙම තත්ත්වයක් තිබුණෙ නෑ. ඒ නිසා ගලවල ඉවත් කරගත්තු ඒවා එහෙම්ම යට ගියා. ඉතිරි වෙච්ච පත් ඉරුවල තියෙන නිවන් දකින කොටස් ගැන ප්‍රශ්නයක් ඒ අයට තිබුණෙ නෑ. මොකද ඒව අයින් කරන්න, හංගන්න ඕන කමක් තිබුණෙ නෑ. ඒවායේ පරිහරණයක් තිබුණෙත් නෑ. පරිහරණය තිබුණෙ අදත් වටිනව කියල හිතාගෙන ඉන්න ඔය ලෞකික සූත්‍ර කොටස් තමයි.

උදාහරණ විදියට ත්‍රිපිටකයේ පොත් කට්ටලයකුයි, මැණික් ගලකුයි කොහේ හරි හංගල තිබිල හොරෙකුට අහුවුණොත්, ඒ හොරා ගෙනියන්නෙ මැණික් ගල මිසක් අර පොත් කට්ටලය නෙවෙයි. මොකද ලෝකයේ මිනිස්සුන්ට වටිනාකම තියෙන්නෙ මැණික් ගලේ. මේ වගේ මොකක් හරි ලෞකික ලාභයක් බලාපොරොත්තු වෙච්ච උදවිය, ඒවට හරියන කොටස්වලට තමයි මුල් තැන දීල තිබුණෙ. ඒක තමයි රැක්කෙ. ඒක තමයි හොරකම් කළේ. ඒක තමයි හැංගුවෙ. ඒ කියන්නෙ මොකක් හරි යන්ත්‍රයක් මන්ත්‍රයක් වගේ හදාගන්න, කීයක් හරි හොයාගන්න ලෝකයාගෙන් ලාභ, කීර්ති, ප්‍රශංසා ලබාගන්න පුළුවන් දේවල් තිබුණ නම්, ඒ ජාතියෙ ඒව තමයි හැංගුවෙ. අද වුණත් අංගුලිමාල පිරිත හුඟ දෙනෙක් හරි ආසාවෙන් පාඩම් කර ගන්නවා. මොකද වතුර මතුරල ගැබිනි මවුවරුන්ට දුන්නම දරු ප්‍රසූතිය පහසු වෙනවා. ඒව අදත් භාවිතා කරන උදවිය බොහොමයක් ඉන්නවා. නමුත් අදට වඩා එදා හිටියා. ත්‍රිපිටකයෙ එන අනෙක් සූත්‍ර කොටස්වලට වඩා මේ වගේ සූත්‍ර කොටස් විශේෂ වෙලා තියෙනවා. මොකද මිනිස්සු හොයන්නෙ කීයක් හරි හම්බ කර ගෙන හොඳ ලෞකික ජීවිතයක් ගත කරන්න පුළුවන් ක්‍රමයක්. දැන් මේ වගේ ලෞකිකව වැදගත් වෙන සූත්‍ර කොටස් ත්‍රිපිටකයේ තිබිච්ච බවට එක් වැදගත් සාධකයක් තමයි අංගුලිමාල පිරිත. මොකද ඒ පිරිතෙන් සෙත් කරල යම් කිසි සත්‍ය ක්‍රියා බලයකින් දරුවන් ලැබෙන්න ඉන්න ගැබිණි මවුවරුන්ට දෙන්න බුදුන් වහන්සේ අවසර දීල තිබුණා. ඒ නිසා ඒ පිරිතෙ බලෙන් අපහසුවක් නැතිව එදා යහපත් විදිහට දරුවන් ලබන්න හේතු වාසනා ලබා දුන්න කියල සඳහන් වෙනවා. අන්තිමට අංගුලිමාල හිමියන් ඒ පිරිත් දේශනා කරන වෙලාවෙ අසුන්ගෙන හිටපු පුටුව හෝදල දුන්න ජලයෙන් පවා දරු ප්‍රසූතිය ඉක්මන් හා පහසු වුනා කියල කියනවා. ඉතිං මේ පිරිත, ගැබ හිරවෙලා වේදනාවෙන් කෑ ගහපු එක්තරා කාන්තාවක් මුල්

කරගෙන බුදුන් වහන්සේගේ අනුමැතියෙන් තමයි දේශනා කළේ. බුදුන් වහන්සේගෙන් ඒ පිරිත අහගෙන තමයි අංගුලිමාල හිමියන් ඒක කළේ.

එතකොට නිවන් දකින්න විතරක් නෙවෙයි ලෞකිකව බොහෝ වැදගත් වෙන, අවශ්‍ය නම් ලාභ, කීර්ති, ප්‍රශංසා පවා ලබන්න පුළුවන් වැදගත් උදව් උපකාර ලබාදෙන පිරිත් කොටස් මේ බුද්ධ ශාසනයේ තිබ්බච බවට මේකෙන් ඔප්පු වෙනවා. අදටත් මේ අංගුලිමාල පිරිත ත්‍රිපිටකයේ ඉතිරි වෙලා තියෙනවා. ඒක අයින් කරල නෑ. එහෙනම් ඒක විතරක් නෙවෙයි යක්ෂ උපද්‍රව, අමනුස්ස උපද්‍රව දුරු කරගන්න, ඒ වගේම යම්කිසි අණවින කොඩිවින දුරු කරගන්න, ගොවිතැන් බත් සශ්‍රීක කරගන්න ක්‍රමත් මේ ශාසනය තුළ තිබිල තියෙනවා. ඒ වගේ ඒවා නැතිවෙන්න බෑ. මොකද **මෙලොව, පරලොව අභිවෘද්ධිය සහ නිවන් කියන ක්‍රම තුනම බුද්ධ ශාසනයක් තුළින් ලැබෙනවා. බුදුන් වහන්සේ මේ ක්‍රම තුනම පැහැදිලිව දේශනා කරල තියෙනවා.** එතකොට මේ තුනෙන් මෙලොව අභිවෘද්ධිය ලබාදෙන සූත්‍ර කොටස් තමයි බොහොමයක් හංගල තියෙන්නෙ. ඒ නිසා අද වෙනකොට ත්‍රිපිටකයේ ඒ වගේ සූත්‍ර වැඩි හරියක් අතුරුදන් වෙලා තියෙන්නෙ.

උදාහරණ විදියට දස දිසා බන්ධන පිරිත රැකවරණ සලසන ආරක්ෂක පිරිතක් වශයෙන් තවමත් භාවිතා කරනවා. එහෙම රැකවරණයක්, ආරක්ෂාවක් ඒකෙ තියෙන බවත් අත්දකින්න තියෙනවා. නමුත් ඒක ත්‍රිපිටකයෙ කොතනකවත් නෑ. ඒ වගේම ගිනි පිරිත කියන්නෙත් ඒ වගේ ආරක්ෂක පිරිතක්. ඊළඟට වැසි පිරිත කියන්නෙ වැස්ස ලබා ගන්න බොහොම වැදගත් වෙන පිරිතක්. ජල නන්දන පිරිතත් ඒ වගේම බොහෝ ආරක්ෂාවක්, රැකවරණයක් ලබා ගන්න පුළුවන් පිරිතක්. නමුත් මේ පිරිත් සූත්‍ර අද ත්‍රිපිටකයේ නෑ.

ඒ වගේම චන්ද්‍ර සූර්ය පිරිත් කියන්නෙ ඒ වගේම ආරක්ෂාව ලබා ගන්න පුළුවන් පිරිත් කොටස් දෙකක්. හැබැයි ඒ පිරිත් කොටස් දෙක ත්‍රිපිටකයේ තවමත් තියෙනවා. ඒ වගේම මෝර පිරිත සම්බන්ධයෙන් මෙහෙම කතාවක් තියෙනවා. ඒ කාලෙ මොණරගෙ ආයුස කියන්නෙ අවුරුදු 500 ක්. බුදුන් වහන්සේ බෝසත් පාරමිතාව පුරන කාලයේ මොණරෙක් වෙලා ඉපදිලා මේ පිරිත භාවිතයෙන් කිසිම මළ පුඩුවකට අහු නොවී, කිසිම උපද්‍රවයක් නැතිව සම්පූර්ණ ආයු කාලයම ගත කළා කියල කියනවා. ඒක තමයි අද මෝර පිරිත කියල කියන්නෙ. මොණරෙක් තමයි ඒකට උපමා කරල තියෙන්නෙ. බෝසතාණන් වහන්සේ මොණරෙක් වෙලා හිටපු අත් භවයකදි උදේ රාත්‍රී සූර්යාටයි චන්ද්‍රයාටයි මේ මෝර පිරිතෙන් කියවෙන ගාථාවෙන් නමස්කාර කරල, ශාසනයට නමස්කාර කරල නිදා ගත්තා. උදේට කෑම හොයන්න ගියෙත් ඒක සිහි කරලා. ඒ නිසා ඒ මොණරගෙ ආයුස අවුරුදු 500 ක් යනකල් කිසිම උපද්‍රවයකට ගොදුරු වුනේ නෑ කියල සඳහන් වෙනවා.

දැන් මෙතනදි කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, තිරිසන් අත් භවයක ඉන්න මොණරෙකුට ඔච්චර දෙයක් සිහි කරන්න පුළුවන්ද කියල. (සතුන්ගේ සංසාරික පුරුදු ගැන මීට පෙරත් ''අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්'' ලිපි පෙළින් විග්‍රහ කරල තියෙනවා.) මෙතනදි මෝර පිරිත කියල වචනවලින් පෙන්නුවට සමහර විට වචන නැතිව සතෙකුට ඒකෙ හැඟීම සිහි කරන්න පුළුවන්. ඒ කියන්නෙ පද වශයෙන් කිව්ව කියන එක නෙවෙයි. සමහර විට සසර පුරුදු පුහුණු කරපු අදහස් තිබුණ නම්, ඒ අදහස් තිරිසන් වෙලත් එන්න පුළුවන්. සමහර සත්තු ඒ වගේ පුරුදු, කෑ ගැහීමෙන් සටහන් කරනවා. සතා ශබ්ද කරන කොට හැඟීමකින් අදහසක් ප්‍රකාශ කරනවා. ඒක විවිධාකාරයෙන් වෙන්න පුළුවන්. උදාහරණයක් විදියට යම් කිසි කෙනෙක් බට නලාවකින් සිංදුවක් වාදනය කරන කොට ඒක වචනවලින් නොකිව්වත්, ඒ සින්දුව අහල පුරුදු අයට මේ අහවල් සින්දුවනෙ කියල අදහස එනවා, හැඟීම එනවා. මේ වගේ සතුන්ටත් වචනවලින් ප්‍රකාශ කරන්න බැරි වුනාට හැඟීම ගන්න පුළුවන්. ඒ හැඟීම වචන නැතිව ප්‍රකාශ කරන්නත් පුළුවන්. නමුත් මිනිස්සුන්ට ඕක තෝරගන්න බෑ.

ඒ වගේ බෝසතාණන් වහන්සේ සසර පෙරුම් පුරාගෙන එනකොට යම්කිසි පුරුද්දක් හුරු කරගෙන තිබුණ නම්, මොණරෙක් වෙලා උපන්නත් ඒ පුරුද්දට අනුකූලව ශබ්ද නගන්න පුළුවන්. සසර පුරුද්දට ඒ හැඟීමත් එන්න පුළුවන්. ඒක අපට නෑ කියන්න බෑ. මොකද සසර පුරුද්දට බුදුන් වහන්සේට ඇප උපස්ථාන කරපු පාරිලෙයිය වනයේ ඇතා, වඳුරා වගේ සතුන් හිටියා. ඒව ඔක්කොම කළේ සසර පුරුද්දට. ඒ පුරුදු විවිධාකාරයෙන් මතු වෙලා එන්න පුළුවන්.

එහෙම නැත්නම් කාලයක මොණරෙක් හා සමානව සුන්දර ලෝකයක ජීවත් වෙච්ච කෙනෙක් වෙන්නත් පුළුවන්. එහෙම හොඳට ඇඳල පැළඳල මොණරෙක් වගේ ජීවත් වෙච්ච කාලයක් වෙලා, අර ගාථාවෙන් රැකවරණයක් ලැබුව වෙන්නත් පුළුවන්. මේ කොයි පැත්තෙන් වුනත් මොණරෙක් ඒ විදියෙ රැකවරණයක් ලැබුව නම් මනුස්සයින් ගැන කවර කතාද ? ඉතින් මේ වගේ අවස්ථා අපට තෝර ගන්න බැරි වුනාට අදත් තියෙනවා. මේ කියන ඒවටත් වඩා හොඳට ගැඹුරට තිබ්බච සූත්‍ර තමයි ත්‍රිපිටකයෙන් ඉවත් කරල තියෙන්නෙ. **යක්ෂාවේෂවලින් පන්නල බේරල දෙන ක්‍රම, පිස්සු ඉවත් කරන ක්‍රම, ඒ වගේම විවිධාකාර ලෙඩ රෝගවලට ප්‍රත්‍ය වෙන බෙහෙත් ඖෂධ වගේ තිබ්බච මහ බලවත් සූත්‍ර කොටස් තමයි අද නැත්තෙ.** ඒ සූත්‍රවලින් කොටසක් තමයි අදත් බොජ්ජංග පිරිත් වශයෙන් ත්‍රිපිටකයේ ඉතිරි වෙලා තියෙන්නෙ. නමුත් බොහොමයක් හලල. මේ ඉතිරි වෙච්ච සූත්‍ර කොටස්වලින් පෙන්වන්නෙත් විවිධ අසනීප, ලෙඩ රෝග ආදිය සුද්ධ කරපු හැටි තමයි. ඒ නිසා තමයි අදත් ලෙඩ රෝග හැදිච්ච අයට මේ බොජ්ජංග පිරිතෙන් සෙත් කරන්නෙ. මේ විදියට ව්‍යවහාරයෙන් ආපු බලවත් ගාථාවක් වන මෝර පිරිතේ එන, යේ බ්‍රාහ්මණා වේදගු සබ්බ ධම්මේ ... ආදී වශයෙන් කියන ගාථාව මහ විසාල බලයක් තියෙන ගාථාවක්. අදත් මේ ගාථාව භාවිතයෙන් සෑහෙන බාධක, අපල උපද්‍රව දුරු කරගන්න පුළුවන් බවට අත්දැකීම් තියෙනවා. ඒ නිසා තමයි මේ ගාථාවෙන් බලවත් යන්ත්‍රයක් හදාගන්න හැටි මේ දහම් සඟරාවෙ 13 වන කලාපයෙන් පෙන්වා දුන්නෙ.

දැන් මේ වගේ කාරණාවලින් පෙනී යන්නෙ **ඒ කාලෙ ඉඳලම මේ ත්‍රිපිටකයේ ලෞකික සුබ විහරණයට හේතුකාරක වන්නා වූ නොයෙක් ආකාරයේ මන්ත්‍ර අභිබවා ගිය යම්කිසි බුද්ධ ගාථා සූත්‍ර වශයෙන් තිබ්බච බව.** ඒවායින් යම් යම් කොටස් අර කලින් කියපු විදියටම හංගගෙන තියෙන්න පුළුවන්.

දැන් කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඇයි එහෙනම් ලෞකිකව වැදගත් වෙච්ච ඔක්කොම කොටස් හංගන්නෙ නැතිව කොටසක් විතරක් හැංගුවෙ කියල. උදාහරණ විදිහට අංගුලිමාල පිරිත, චන්ද්‍ර සූර්ය පිරිත, බොජ්ජංග පිරිත වගේ ලෞකික වැදගත්කමක් තියෙන සූත්‍ර කොටස් අදටත් ත්‍රිපිටකයේ තියෙනවා. එහෙම ඉතිරි වෙලා තියෙන්නත් විවිධ හේතු තියෙනවා. මොකද හංගගෙන අයින් කරන කොට ප්‍රධාන වශයෙන්ම ඒක කරන්නෙ මහ බලවත්ම සූත්‍ර කොටස්වලට. සියල්ලම නෙවෙයි. ඒ වගේම මේ පිරිත් සූත්‍ර කොටස් අතරින් සමහර ඒවා ගිහි පැවිදි දෙගොල්ලන් අතරම ප්‍රසිද්ධ වෙච්ච සමහර කාල වකවානු තිබුණා. ඒව සමාජයේ බොහොමයක් දෙනාට කටපාඩම් වෙලා තිබුණා. ඉතින් එහෙම ප්‍රසිද්ධ වෙච්ච ඒව හැංගුවට, හැලුවට වැඩක් නෑ. ඒ නිසා ඒ කොටස් නිරුපද්‍රිතව රැකුණා. චන්ද්‍ර සූර්ය පිරිත, යේ බ්‍රාහ්මණා වේදගු ☞

සබ්බ ධම්මේ .. ආදී වශයෙන් කියන ගාථාව ඒ කාලයේ ඉඳලම මුඛ පරම්පරාවෙන් ඇවිත් ප්‍රසිද්ධ වෙලා විහිදිලා තිබුණා. තවත් ඒ වගේ ගාථා තියෙනවා. ඒව පාඩම් කර ගන්න ලේසියි. එහෙම ප්‍රසිද්ධියට ගියේ නැති, ඒ වගේම කටපාඩම් කරගෙන එන්න අපහසු බලවත් කොටස් තමයි හංගගෙන තියෙන්නෙ. ඒව හරි සංකීර්ණයි. පටලවන්න හරි ලේසියි. එහෙම පැටලෙව්වොත් මිනිස්සු නන්නත්තාර වෙනවා.

දැන් මේකට හොඳම උදාහරණයක් තමයි රන් දෙණේ ගාථා. **මේ රන් දෙණේ ගාථා කියල කියන්නෙ බුදුන් වහන්සේ පිරිනිවන් පෑවට පස්සෙ ශ්‍රී දේහය (දෙන) විවෘත කරන්න, වහන්න, ගිනි දල්වන්න කියන අවස්ථා තුනට භාවිතා කරපු මහ බලවත් ගාථා තුනක්.** හැබැයි අද මේ ගාථා ත්‍රිපිටකයේ කොතනකවත් නෑ. නමුත් යම් යම් විදියට ව්‍යවහාරයෙන් ඇවිත් අදටත් බලවත් වෙලා තියෙන ගාථා මේ අතර තියෙනවා. ඒ ප්‍රධාන ගාථා තුනට අමතරව ශ්‍රී දේහය ගිනි ගත්තට පස්සෙ ගත්තු තවත් බලවත් ගාථාවක් තමයි, බනේන අග්ගිං ජල මානනාය... ආදී වශයෙන් කෙත්වතුවලට කෘමි උවදුරු එනවට, ගොයම් පරාග පෝෂණය වෙලා හොඳ අස්වැන්නක් ලැබෙන්න භාවිතා කරන ආකාරය මේ දහම් සඟරාවේ 14 වෙනි කලාපයේ පළ වූ ''ආදි පැරැන්නන් දහමට අනුව පෙරදිග ධාන්‍යාගාරය ගොඩ නැගූ හැටි'' ලිපියෙන් ඉදිරිපත් කළේ. හැබැයි ඒකත් අද සමහර තැන්වල වචන වරද්දල පටලවල කියන්නෙ. ඒ වගේම යම්කිසි දෙයක් විවෘත කරන්න, බැහැර කරන්න ඒ වගේ ශක්තියක් තියෙන තවත් රන් දෙණේ ගාථාවක් තමයි මේ.

**සුද්ධෝදනෝච පීතාච**
**- මායා දේවීච ගෝතමෝ**
**සිද්ධ සත්ථාච සුද්ධ සේනා**
**- කස්සපෝච විසුං විසුං**

දැන් මේ වගේ ප්‍රධාන ගාථා තුනක් තියෙනවා. එයින් ශ්‍රී දේහය විවෘත කරපු ගාථාව හරියට මොකක්ද කියල බොහෝ අය දන්නෙ නෑ. සමහරවිට ඒ ගාථාව කියල, සිද්ධි තියෙන අයගෙ අතට මතුරල දීල යම්කිසි වහල තියෙන දොරකට අත තිබ්බොත් එහෙම, ඉබ්බත් ගැලවිලා දොර තල්ලු වෙලා ඇරෙනවා. ඒ තරම් බලවත් හැකියාවක් ඒකට තියෙනවා. ඒ නිසා ඒ ගාථාවත් රහසිගතයි. ඒක ත්‍රිපිටකයෙ නෑ. හැබැයි කටවහරින් එනවා.

දැන් මේ දෙවෙනියට සඳහන් ගාථාව බුදුන් වහන්සේගේ පියා සහ මව මුල් කරගෙන හදපු ගාථාවක්. ''සිද්ධ සත්තාච සුද්ධ සේනා'' කියල කියන්නෙ සත්වයින්ට සුද්ධත්වය ඇති කරන සිද්ධිය ලබා දුන්නා කියන එක. ''කස්සපෝච විසුං විසුං'' කියල කියන්නෙ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් ඒ බලය පෙන්වල බුදුන් වහන්සේගේ රන් දෙණ විවෘත කළා කියන එක. ඒ බලය සිහි කරන එක තමයි මේ ගාථාවෙන් කියන්නෙ. මොකද බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය තැන්පත් කරල තිබ්බ්ච වෙලාවෙ ශ්‍රී දේහය වහල තමයි තිබුණෙ. ඒ කියන්නෙ අන්තිමට ගිනි ගන්වන්න ඉස්සෙල්ල දර සෑය වහල තිබුණා. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වැඩල තමයි රන් දෙණ සහිත දර සෑය විවෘත කළේ. උන් වහන්සේ ඒ දෙණ විවෘත කරල ශ්‍රී දේහය බැලුවා. ඒ බලපු අවස්ථාවෙදි උන් වහන්සේ ගත්තු ගාථා තුනක් තමයි මේ රන් දෙණේ ගාථා කියල සඳහන් වෙන්නෙ. ඉස්සෙල්ලම රන් දෙණ විවෘත කළා. ඊට පස්සෙ වැහුවා. ඊට පස්සෙ ගිනි ගැන්නෙව්වා. මේ අවස්ථා



තුනට තමයි ඒ ප්‍රධාන ගාථා 3 දුන්නෙ.

එතකොට මේ ගාථා උන් වහන්සේට නැගුනෙ පටිසම්භිදා ඥාන සහ අභිඥා බලයෙන්. ඒ බලයට අක්ෂර, ගණ, මාත්‍රා ඔක්කොම ගැලපිලා මොහොතකින් ආපු ශක්තියකින් තමයි මේ ගාථා ගෙතිල ආවෙ. එබඳු ඥාන ශක්තියක් තිබ්බ්ච මහ රහතන් වහන්සේලා මේ වගේ අවස්ථාවලදි, විවිධ යහපත් කටයුතුවලට මේ වගේ ගාථා ගොතල දීල තියෙන්නෙ ඒකාන්තයෙන්ම ඒවායේ එහෙම බලයක්, ශක්තියක් තියෙන නිසා. ඒ වගේ ශක්තියක් උන්වහන්සේලාට තිබුණයි කියන්න මේක හොඳ සාක්ෂියක්. මොකද මේ වගේ ගාථාවක් ගොතන්න උන් වහන්සේලාට මහ ලොකු කාලයක් යන්නෙ නෑ. අභිඥා ලාභියෙකුට තමන්ගෙ අභිඥා බලයෙන්, පටිසම්භිදා ඥාන බලයෙන් මේ වගේ පොඩි ගාථා, පොඩි මන්තර ගොතල අක්ෂර, ගණ වරදින්නෙ නැති වෙන්න නියම ක්‍රමයට බල පිහිටුවල දෙන්න පුළුවන්. ඉතින් ඒ කාලෙ එහෙම අභිඥාලාභීන් දහස් ගණනින් හිටපු නිසා උන් වහන්සේලා මේ වගේ වැදගත් කොටස් ඕන තරම් මනුස්සයින්ගෙ යහපතට දීල තියෙන්න ඇති. ඒ වගේ සමහර කොටස් ශ්‍රාවක භාවිතා වශයෙන් ඇවිත් ත්‍රිපිටකයේ තිබ්ල අර වගේ හංගල හැලිල තියෙන්න පුළුවන්.

එතකොට මේ ගාථාවල විවිධත්වයක් තියෙනවා. විවිධ අය විවිධ විදියට මේ රන් දෙණේ ගාථා කියනවා. නමුත් ඒ ඒ කටයුතුවලට බලවත් වෙච්ච ගාථාව මොකක්ද කියන කාරණය හැංගිලා. **මේ සියලු ගාථා බලවත්. ඒවා විවිධාකාර වැඩවලට යොදා ගන්න පුළුවන්. හැබැයි නියමිත කාරණයට අදාළ ගාථාවම තෝර ගන්න ඕන.** ඒ වගේම හොඳ නරක දෙකටමත් මේවා යොදා ගන්න පුළුවන්. සමහරවිට යම්කිසි කෙනෙකුට ගැබක් වහන්න ඕන නම් ඒකටත් ඕක යොදා ගන්න පුළුවන්. එතකොට ඒ ජීවියා බිහි වෙන්නෙ නෑ. ඒකට නියමිත ගාථාවෙන්ම කළොත් එහෙම වෙනවා. වෙන එකකින් කළොත් බෑ. මේ වගේ විනාස වෙන පැත්තකුත් තියෙන නිසා ඒ කරුණු කාරණා හෙළි කරන්න විදියක් නෑ. කොහොම හරි මේ ප්‍රධාන ගාථා තුන හරියටම මොකක්ද කියල බොහෝ උදවිය දන්නෙ නෑ. නමුත් තැනින් තැන විවිධ ගාථා අහන්න ලැබෙනවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, මේ වගේ බුද්ධ ගාථාවක් එහෙම කොහොමද අයහපතට යොදා ගන්න පුළුවන් වෙන්නෙ කියල. මොකද මේ වගේ යහපත් දේවල් ලෝකයේ පහළ වෙච්ච උත්තමයන් විසින් දායාද කරන කොට, එහෙම දෙන්නෙ මනුස්ස වර්ගයාගේ යහපතට මිසක් අයහපතට නෙවෙයි. උදාහරණ විදියට එදා හිටපු ඍෂිවරු යම්කිසි බේතක් ගැබිණි මවුවරුන්ට ගන්න එපා කියල කියනවා. මොකද ඒකෙන් ගැබ විනාස වෙන්න පුළුවන් නිසා. එතකොට ඒක පෙන්නල දුන්නෙ මනුස්සයින්ගෙ යහපතට. නමුත් අසත්පුරුෂයො මොකද කරන්නෙ, ගැබ් විනාස කරන්න වගේ අයහපත් දේවල්වලටම ඒක යොදා ගන්නවා. උදාහරණයක් විදියට යමක් වහන්න ඕන නම්, ඊට අදාල ගාථාවෙන් මතුරල එක්තරා ක්‍රමයකට පාවිච්චි කළොත් ඒක හොඳට නරකට දෙකටම යමක් වහන්න යොදා ගන්න පුළුවන්. එතකොට ඒක ☞

විවෘත වෙන්නෙ නැතිව යනවා. නමුත් මේකෙ යහපත් පැත්ත විදියට දුන්නෙ වහන ගාථාවෙන් යම් හානිකර දෙයක් වහන්න වගේ යහපත් දේකට. ඒ වගේම යහපත් දෙයක් විවෘත කරගන්න තවත් ගාථාවක් දුන්නා. නමුත් ඒකම අයහපතටත් යොදාගන්න පුළුවන්.

උදාහරණ විදියට වැහෙන ගාථාවෙන් යම් තෙලක් හරි ජලය හරි මතුරල යම් සර්පයෙක් දෂ්ට කරපු තැනට දැම්මොත් ඒ තුවාලය වැහෙනවා. ඒ කියන්නෙ විස බැඳෙනවා. ඒක අයහපතක්. ඒ වගේම ගිනි ගන්න ගාථාවෙන් ඒක කළාම විස පිච්චිලා විස නැසෙනවා. ඒක යහපතක්. ඒ වගේම තදබල විදියට උණ ගැනිල ඉන්න රෝගියෙකුට ගිනි ගන්න ගාථාවෙන් යමක් මතුරල දුන්නොත් උණ බැහැල විස ඔක්කොම පිච්චිලා යනවා. මේ ගාථාවලින් දෙහි කපල ඇඟේ පතේ තියෙන දෝස නැති කරන්න කෙළින්ම යොදා ගන්නත් පුළුවන්. දෝස ඉතිරි වෙන්නෙ නෑ. ඔක්කොම පිච්චිලා යනවා. මේ වගේ අවස්ථානුකූලව තැනට ඔබින විදියට අදාළ ගාථාව යොදා ගත්තම ඒකෙන් මහ විසාල යහපතක් උදා කරගන්න පුළුවන්. නමුත් අර කලින් කියපු විදියට ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වෙච්ච උදවිය ඒවායින් මත් වෙලා මේක නරකටත් පාවිච්චි කරන්න ගන්නවා.

ඉතින් මේ වගේ මේ හැම එකකම දෙපැත්තක් තියෙනවා. බුද්ධ ගාථාවන් කොහොමත් යහපතටමයි දෙන්නෙ. නමුත් අසත්පුරුෂයො ඒක අල්ලගෙන අර වගේ අයහපත් දේවල්වලට යොදා ගන්නවට අපට කරන්න දෙයක් නෑ. **මේ වගේ මනුස්සයින්ගෙ යහපතට දීල තියෙන ගාථාවන් පසුකාලීනව ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වෙච්ච උදවිය ගෙවල් දොරවල් ගිනි තියන්න, විනාස කරන්න ආදී මහා විනාසකාරී අයහපත් දේවල්වලටත් යොදා ගත්තා.** උදාහරණ විදියට එක්තරා ගිනි ගන්න මන්තරයක් තියෙනවා. ඒ මන්තරය සම්පූර්ණයෙන්ම අරගෙන යම්කිසි දෙහි ගෙඩියකින්, ගල් කැටයකින් මතුරල තමන්ගෙ විරුද්ධවාදියෙකුගෙ කඩේකට, ගෙදරකට ගැහුවොත් ඒ ඔක්කොම විනාස වෙලා යනවා. ඒ නිසා ඒවායෙ යහපත් පැත්තක් තිබුණත් මිනිස්සු මේ වගේ විනාසයන්ටම යොදා ගන්න නිසා ඒ වගේ දේවල් මේ සඟරාවෙ සටහන් කරන්න විදියක් නෑ. ඒ තරම් හරි භයානකයි. ඒ නිසා ඒ වගේ කරුණු සම්බන්ධයෙන් වැඩිදුර කරුණු හෙළිදරව් කිරීමක් කරන්නෙ නෑ. මොකද හරියට පාවිච්චි කරන උදවිය වගේම වැරදියට පාවිච්චි කරන උදවියත් සමාජයේ ඉන්න නිසා.

කොහොම හරි මේ රන් දෙණේ ප්‍රධාන ගාථා 3 ත් ත්‍රිපිටකයෙන් හලල තිබුනට කොහේ හරි තියෙන්න ඕන. නැතිවෙන්න බෑ. අක්ෂර, ගණ ආදිය ගලපල ඒ ගාථා අර්ථයම අරගෙන ඒවායින් විවිධ ප්‍රයෝජන ගන්න පුළුවන් මන්තරත් හදල තියෙනවා. මොකද ඔය මන්තර සාස්තර දන්න මන්ත්‍රවේදධාරීන්ට ඒක මහ ලොකු දෙයක් නෙවෙයි. මේ නිසා රන් දෙණේ ගාථා සහ රන් දෙණේ මන්තර කියල වර්ග 2 ක් තියෙනවා. කොහොම හරි මේ විදියට විවිධාකාරයෙන් වෙනස් කරපු නිසා තමයි අද හරි එක මොකක්ද කියල තෝර ගන්න බැරි වෙලා තියෙන්නෙ.

දැන් එතකොට ත්‍රිපිටකයෙන් හලල තියෙන්නෙ මේ වගේ ලෞකිකව විසාල යහපතක් උදා කර ගන්න තිබිච්ච සූත්‍ර කොටස්. ඒ නිසා නිවන් දකින දහම් කොටස්වල පරස්පරයක් නැතිව හොඳට තියෙනවා. ඒක වෙනස් කරන්න, අලුතින් එකතු කරන්න, කපන්න කොටන්න අවශ්‍යතාවයක් තිබුණෙ නෑ. ඒ ටික නිරුපද්‍රිතව තියෙනවා. මොකද අර ලෞකිකව වැදගත් වෙන කොටස් වගේ නෙවෙයි, මේ නිවන් දකින කොටස් ත්‍රිපිටකයේ තිබිච්ච පළියට හැමෝටම තෝර ගන්නත් බෑ. ඒකටත් යම් ඥානයක් අවශ්‍යයි. ඒ නිසා තමයි අද ත්‍රිපිටකයේ තියෙන නිවන් දකින දහම වුණත් තෝර ගන්න බැරිව පටලවාගෙන තියෙන්නෙ. නමුත් අර ලෞකිකව වැදගත් වෙන කොටස්වල විවිධ පද වෙනස් වුණා. එක එක්කෙනා ඒව කඩාගෙන ලියා ගන්න කොට ඒව එකින් එක වෙනස් වෙලා ගියා. එතකොට විවිධ අය විවිධ විදියට ඒව හදා ගත්තා. සමහර ඒවා නැවත හොයා ගන්නත් බැරි විදියට වහල තියෙනවා. ඒකෙන් අන්තිමට වුණේ, ගන්න තිබිච්ච යහපත කාටවත් ගන්න බැරි විදියට යටපත් වෙච්ච එක.

උදාහරණ විදියට ජල නන්දන පිරිතේ එන ''චතුවීසති බුද්ධෝති - යො භවිස්සති උත්තමං...'' කියන කොටස සමහර තැන්වල ''සෝ භවිස්සති උත්තමං'' කියල කියනවා. ඒ වගේම තවත් අයෙක් ඒකට ''චත්තාරෝ වීසති බුද්ධං'' කියලත් කියනවා. ඒ වගේම ''පාරමී බල යුත්තේහි / පාරමී බල පුත්තේහී / පාරමී බල බුද්ධේහී...'' කියල මේ විදියට විවිධාකාරයෙන් කියන කොට හරි එක තෝර ගන්න බැරිව මිනිස්සු නන්නත්තාර වෙනවා. මේ විදියට ජල නන්දන පිරිතත් අද වෙනකොට විවිධාකාරයෙන් හදාගෙන තියෙනවා. පද හැම තැනම වෙනස් වෙලා. කොයික හරිද කියල නිගමනය කරන්නත් බෑ. සමාධි හැකියාවක් තියෙන යම්කිසි ගුණයක් වඩපු කෙනෙකුට ඇරෙන්න, නිකන් සාමාන්‍ය කෙනෙකුට ඒකෙ අඩුපාඩු අහුවෙන්නෙත් නෑ. අල්ලගන්න හරි අමාරුයි. ඒ නිසා තමයි අද කොච්චර කළත් මේවායින් ප්‍රතිඵල නැත්තෙ. ඉතිං සමාධියක් තියෙන කෙනෙක් ඒ කියන හැම එකක්ම සමාධියට යොමු කරල යම්කිසි බලයක් වඩාගෙන ඒ එකින් එක අර්ථ දදා බලන්න ඕන. ඒකෙන් තමයි හරි එක මොකක්ද කියල තෝරගන්න වෙන්නෙ. උදාහරණ විදියට ''පාරමී බල යුත්තේහි'' කියල ගත්තම ඒක පරිවර්තනය වෙන්නෙ කොහොමද කියල සමාධි දර්ශනයෙන් බලා ගන්න ඕන. එතකොට තමයි එකින් එකට වෙනස්කම් දර්ශනය වෙන්නෙ.

ඊළඟට ත්‍රිපිටකයේ සිංහල පරිවර්තනයේ දෝස තියෙන බවත් කලින් සඳහන් කළා. උදාහරණ විදියට ''අනිච්ච'' කියන පාළි වචනය සිංහලෙන් තෝරන්න ගිහින් ''ස්ථිර නෑ, අනිත්‍යයි'' කියල අර්ථයක් අරගෙන තියෙනවා. ඒ වගේම ''අනත්ථ'' කියන පාළි වචනය ''අනාත්ම'' කියල තෝරල තියෙනවා. ඊළඟට ''පටිච්ච'' කියන වචනය ''නිසා'' කියල අර්ථ දක්වල තියෙනවා. දැන් එතකොට මේ පරිවර්තන දෝස හිතාමතා කරපු දෙයක්ද, එහෙම නැත්නම් නොදැනුවත්කමින් වෙච්ච දෙයක්ද? එදා යම්කිසි කෙනෙක් තමන් ගත්තු හැඟීම, එදා තිබිච්ච තමන්ට තේරෙන භාෂාවෙන් ලිව්වා. සිංහලෙන් තිබිච්ච එක පාළියට පරිවර්තනය කරල නැවතත් සිංහලට පෙරලන්න ගියාම ඒ පරිවර්තනය කරන්නෙ සිවු පිළිසිඹියාපත් මගඵල ලාභීන් නෙවෙයි නම්, ලෝක සම්මත උගතුන් නම්, ඒ පරිවර්තනයේ දෝස එන එක අහන්න දෙයක් නෙවෙයි. මොකද මුලින්ම තිබිච්ච හෙළ භාෂාව නෙවෙයි පසුව සිංහල කියල භාවිතා වුණේ. මිශ්‍ර භාෂාවක්. ඒ වගේම මුලින් තිබිච්ච පාළිය නෙවෙයි පසු කාලීනව පාළි භාෂාව කියල භාවිතා කරන්න පටන් ගත්තෙ. මේ ඔක්කොම කලින් කල ගොඩනැගිල නවීකරණය වෙච්ච ඒවා. නවීකරණය වෙච්ච එක ගොඩනැගෙන කොට අදහස් පෙන්වන්න දෙන වචන තමයි නවීකරණය වෙලා ගොඩ නැගෙන්නෙ. එතකොට කවුරු හරි එදා හිටපු දේශකයන් වහන්සේ නමක් යම් දේශනාවකින් අදහස් කළේ මොකක්ද, ඉස්සෙල්ලම ඒක අහගෙන තමයි අනිත් සැරේ පාලියට ගොඩනැගුවෙ. ඒක තමයි නැවතත් සිංහලට පරිවර්තනය කරල තියෙන්නෙ. ඒ නිසා එහෙම පරිවර්තනය කරන කොට සමහර විට අදහස වෙනස් වෙලා තියෙන්න පුළුවන්. ලියන කොට වෙනස් වෙලා ලියවෙන්න පුළුවන්. හැබැයි ඒක හරියට දන්න කෙනා අදහස දකිනවා.

උදාහරණ විදියට යම්

කෙනෙක් කිව්වොත් දූරියංක ගෙඩියෙ කටුව කොස් කටුව වගේ කියල, කොස් කටුව ගැන දන්න කෙනා දකින්නෙ ඒ අර්ථයෙන් නෙවෙයි. කොස් කටුවෙ තියෙන්නෙ පොඩි කටු. දූරියංක කටු ඊට වඩා ලොකුයි. ඒ නිසා කොස් කටුව කවදාවත් දූරියංක කටුව වගේ නෙවෙයි. නමුත් කෙනෙක් නිකන් තමන්ගෙ මතයට කියන්න පුළුවන් ඒක කොස් කටුව වගේ කියල. එතකොට ඒ අය දූරියංක දැක්කෙ නැත්නම්, කොස් කටුව විතරක් නම් දැකල තිබුණෙ ඒ අය මේ කොස් ගෙඩිය වගේ හැඩය තියෙන දූරියංක ගෙඩිය කියල සමහරවිට ඇඳල පෙන්වන්නත් පුළුවන්. නමුත් ඒක එහෙම නෙවෙයි. හැබැයි කවද හරි දූරියංක දැකල තියෙන කෙනෙක් අර ඇඳපු පිංතූරය දැක්කොත්, ''දූරියංක ගහේ කටු කොහොමද මෙහෙම වෙන්නෙ! මේ කොස් ගහේ කටුනෙ! මේ මොන පිස්සුවක්ද ?'' මේ විදියට ඒ අය කියනවා. එහෙම දැකල ඒ අනුසාරයෙන් ඒ පුද්ගලයා ඇත්ත හෙළි කරන්න පුළුවන්.

මෙන්න මේ වගේ බුදුන් වහන්සේ වැඩ හිටපු කාලයේ උන් වහන්සේගෙන් හෝ එදා හිටපු රහතන් වහන්සේලාගෙන් බණ පද අහගත්ත අය පසුකාලීනව නැවතත් මනුස්සයන් වෙලා ඉපදිලා ඉන්න පුළුවන්. ඒ අයට වචන මතක නැති වුණාට අදහස වැටහෙනවා. ඒ විදියට අද තියෙන ත්‍රිපිටකය බලන කොටත් බොහෝ තැන්වල අදහස සමානයි. හැබැයි වචනවල පැටලීම් තියෙනවා. ඒ නිසා තමයි එදා ''අගත අනගත චතුදිස සසස දිනේ'' කියල සිවු දිගින් පැමිණෙන මහා සංඝයා උදෙසා පූජා කරන ලදී කියන එක අද ''ආගතා නාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස දේම'' කියල වෙනස් වෙලා තියෙන්නෙ. හැබැයි වචන එහෙම වෙනස් වුණාට අදත් අදහස විදියට ඒකමයි ගන්නෙ. මේ වගේ එදා තිබිච්ච පාළියම අද නැතුවට අදහස තියෙනවා. හැබැයි ඒක සිංහලට පරිවර්තනය කළේ අර වගේ බුදුන් වහන්සේගෙන් හෝ මහ රහතන් වහන්සේලාගෙන් අසා දැන ගත් ශ්‍රාවකයන් වහන්සේලා නෙවෙයි නම් ඒකෙ දෝස එන්න පුළුවන්. මොකද ඒ සිංහල පරිවර්තනයෙ සමහර තැන්වල තියෙන අදහස් පාළියෙන් තියෙන අදහස්වලට වඩා වෙනස් වෙලා තියෙනවා. අර අදහස කියන කොට ඒකට තියෙන වචන වෙනස් වෙලා. ඒ වගේ යම් යම් වෙනස්වීම් සමහර තැන්වල තියෙනවා. වටයක් ගහල ලියන කොට ඒ වගේ පරිවර්තනවල වෙනස් වීම් වෙන්න පුළුවන්. හිතාමතාම කළයි කියන්නත් බෑ. නොදැනුවත්කමින් වෙන්නත් පුළුවන්.

කොහොම හරි වචන මොනව වුණත් වැරදුනේ අදහස් ගත්ත විදියෙන්. **එතනින් තමයි දහම වැහුණෙ.** ඉතින් වැහුණ ද ඇරුණ ද කියල දැන ගන්න තියෙන එකම ක්‍රමය තමයි, යමක් ඇසුරු කරන කොට රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙනව නම් ඒක පිළිගන්න කියල පෙන්වපු බුද්ධ දේශනාව. ඒක තමයි හොයා ගන්න තියෙන ලේසිම ක්‍රමය. ඒ විදියට රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙනව කියල පේනව නම් ඒ දහම සංදිට්ඨිකයි, අකාලිකයි, ඒහිපස්සිකයි, ඕපනයිකයි, පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූහීතියි කියන මේ දහම් ගුණ හයෙන් යුක්තයි. නිවන් දකින්න තියෙන දහම පිළිගන්න කියල තියෙන්නෙ මෙන්න මේ ටික වෙනව නම් විතරයි. මොන භාෂා පරිවර්තනයෙන් කළත් එහෙම වෙන්නෙ නැත්නම් ඒක බුද්ධ දේශනාවක් හැටියට නොගෙන අයින් කරන එක තමයි කරන්න තියෙන්නෙ.

දැන් ස්ථිර නැති නිසා දුකයි කිය කියා කොච්චර හිටියත් රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙන්නෙ නෑ. එහෙම වෙච්ච කෙනෙක් මෙච්චර කාලෙකට අහන්න ලැබිල නෑ. අනිත්‍ය නිසා දුකයි, ඒ නිසා අනාත්මයි කියල අදත් කියනවා. කොච්චර කිය කියා හිටියත් ඇලීමේ, ගැටීමේ ගතියෙන් ඒ අයගෙ මනස ඉවත් වෙලා නෑ. ලෝකෙට බැඳෙන ගතිය අත්හැරිල නෑ. අද ලෝක සම්මතයේ සමහර මහ තෙරුන් වහන්සේලා ඉන්න තැන බැලුවොත් පුදුම අල්ලගැනීමක් තමයි අල්ලගෙන තියෙන්නෙ. ජාති භේදය, කුල භේදය, ආගම් භේදය මේ හැම භේදයක්ම අල්ලගෙන කපා කොටා ගන්න, මරා ගන්න යනවා. සමහර හාමුදුරුවරු - හාමුදුරුවරුම බැන ගන්නවා, ගහ මරා ගන්නවා. ඇත්තක් කිව්වට පිළිගන්නෙ නෑ. මධ්‍යස්ථ හිතකින් බලන්නෙ නෑ. දෘෂ්ටිගත වෙලාමයි ඉන්නෙ. ඉතින් මේක මොන බුද්ධ දේශනාවටද ගලපන්න පුළුවන්? එහෙම ගිහින් අන්තිම මොහොත වෙනකල්ම වෙනත් හාමුදුරු නමකට පන්සල දෙන්නෙත් නෑ. ඒකත් අල්ලගෙන බදාගෙන. සිහි නැති වුණාටත් පස්සෙ තමයි දෙවෙනි වතාවට පන්සල දෙන්නෙ. ඒත් දෙනව නෙවෙයි නොදී බැරිකමට දෙන්න වෙනවා. මේ තමයි අද බොහෝ තැන්වල තියෙන තත්ත්වය. ඉතින් එතකොට කෝ අනිච්ච, දුක්ඛ, අනත්ත වැටහිලාද? අනිත්‍යයි, දුක්ඛයි, අනාත්මයි කිව්වට වැටහිච්ච නැති නිසයි එහෙම වෙලා තියෙන්නෙ. අදහස හරියට වැටහුණා නම්, ඒකාන්තයෙන්ම අසාර ලෝකෙ මොනව අල්ලගන්නද කියල එතනින්ම දෘෂ්ටිය අත හැරෙනවා. ඒක සිහි කරන කොටම එනවා. ඒකෙන් පුදුම විදිහෙ නිවීමකට පත් වෙනවා. ඉතින් ඒකට මධ්‍යස්ථ හිතකින්, හරි දහම දකින්න ඕන. ඒ කවුරුවත් කියන නිසා ඒක අහල නෙවෙයි, තමන්ටම වැටහෙන නිසා.

හැබැයි **පාළි භාෂාව දැනගත්තු පලියට, ඒක සිංහලට පරිවර්තනය කරන්න පුළුවන් වෙච්ච පලියට මේ දහම තෝර ගන්න බෑ. ඒකට අත්ථ, ධම්ම, නිරුක්ති, පටිභාන කියන සිවුපිළිසිඹියා නුවණ අවශ්‍යයි.** මොකද අද තියෙන භාෂාව කියන එක සමාජයේ ජීවත් වෙන්න හදාගත්තු එකක්. පාළිවලින් පරතෙරට ගියපු කෙනෙකුටවත් පාළි ත්‍රිපිටකයේ අර්ථ තෝර ගන්න බෑ. උදාහරණ විදිහට ''ආරෝග්‍යා පරමා ලාභා'' කිව්ව ගමන්ම පාළි භාෂාවෙන් පරතෙරට ගියපු කෙනෙක් ඒක කොහොමද තෝරන්නෙ? ''නිරෝගිකම පරම ලාභයයි''. ඔයිට වඩා එහාට දෙයක් තෝරන්න දන්නෙ නෑ. එහෙම තෝරන්න නම් ඒකට සිවු පිළිසිඹියාව අවශ්‍යයි. එතකොට බුදුන් වහන්සේ මේකෙන් අදහස් කළේ මොකක්ද කියල හෙව්වෙ නැත්නම්, මාගන්ඩි සූත්‍රය බලල කිව්වත් මේ පාළි පාඨය භාෂා රීතියෙන් තෝරන්න බෑ. මොකද ඔයිට වඩා එහාට ගිය අර්ථයක් භාෂා රීතියෙන් දෙන්න විදියක් නෑ. නමුත් බුදුන් වහන්සේ ඒකට දුන්නු උත්තරය මීට හාත්පසින්ම වෙනස්. (මේ පිළිබඳව මේ දහම් සඟරාවේ 3 වන කලාපයේ පළ වූ ''බුද්ධ භාෂිත මාගධී ප්‍රාකෘත ව්‍යවහාරය අද අර්ථ විපරීතයන්ට ලක්ව ඇති හැටි'' ලිපියෙන් ඉදිරිපත් කරල තියෙනවා.)

ඊළඟට අම්ම මරල, තාත්ත මරල රජ වෙන්න කියල ගාථාවක් ත්‍රිපිටකයේ ඛුද්දක නිකායේ ධම්ම පද ප්‍රකීර්ණක වග්ගයේ මේ විදියට තියෙනවා. හැබැයි ඒ තියෙන්නෙ නෙයියාර්ථයෙන්.

මාතරං පිතරං හන්ත්වා  
- රාජානෝ ද්වේ ච ඛත්තියෙ  
වෙයියග්ග පඤ්චමං සොත්තියෙ  
- අනීඝෝ යාති බ්‍රාහ්මණෝ

ඒ අනුව අම්ම නමැති තණ්හාව, තාත්ත නමැති මානය, සාස්වත හා උච්ඡේද දෘෂ්ටිය නම් බමුණු රජවරු දෙදෙනත් විනාශ කරල, නීවරණ ධර්ම දුරු කරල දුකක් නැති නිවනට පත් වෙන්න කියන එකයි මේ කිව්වෙ. දැන් මේ ගාථාව පාළියෙන් තියෙන්නෙ. වෙලාවට සිංහල පරිවර්තනයත් තියෙන නිසා හොඳයි. නමුත් බැරිවෙලා හරි පාළි භාෂාව පරතෙරට ගියපු කෙනෙක් මේක තෝරන්න ගිහින් මේ ගාථාව නීථාර්ථයෙන් දුන්නනම් එහෙම මොකක් වෙයිද? මුළු බුදු දහමම ඉවරයි. අම්ම තාත්ත මරල රජකම ගන්න කියයි. මේ වගේ දේවල්වලට භාෂා විශාරදයන්ට උත්තර නෑ. ඒ අය

මොනව කියන්නද? ඉතින් උත්තර දෙන්න බැරිවුනාම කියනව, ඕක පස්සෙ විකෘති කරන්න එකතු කරපු එකක් කියල. නමුත් මෙතන පෙන්වල තියෙන්නෙ නෙයියාර්ථයෙන්, සැඟවුණු අදහස.

ඒ වගේම 5 ක් සිඳින්න 5 ක් වඩන්න කියල කිව්වම ඒක මොකක්ද කියල වෙනම තෝර ගන්න ඕන. සංයුක්ත නිකායේ කොටස් වශයෙන් ඒ විදියට කරපු දේශනාවන් තියෙනවා. එතකොට මේ කියන්නෙ නීවරණ පහ බිඳින්න කියන එක. ඒ වගේම ශ්‍රද්ධා, සීල, සති, සමාධි, ප්‍රඥා වඩන්න කියන එක. එතකොට ඒක වෙනම දැන ගන්න ඕන. නමුත් ඒක භාෂාවෙන් ගන්න බෑ. මේ වගේ භාෂා රීතිවලින් අර්ථ තෝර ගන්න බැරි ගාථා බොහොමයක් ත්‍රිපිටකයේ තියෙනවා. අදහස වෙනස් කළොත් එහෙම භාෂා රීතිවලින් අර්ථ ගන්න බෑ. භාෂාවෙ අරුත්වලින්, පදවලින් සැඟවුණු දහම් අදහස් ගන්න බෑ. එහෙම ගන්න ගියොත් ඒක නිකං වචන හරඹයක් විතරයි. අර්ථ දෙන්න බෑ. අර්ථ දෙන්න ගියොත් සම්පූර්ණයෙන්ම නෙයියාර්ථ වෙනවා. මොකද නීථාර්ථ, නෙයියාර්ථ කියල 2 ක් තියෙනවා. නීථාර්ථ වශයෙන් දුන්න එකක් නෙයියාර්ථයෙනුත්, නෙයියාර්ථ වශයෙන් දුන්න එකක් නීථාර්ථයෙනුත් කවුරුහරි දෙනව නම්, ඒක බුදුන් වහන්සේට කරන අපහාසයක්, ධර්ම විකෘතියක් කියල ධර්මයේම සඳහන් වෙනවා.

දැන් මේ වගේ නෙයියාර්ථයෙන් දෙන අදහස් අදත් සමාජයේ ඕන තරම් තියෙනවා. සමහර නෙයියාර්ථයන් ගත්තම ඒවා අවුරුදු 40 - 50 කට උඩ දී අපේ සමාජයේ තිබිච්ච අර්ථයෙන් නෙවෙයි අද භාවිතා කරන්නෙ. අද ඒක වෙන අදහසක් දෙන්න පාවිච්චි කරනවා. ඒ කියන්නෙ පස්සෙ කාලෙක අර්ථ විපරීත වෙලා. ඉතින් එදා තිබිච්ච ඒ සමහර වචන අද ඒ විදියටම දාල කියන්න බෑ. මොකද කිව්වොත් අහන අය ඒකට වෙනම අදහසක් ගන්නෙ. ඉතින් මේ අවුරුදු 40 - 50 කටත් වචනවල අදහස් පරිවර්තනය එහෙම නම්, මේ අවුරුදු 1,000 කටත් එහා ඉඳල එන භාෂාවක පරිවර්තන කොච්චර වෙනස් වෙලා ඇත්ද ? එතකොට භාෂා රීති ඉගෙන ගත්තු කෙනෙක් කොහොමද කියන්නෙ, මෙන්න මේකයි මේ වචනෙ අදහස කියල. අන්න ඒ වෙලාවට තමයි අර සතර මහාපදේශ අවශ්‍ය වෙන්නෙ.

**නෙයියාර්ථය කියන්නෙ යමක සැඟවුණ අදහස. නීථාර්ථය කියන්නෙ වචනයෙන්ම කියපු අදහස, ඒකෙ මූලික අර්ථය. ඒ කියන්නේ බැලූ බැල්මටම පිටින් අර්ථය පේන්න තියෙනවා. එල්ල කරලම කෙලින්ම අර්ථය කියල තියෙනවා.** කාගෙන්වත් අහන්න ඕන නෑ. උදාහරණ විදියට බුදුන් වහන්සේ මංගල කරුණු 38 ක් දේශනා කරල තියෙනවා. ඒකෙ නෙයියාර්ථ නෑ. එල්ල කරලම දීල තියෙනවා. ස්වභාවික අර්ථමයි තියෙන්නෙ. එතකොට මේ කියන නීථාර්ථ හා නෙයියාර්ථ කියන 2 ම බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ නිසා තමයි මේ 2 ම වෙනස් කරන්න යන්න එපා කියල කිව්වෙ. නෙයියාර්ථය නෙයියාර්ථය වශයෙන්ම තේරුම් ගන්න ඕන. නීථාර්ථය නීථාර්ථය වශයෙන්ම තේරුම් ගන්න ඕන. නමුත් සමහර උදවිය පණ්ඩිතකමට නීථාර්ථයන්ට නෙයියාර්ථ දෙනවා. ඔක්කොම නෙයියාර්ථ කරන්න ගිහින් ඒකෙන් අන්තිමට ධර්මය විකෘති වෙනවා. මේ වගේ තවමත් හොයා ගන්න බැරි තැන් ත්‍රිපිටකයේ තියෙනවා.

උදාහරණ විදියට භික්ෂුන් වහන්සේලාට නාන සළුව (වැසි සළුව) අනුදැන වදාරන්න කියපු කතාව චුල්ල වග්ග පාළියේ විග්‍රහ කරන කොට පෙන්වා තියෙනවා, ස්වාමීණී අද නම් මහ වැස්ස හැම තැනටම වහිනව කියල. එතකොට බුදුන් වහන්සේ දේශනා කරනවා, අද නම් හතර දිවයිනටම එකවරම වහිනවා, නිරුවත්ව එළියට බැහැල නාගන්න, සුද්ධ වෙන්න පුළුවන් කියල. දැන් මේ කිව්වෙ නෙයියාර්ථයෙන්. නමුත් භික්ෂුණ් වහන්සේලා ඒක නීථාර්ථයක් කියල හිතාගෙන සිවුරු ගලවල දාල නිරුවත්ව නැවා. මේ වෙලාවෙදි විශාඛා උපාසිකාවගේ දානයක් තිබුණා. ඒ නිසා පුණ්ණාදාසිව ජේතවනාරාමෙට යැව්වා, හාමුදුරුවන්ට දැනුම් දෙන්න දානය ලෑස්ති කරල තියෙන්නෙ, කල් ඇතිව වඩින්න කියල. පුණ්ණාදාසි යන කොට ඔක්කොම හාමුදුරුවරු නිරුවත්ව නානවලු. පස්සෙ ඇය විශාඛාවට ගිහින් කිව්ව, හාමුදුරුවරු කවුරුවත් නෑ නිගණ්ඨයො ගොඩක් නම් ඉන්නව කියල. නමුත් විශාඛාව තේරුම් ගත්ත මොකක් හරි වැරදීමක් වෙලා තියෙන්නෙ කියල. ඒ නිසා අර දාසියව නැවතත් යැව්වා, දැන් ගිහින් බලන්න අර හාමුදුරුවරු ඇති කියල. ගිහින් බලන කොට ඔක්කොම සිවුරු ඇඳගෙන හිටියලු. පස්සෙ දානෙට ආරාධනා කළා. එදා හවස විශාඛාව බුදුන් වහන්සේගෙන් ඉල්ලා හිටියා, මේ භික්ෂුණ් වහන්සේලාගෙ චරිතයට නිරුවත්ව නාන එක ගැළපෙන්නෙ නෑ, ඒ නිසා වැසි සළුවක් අනුදැන වදාරන්න කියල. ඉතින් උන් වහන්සේ භික්ෂුණ් වහන්සේලාට නානකොට වැසි සළු අනුදැන වැදැරුවා.

නමුත් මේ වෙච්ච සිද්ධියට හේතුව මොකක්ද කියන එක එළිදක්වපු තැනක් නෑ. නිරුවත්ව නාන්න කිව්වෙ මොකක්ද? මොකටද? රැවටිච්ච එක මොකක්ද? ... මේ ආදී කාරණා තෝරල නෑ. **හතර දිවයිනටම වහිනවා නිරුවත්ව ගිහින් නාගන්න, සුද්ධ වෙනව කියල බුදුන් වහන්සේ කිව්වෙ මොකක්ද?** දහම් වැටහීමක් තියෙන ඥානවන්තයෙකුට නම් තේරෙනවා මොකක්ද මේ කිව්වෙ කියල. ඒක නෙයියාර්ථයක්. නමුත් දහම් වැටහීමක් නැති කෙනාට ඕක තෝර ගන්න බෑ. මොකද එහෙම එකක් පොතේ කියල නැති නිසා. ඒ නිසා අර භෞතික සිදුවීම ඒ අර්ථයෙන්ම ගන්නවා. ඇත්තටම නිරුවත්ව නාපු එකේ අවස්ථා සම්බන්ධය දන්නෙ නෑ.

මේ සදහම් අමා වරුසාව ගැනයි කියන්නෙ. ඒකට නිරුවත්ව නාගන්න කිව්වෙ හිතේ තියෙන පංච නීවරණ අයින් කරල, සාවදානව අහගෙන ඉන්න කියන එක. සුද්ධ වෙන්නයි කිව්වෙ ඒ දහම් දේශනාවට සවන් දුන්නම කෙළෙස් දුරු වෙලා, මග ඵල අවබෝධ වෙලා, නිවන් ශාන්තිය උදා වෙනවයි කියන එක. මේ තමයි ඒකෙන් පෙන්වපු නෙයියාර්ථය. ඉතින් මේක තෝර ගන්න බැරුව, බුදුන් වහන්සේ නමක් පහළ වෙලා ධර්මය දේශනා කරන කොට, හතර දිවයිනටම භෞතිකව වහින දවසක් එනව කියල තවමත් විශ්වාස කරනවා. නමුත් මොලේ තියෙනව නම් පොඩ්ඩක් හිතන්න ඕන, බුදුන් වහන්සේ භික්ෂුණ් වහන්සේලාට නිරුවත්ව නාගන්න කියල උපදෙස් දෙයිද? ඒ වගේ නිගණ්ඨ චාරිත්‍රයක් උන් වහන්සේ අනුදැන වදාරයිද? වැස්සට නැව කියල එහෙම කෙළෙස් සුද්ධ වෙන ක්‍රමයක් බුදු දහම තුළ තියෙනවද? නමුත් මේ කාරණය අද වෙනකල්ම දන්නෙ නෑ. අද හිතන් ඉන්නෙත් එදා හතර දිවයිනටම වැස්සක් වහින කොට ඒකට සිවුරු නැතුව නැවොත් සුද්ධ වෙනව කියල බුදුන් වහන්සේ නීථාර්ථයෙන්ම දේශනා කළා කියල. ඉතින් සිංහල පරිවර්තනයෙ තියෙන්නෙත් ඒක වෙච්ච හැටියට තමයි. ඒ හේතුව නිසා වැසි සළු පළඳින්න අනුදැන වදාළ හැටියට තමයි පෙන්නන්නෙ. අදටත්, ඇත්තටම බුදුන් වහන්සේ එදා එහෙම දෙයක් කිව්වයි කියල තමයි හිතන් ඉන්නෙ. ඒක නෙයියාර්ථයෙන් කිව්ව කියල තවමත් පිළිගන්නෙ නෑ. නීථාර්ථයක් හැටියටමයි හිතන් ඉන්නෙ. දැන් ඉතින් මේ වගේ දේවල් තෝර ගන්න බැරුව කොහොම නිවන් දකින්නද?

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

**අභයරතනාලංකාරය - 24**

# විශ්වය තුළ බුද්ධ ශක්තිය තවමත් නොඅඩුව පවතින බවට සාක්ෂි



**- වහරක අභයරතනාලංකාර හිමි**

*(පසුගිය කලාපයෙන් - ඇස්වහ කටවහ සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම් කිහිපයක්.......)*

ලෝක විනාසය ගැන පසුගිය කාලය තරම් කතා බහ වෙච්ච තවත් කාලයක් නැති තරම්. පසුගිය අවුරුදු කිහිපය පුරාවටම ලෝකයේ හැම තැනම වරින් වර රැව් දුන් මේ ආන්දෝලනාත්මක කතාව 2012 වසරේ වඩාත් උණුසුම් අන්දමින් කතා බහට ලක් වුණා. ඒකට හේතුව වුනේ 2012.12.21 වන දින මේ ලෝකයේ අවසානය සනිටුහන් වෙන බවට විවිධ පැතිකඩවල් ඔස්සේ කරුණු කාරණා එළි දක්වීම. විශේෂයෙන් දීර්ඝ ඉතිහාසයක් තියෙන මායාවරුන්ගේ පටන්, එදා හිටපු දාර්ශනිකයන්ගේ අදහස්වලින් කල එළි බැහැපු මේ කතාව නක්ෂත්‍ර විද්‍යාව හරහාත්, නවීන විද්‍යාව හරහාත් වඩාත් උණුසුම් අන්දමින් කතා බහ වුණා. තණ්හාවෙන්, ආශාවෙන් ලෝකය අසීමිතව බදාගන්න යෑමේ ප්‍රතිඵලයක් විදියට මනුස්සයා සෑහෙන නීච තත්ත්වයකට මේ වෙන කොටත් පත්ව සිටීම නිසා, ලෞකික වශයෙන් හෝ ආගම දහම අදහන පිංවත් පිරිස් පවා මේ කතාව යම් පමණකට විශ්වාස කළා. ඒත් එක්කම ලෝක විනාසය ගැන කියවෙන මහා පරිමාණ චිත්‍රපට, පර්යේෂණ කෘති, නිබන්ධන, පුවත්පත් සඟරා සහ විවිධ ලෞකික විද්‍යාවන් හරහා කෙරුණු සංවාදයන්ගෙත් වැඩිවීමක් තිබුණා. එහෙම විනාසයක් සිදු නොවන බව නක්ෂත්‍ර විද්‍යාව පැත්තෙන් ප්‍රකාශ කරපු උදවියත් හිටියා. නමුත් දහමට අනුව ගැඹුරු හේතු පැහැදිලි කිරීමක් ඒවායේ තිබුණෙ නෑ.

කොහොම හරි මේ විදියට සමාජයේ විවිධ පැතිකඩවල්වලින් නැගිච්ච ලෝක විනාසය ගැන කියවුනු මේ දත්තයන් නම් බොරු නෙවෙයි. මොකද ගින්නක් නැතිව දුමක් නගින්නෙත් නෑ. විශේෂයෙන් යම් කිසි ලෞකික ඥාන ශක්තියක් තිබිච්ච එදා හිටපු මායාවරුන්, මේ කාලයේ සිදුවන යම් කිසි යුග නිමාවක් ඔවුන්ගේ දාර්ශනික ශක්තියෙන් සටහන් කරල තිබුණා. ඒ වගේ **මේ හැමෝම ලෝක විනාසයක් ගැන අනාවැකි පළ කළේ බොරුවට නෙවෙයි, එහෙම දත්ත ටිකක් මේ මනුස්සයින්ටත් ගෝචර වෙච්ච නිසා.** නමුත් කවුරුවත් නොදැකපු පැත්තකුත් මේ වෙද්දි ක්‍රියාත්මක වුණා. කවුරුවත් නොදැක්කයි කියල කිව්වට අධ්‍යාත්මික ශක්තිය දියුණු කරපු උදවිය හිටිය නම් ඒක යම් ආකාරයකින් දකින්නත් ඇති. ඒ තමයි මේ ලෝක විනාසය අන්තිම මොහොතේ හෝ යම් ගුප්ත ශක්තියක් ක්‍රියාත්මක වෙලා නතර වෙන බව. කොහොම හරි 2012.12.21 දවස සුපුරුදු පරිදි ගෙවිල ගියා. ලෝක විනාසය ගැන කතා බහත් එතනින්ම යට ගියා. ඊට පස්සෙ ඒ පිළිබඳව කවුරුවත් ප්‍රසිද්ධියේ අදහස් දක්වන්න ගියේ නෑ. මොකද ඒකට පරිපූර්ණ හේතු දක්වන්න තරම් සාධක විද්‍යමානව තිබුනෙ නෑ. මේ ඒ පිළිබඳව වහරක අභයරතනාලංකාර හිමියන් සමාධියෙන් දැකපු හේතු සහිත සත්‍ය අත්දැකීමක් තමයි අද අභයරතනාලංකාරය තුළින් ඉදිරිපත් කරන්නෙ.

ලෝකයේ යම් කිසි නාම රූප නිපදවීමක් සිද්ධ වෙනව වගේම, ලොවුතුරා බුදුන් වහන්සේලාට යමක් අධිෂ්ඨාන කරල යම් කිසි ශක්තියක් නිපදවන්න පුළුවන්. **බුදුන් වහන්සේලාගේ සියලු අදිටන්, මේ සියලු ලෝක සත්වයෝ කවද හරි නිවන් සාක්ෂාත් කරල පූර්ණ කරත්වා කියන මහා කාරුණික චින්තනයෙන් තමයි අවසන් වෙන්නෙ.** එතකොට එක සත්වයෙක්වත් අඩු කරල මෙත් පතුරුවල නෑ. ඒ කියන්නෙ එක සත්ව කොටසකට විතරක් නිවන් අවබෝධ කරන්න ලැබෙත්වා කියල සීමා කරන මානසිකත්වයක් බුදුන් වහන්සේලාට නෑ. ඒ පතුරුවන මෙත කවද හරි ක්‍රියාත්මක වෙලා අවසන් වෙන්නෙ, සියලු සත්වයෝ නිවන් අවබෝධ කරපු දවසට. එහෙනම් උන් වහන්සේලාගේ මහා කරුණාව කියන ගුණය අප්‍රමාණයි. ඒ අප්‍රමාණ මහා කරුණාවට සියලු ලෝකවල ඉන්න සියලු සත්වයෝම ගෝචර වෙනවා. කොහේ හිටියත්, අනේ කවද හරි මේ සත්වයෝ සසර දුකින් නිදහස් වෙත්වා කියන කරුණා මෛත්‍රී උපරිම හැඟීමකින් තමයි උන් වහන්සේලාගේ මානසික ශක්තිය විහිදෙන්නෙ. එහෙනම් ඒ ශක්තිය අප්‍රමාණව විහිදවන්නෙ, කවද හරි සියලු සත්වයෝ නිවන් දැකල ඉවර වෙන කල්ම පිහිටන ශක්තියක් විදියට. බුදුන් වහන්සේලාගේ ශරීර ස්කන්ධය පරිනිර්වාණය වුනාට ශක්ති පරිනිර්වාණයක් වෙන්නෙ නෑ. ඒ නිසා ඒ පිහිටවපු අප්‍රමාණ ශක්තිය විශ්වයේ ක්‍රියාත්මක වෙනවා. කෙනෙකුට කරදරයක් නොවේවා, විපතක් නොවේවා.... ආදී වශයෙන් කියල විශේෂයෙන්, තථාගතං අරහන්තං චන්දිමා සරණං ගතෝ... ආදී වශයෙන් චන්ද්‍ර සූර්ය පිරිතෙදි පෙන්වන්නෙත් බුදුන් වහන්සේ කරුණා මෛත්‍රිය සහිතයි, චන්ද්‍ර දිව්‍ය පුත්‍රයා ආර්ය පුද්ගලයෙක්, ඒ නිසා කරදර හිරිහැර කරන්න එපා, ඉවත් වෙයන් කියල උන් වහන්සේම රාහු අසුරයට කරපු ප්‍රකාශයක්. ඒ වගේ, කෙනෙකුට කරදරයක් කරන්න එපා කියන හැඟීම තමයි බුදුන් වහන්සේලා ලෝකයට දීල තියෙන්නෙ.

හැබැයි යම්කිසි පුද්ගලයෙක් තමන්ගෙ මනසින් මේ කියන ත්‍රිවිධ රත්නයේ ගුණයන්ට ඇතුල් වුනොත් තමයි ඒ පුද්ගලයට ඒ ශක්තිය ලැබෙන්නෙ. ඒක ගැලපෙන්න නම්, එහෙම ගුණ මාත්‍රයක් හරි සම්බන්ධ වෙන්න ඕන. උදාහරණ විදියට මුහුදෙ වතුර කොච්චර තිබුණත් අපට ලුණු රස දැනෙන්නෙ නෑ. ලුණු රස දැනෙන්න නම් පොඩි ක්‍රියාවලියක් කරන්න ඕන. මුහුදෙන් ලුණු වතුර බිංදුවක් කට ගාල බැලුව නම් ලුණු රස වැටහෙනවා. හැබැයි ඒ ටික නොකර නිකම් බලාගෙන හිටියට මුහුදෙ ලුණු රස දැනෙන්නෙ නෑ. කොච්චර වතුර තිබුණත් වැඩක් නෑ. ඒකෙනුත් ඔක්කොම වතුර බොන්න ඕන නෑ. ☞

වතුර බිංදුවක් විතරයි ඕන. වතුර බිංදු අනන්තව තිබුණත් ලුණු රස දැනගන්න ඒ එක බිංදුවක් ප්‍රමාණවත්.

මේ වගේ තමයි බුදු ගුණවල ශක්තිය දැන ගන්න බුදු ගුණයට නැඹුරු වෙන්න ඕන. එහෙම නැඹුරු වෙච්ච කෙනෙකුට මේකෙ වෙනස්කම් පේනවා. ඒකෙන් කෙරෙන කටයුතු, ආරක්ෂණ එන හැටි.... ආදිය බලාගන්න යොමු වුනොත් බුද්ධ ශ්‍රේෂ්ඨත්වය දකින සමාධිය වැඩෙනවා. ඒ ඒ සමාධි වැඩිච්ච හැටියට බුද්ධ ශ්‍රේෂ්ඨත්වය යම් ප්‍රමාණයක් දකින්න පුළුවන්. ඒක මනසට ගෝචර වෙන දෙයක්. ලොවුතුරා බුදුවරයන් වහන්සේ නමකගේ ශක්තිය කොහොමද කියල සියලු ආකාරයෙන්ම දකින්නෙ තවත් ලොවුතුරා බුදුවරයන් වහන්සේ නමක් විතරමයි. ඒක කියල ඉවර කරන්න නම් බෑ. ඒ බුදු මග අනුගමනය කරන අයට, බුද්ධ ශ්‍රේෂ්ඨත්වය පිළිගත්තු අයට එයින් කෙරෙන යම් යම් මට්ටම් පේනවා. එහෙම පෙනිච්ච මට්ටමකින් මගේ සමාධියට හසුවෙච්ච දෙයක් තමයි මේ කියන්න යන්නෙ.

දිනය 2012.12.12. එදා මාසෙ පෝය දවසක්. පෙහෙවස් සමාදන් වෙච්ච පිංවතුන්ටත්, අනෙකුත් පිංවතුන්ටත් දහම් දේශනා කරල ඒ දවසේ අවසාන කටයුත්ත හැටියට තිබුනෙ මහා පිං අනුමෝදනාව සිද්ධ කරන්න. ඒ පිං අනුමෝදනාව කරන අවස්ථාවක තමයි මේ සිද්ධිය සමාධියට නැගිල ආවෙ. මේ වෙන කොට 2012.12.21 දිනට සිද්ධ වෙන්න තිබිච්ච ලෝක විනාසයක ක්‍රියාවලියත් ඒ විදියටම සිද්ධ වෙමින් තිබුණා. විශ්ව කම්පනයක් වෙන ලකුණු තමයි ක්‍රියාත්මක වුණේ. නමුත් ඒ ක්‍රියාත්මක වෙන වෙලාවෙදි **විශ්වයට එන විනාසකාරී බලවේග සම්පූර්ණයෙන්ම නතර කරන්න, බුදුන් වහන්සේගේ ශ්‍රී හස්තය මැවිල විශ්වයේ හැම තැනම විහිදිලා පිහිටියා.** මේ වගේ අවස්ථාවක් නිකම්ම පිහිටන්නෙත් නෑ. සමහර වෙලාවට අපි පිහිටක් බලාපොරොත්තු වෙන වෙලාවක ඒ ශක්තිය ඇදිල එනවා. එහෙම නැතිව නිකම්ම හැදිච්ච ශක්තියක් කොහෙවත් නෑ. නමුත් අපි බලාපොරොත්තු වෙනව නම්, අනේ බුද්ධ ශ්‍රේෂ්ඨත්වයෙන් අපට පිළිසරණ වේවා කියල, එහෙම අධිෂ්ඨානයක් කළොත් අර ශ්‍රේෂ්ඨත්වය ඇදල එනවා. හැබැයි එහෙම එන කෙනෙක් නෑ. පිහිටුවල තියෙන ගුණයෙන් තමයි ඒ ජාතියෙ යහපතක් වෙන්නෙ. ඒ නිසා ඒ ගුණය සිහි කරල, අනේ අපට මෙහෙම යහපත වේවා කියල අධිෂ්ඨාන කරන කොටම, ඒ යහපත නිර්මාණය වෙලා එන ක්‍රමයක් තියෙනවා. එහෙම බුද්ධ ශක්තියක් තියෙන නිසා තමයි ඒක සිද්ධ වෙන්නෙ. ඒ ශක්තිය ඇදිල ඇවිත් අවශ්‍ය දේ නිර්මාණය කරල දෙනවා. එහෙම වෙච්ච සිදුවීමක් තමයි සමාධියට දර්ශනය වුණේ. එදා නිර්මාණය වෙච්ච ශ්‍රී හස්තය අපි දැන් මේ වෙනම දකිනව වගේ ශ්‍රී හස්තයක්. ඒ කියන්නෙ බුදුන් වහන්සේගෙ ශ්‍රී හස්තය මහ පටඟිල්ලයි, දබරැඟිල්ලයි එකට ළං කරල, අනිත් ඇඟිලි තුන දික් කරල දේශනා කරන ස්වභාවයෙන් තමයි දර්ශනය වුණේ. ඒ දේශනා ස්වභාවයෙන්ම අනන්ත ආකාසයට අත දික් කරල තියෙන ආකාරයක් දිස් වුණා. ඒ වගේම ඒ ශ්‍රී හස්තය ආකාසයේ නැති තැනක් නෑ. බලපු හැම තැනම ඒ ශ්‍රී හස්ත දකින්න ලැබුණා. එක ශ්‍රී හස්තයක් විතරක් නෙවෙයි. ඒ වගේ කෝටි ප්‍රකෝටි ගණනක්. ඒක සමාධියට



හොඳට පෙනුණා. කොයි පැත්තෙන් බැලුවත් ඒ හැම පැත්තෙන්ම ආරක්ෂණය තමයි පෙනුණෙ. බලපු හැම පැත්තෙන්ම ශ්‍රී හස්තයක් ආරක්ෂණ වෙලා පෙනුණා. ඒ ශ්‍රී හස්තයෙන් මෙහාට කිසිම විසක් එන්නෙ නෑ.

දැන් මේ දර්ශනය විනාඩි ගණනක බොහොම සුළු වෙලාවක් තමයි පෙනුණෙ. ඒ කියන්නෙ ආශිර්වාදය, ආරක්ෂණය කාව්‍යමය ස්වරූපයෙන් ඉල්ලන කොටම දර්ශන මාත්‍රයකින් ඒක පෙන්නුම් කළා. බුදුන් වහන්සේගෙ ශ්‍රී හස්තය මැවිල ලෝකයට ආරක්ෂණය සැලසෙන්න කියල තමයි ඒ ඉල්ලීම සමාධියටම නැගිල ආවෙ. ඒ ඉල්ලා හිටීමත් එක්කම තමයි මේ ශ්‍රී හස්තය නිර්මාණය වුණේ. ඒ ඉල්ලීමත් හිතාමතාම කළා නෙවෙයි, සමාධියෙන්මයි නැගුණෙ. ඉල්ලන්නෙ නැතිව නැගුණත් නෙවෙයි. ඒකට අවශ්‍ය දේ කවියෙන් සමාධියට නැගුණා. කෙටියෙන් කියනව නම් අප්‍රමාණ බුද්ධ ශක්තියෙන් මේ ලෝකෙට ආරක්ෂණය වේවා කියල. මේ තියෙන්නෙ එදා සමාධියට කාව්‍යමය ස්වරූපයෙන් නැගුනු ඒ ඉල්ලීම.

සම්බුදු සිරි හස්තය ගෙන මවනෙමි
සියලුම සක්වල විහිදා තබනෙමි
සියලුම සත හට වින දොස නසනෙමි
සම්බුදු මහ බල පතුරා හරිනෙමි

සියලුම සක්වල වට කර තිබෙනා
සම්බුදු ආසිරි බල සෙත් වරුණා
සියලුම සත හට විහිදා තැබුණා
සියලුම වින දොස දුරු කර හැරුණා

සම්බුදු ආසිරි බල විහිදේවා
මහ සිරි හස්තය සියලු මැවේවා
දස දහසක් සක්වල වට වේවා
සැම තැන ආසිරි බුදු රැස් වේවා

සවනක් ඝන මහ බුදු රැස් සිරසෙන
විහිදී පැතිරී සවනක් ඝන දෙන
මහ සත් ආසිරි බල මහිමය ගෙන
සක්වල ආරක්ෂණය වේවා යන

අදිටන අරගෙන මුනි රජිඳුන්නේ
බල අදිටන ගෙන මෙලෙස තබන්නේ
සක්වල වට කර වින වනසන්නේ
සම්බුදු ආසිරි බල පිහිටන්නේ

සියලුම සක්වල වට කර විහිදෙන
දොසක් නොවන ලෙස මහ සත් බලයෙන
අද මේ අදිටන බුදු රැස් බලයෙන
තබනෙමි සියලුම සක්වල වටගෙන

සියලුම සැම දොස් දුරු කර යාවා
සම්බුදු ආසිරි බල පිහිටාවා
සූවිසි මහ ගුණ බල සිහි වේවා
සියලුම සක්වල වින වැනසේවා

සම්බුදු ආසිරි සත් බල අරගෙන
සියලුම සක්වල පිහිටා මෙලෙසින
සම්බුදු සදහම් මහ සඟ කියවන
සිරි සත් බල මහිමය ගෙන විහිදෙන

සියලුම සක්වල වට කර තිබෙනා
වින දොස් දුරු කර මේ සෙත් වරුණා
පිහිටා සියලුම ආරක්ෂණයෙනා
සැමටම සෙත වේවා බුදු සරණා

සැම තැන සම්බුදු සරණය වේවා
අට විසි මුනි රජ බල පිහිටාවා
සක්වල වට කර බල සෙත වේවා
සැම දොස් දුරු කර සෙත සැලසේවා

සියලුම සක්වල අද සිට කිසි තැන
දස දහසක් සක්වල වට කර ගෙන
අණවින බන්ධන සුන් කර හරිමින
මේ සෙත තබනෙමි බුදු රැස් බලයෙන

සම්බුදු සිරි හස්තය ගෙන මැවිලා
විහිදී සියලුම සක්වල වටලා
මහ රැකවරණය වේවා කියලා
අදිටන් තබලා ඈත ලොව සකලා

සියලුම සත හට වින දුරු වේවා
අණවින බන්ධන සැම වැනසේවා
රැකවරණය බුදු සරණින් වේවා
ජයසිරි මහ බෝ රැකවරණේවා

මහ රැකවරණය විහිදී සැම තැන
අපමණ සක්වල විහිදෙන බුදු ගුණ
දස මර සෙන් පැරදුව බුදු බල ගෙන
විහිදා හරිනෙමි අද රැස් කරගෙන

සියලුම සක්වල වට විහිදේවා
මහ රැකවරණය මුනිඳු දෙවාවා
මුනිඳුගෙ බල ශක්තිය පිහිටාවා
රැකවරණයි සත සැමටම වේවා ....

මේ විදියට ඉල්ලා හිටීමක් සමාධියට නැගිල එන්නත් හේතු වුනේ, ඒ වෙන කොට රටේ ලෝකෙ තිබ්බච ආන්දෝලනාත්මක තත්ත්වය. ඒ ආන්දෝලනයත් එක්කම ලෝකයට මොනව හරි විනාසයක් වෙන ලකුණුත් තිබුණා. ඒ විශ්ව කම්පනයක් සිද්ධ වෙන ලකුණු. විශ්වය එක පාරටම ක්‍රියාත්මක වෙලා උතුරු ධ්‍රැවයේ දෙපැත්තට, ලෝක ගෝලය එක පැත්තක ඉඳන් අනෙක් පැත්තට දෝලනය වෙලා නැවතත් අනෙක් පැත්තට හැරීමක් සිද්ධ වෙනවා. මේ විදියට ගිහින් ආපසු හැරෙන මොහොතෙදි තමයි ඒ විශාල කම්පනය ඇති වෙන්නෙ.

උදාහරණයකින් පහදනව නම්, මෝටර් රථයක් පැයට කිලෝ මීටර් 80 ක විතර වේගයකින් ගිහින්, ගහෙන් ගෙඩි එන්න වගේ එක පාරටම තිරිංග තද කළොත් කැරකිලා විසි වෙනව වගේ දෙයක් තමයි මේ ලෝකයටත් සිද්ධ වෙන්න තිබුණෙ. එහෙම එක පාරටම තිරිංග තද කරන්නෙ නැතිව හිමින් සීරුවේ අඩු කර ගෙන ගියොත් තමයි ඇඟට වෙහෙසක්, කම්පනයක් නැතුව ගමන යන්න පුළුවන් වෙන්නෙ. මෙහෙම වේගෙන් යන කොට නැවතත් ආපස්සට එන්න ඕන නම් තිරිංග පාර ගහල, යන වේගෙ නවත්තල නැවතත් ආපස්සට එන්න, හරවන්න ඕන. ඒ වගේ මේ පෘථිවිය සෑහෙන වේගයකින් දෝලනය වෙනවා. හැබැයි මේ කියන්නෙ පෘථිවිය කැරකෙන වේගය (භ්‍රමන / පරිභ්‍රමන) නෙවෙයි. දෙපැත්තට දෝලනය වෙන වේගය. එහෙම වේගෙන් ගිහින් ක්ෂණයකට නතර වෙලා ආපසු හැරෙනව කියන්නෙ විශාල කැළඹීමක්. ඒ කැළඹෙන වෙලාවෙදි ඒක මැඩ පවත්වල තියාගන්න නම් විශ්ව ශක්තිය ක්‍රියාත්මක වෙන්න ඕන. හරියට අපි වාහනයක වේගෙන් යන කොට බඳ පටි දාගන්නව වගේ. එතකොට යන වේගෙට වාහනය හදිසියේ නැවතුණොත් එහෙම නැත්නම් නවත්තන්න වුනොත් බඳ පටිය නිසා අපි විසිවෙන්නෙ නෑ. අර වේගයෙන්ම ගිහින් තමයි සුළු මොහොතකට වේගය අඩු වෙලා ආපසු හැරෙන්නෙ, එහෙම නැත්නම් නතර වෙන්නෙ. නමුත් පටියක් බැඳල තියෙන නිසා අපි ඉස්සරහට විසි වෙන්නෙ නෑ. ඒ ආධාරකයක් තිබ්බච නිසා.

මෙන්න මේ විදියෙ ආධාරකයක් තමයි මේ විශ්වයටත් ලැබුණෙ. ඒ ශක්තිය පෘථිවිය හැරෙන මොහොතෙදිම ක්‍රියාත්මක වුණා. එහෙම නොවුණ නම් විශ්වයේ තිබෙන්නා වූ වායු කම්පනයෙන්, ඒ හැරීමත් එක්කම ඇතිවෙන්නා වූ මහා කම්පනයෙන් මේ පෘථිවිය පැත්තකට විසි වෙනවා. එහෙම වුනා නම් ලෝකයේ මහා කම්පාවක් වෙන්න ඉඩ තිබුණා. සමතුලිතතාවය බිඳ වැටිල, ලෝකෙ පුරාම පැතිරෙන විශාල සුළි සුළඟක් හැදෙන්න හේතු වෙනවා. එහෙම වුනොත් මේ වැව් අමුණු ගැලවිලා, ඇල දොල ගංගා පිටාර ගලල, මුහුද ගොඩ ගලල මහ විශාල විනාසයක් වෙනවා. එහෙම සිද්ධියක් වෙන්න ඒ වෙන කොටත් පරිසරය සකස් වෙලා තිබුණෙ. නමුත් බුදුන් වහන්සේගේ ශ්‍රී හස්තය මැවිල විශ්ව ශක්තිය ක්‍රියාත්මක වීමත් සමගම ඒ විනාසය නැති වෙන්න, එක පාරටම ගල් ගැහුන වගේ වුණා. හරියට අර වාහනයක යන කොට හදිසි අවස්ථාවකදි බඳ පටියෙන් මගියො ආරක්ෂා වෙනව වගේ. ඒ නිසා, වෙන්න තිබ්බච විනාසකාරී තත්ත්වයක් නැවතුණා. ඒක බුද්ධ ශක්තියෙන්මයි නැවතුණේ. ඒකට අධිෂ්ඨාන කළාම විශ්වයේ තිබ්බච අසීමිත බුද්ධ බල ශක්තිය ක්‍රියාත්මක වුණා. මම කළේ සමාධියෙන් අර විදියට ඉල්ලීමක් කිරීම විතරයි. හරියට පුතෙක් තාත්තගෙන් යමක් ඉල්ලනව වගේ. එතකොට තාත්ත තමන්ගෙ ශක්තියෙන් ඒක ක්‍රියාත්මක කරල දෙනවා. අන්න ඒ වගේ දෙයක්. **හැබැයි මේක මම විතරක් නෙවෙයි, තවත් අයත් අත්දැකල තියෙන්න පුළුවන්. ඒ කියන්නෙ යම් කිසි බල ඇති මහ අභිඥාලාභීන්, මහ ඍෂිවරු හිටිය නම් ඒ අයත් යම් කිසි අධිෂ්ඨානයක් කළා නම් ඒ වගේ සිද්ධ වෙන්න පුළුවන්. ඒ වගේම මේ කාලෙ වෙද්දි තව තවත් විවිධ පින්වත් පිරිස්, දහස් ගණන් විවිධ පුද පූජා තියල, යම් කිසි ශක්තියක් වඩපු සත් පුරුෂයන්ගෙ මූලිකත්වයෙන් එහෙම ඉල්ලීම් කරන්නත් ඇති. එහෙම ඉල්ලීම් කරන කොටත් ඒ අය දැනුවත්ව හෝ නොදැනුවත්ව මේ වගේ විශේෂ දෙයක් සිදු වෙන්න පුළුවන්. කොහොම හරි මම මේ කිව්වෙ මට පෞද්ගලිකව අත් දකින්න ලැබිච්ච සිදුවීමක් විතරයි. ඒක අර වගේ තවත් අයත් අත්දැකල තියෙන්න පුළුවන්.**

දැන් මෙතනදි මනෝමය බුදුන් පිරිනිවන් පාන්නෙ නෑ කියන කාරණය ඔප්පු වෙනවා. ඒ කියන්නෙ බුද්ධ **ශක්තිය විනාස වෙන්නෙ නෑ. හරියට පරිගණකයක් වගේ ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා තමයි අදත්, ඒතේනෙ සච්චේන සුවත්ථි හෝතු ... කියල යම් කිසි විසක් විනාස කරන්න කිව්වත් ඒකෙන් යහපතක් සිද්ධ වෙන්නෙ.** ඒ බුද්ධානුභාවය අදත් තියෙන නිසා. එහෙම සෙතක් වෙන්නෙ නැත්නම් කියන්නෙත් නෑ. බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන සබ්බරෝග විනස්සතු, සබ්බ භය විනස්සතු .... ආදී වශයෙන් අදත් කියනවා. එතකොට ඒකට අවශ්‍ය කරන ආනුභාවයක් තියෙනවා. හැබැයි ඒ ශක්තිය සත්වයෙක්, පුද්ගලයෙක් නෙවෙයි. නමුත් මුළු විශ්වයටම සෙත් ශාන්තිය විහිදන මහා පරිගණකයක් වගෙයි. එතකොට ඊට අනුකූල පුද්ගලයො සුදුසු විදියට ඉල්ලීමක් කළොත් ඒ ශක්තිය ක්‍රියාත්මක වෙනවා. මාත්‍රයක අනුකූලතාවයක් තිබුණත් ඒ ප්‍රමාණයට ක්‍රියාත්මක වෙනවා.

දැන් මේකට හොඳ උදාහරණයක් ත්‍රිපිටකයේ තියෙනවා. ඒ කාලෙ හිටපු ළමයි දෙන්නෙක් සෙල්ලම් කළා. එයින් එක්කෙනෙක් බෞද්ධ පරිසරයක හැදිච්ච ළමයෙක්. අනෙක් කෙනා අන්‍ය ලබ්ධියක් අදහන පවුලක ළමයෙක්. දැන් අර බෞද්ධ ළමය නමෝ බුද්ධාය කියල තමයි හැමදාම සෙල්ලම පටන් ගන්නෙ. ඉතින් ඒ ළමය දිනනවා. අනෙක් ළමය පරදිනවා. දවසක් මේ අන්‍ය ලබ්ධික ළමය හවස් වරුවක තමන්ගෙ තාත්තත් එක්ක යම් කිසි අවශ්‍යතාවයකට සැවැත් නුවරට ගියා. මෙහෙම ගිහින් නුවරට ඇතුල් වෙන දොරටුව ළඟ ළමය තියල නැවතත් මොනව හරි අරගෙන එන්න තාත්ත ඇතුළට ගියා. නමුත් ඒ කාලෙ තිබ්බච නීතිය අනුව කවුරුවත් එනකල් බලාගෙන ඉන්නෙ නෑ, නුවර දොරටුව හරියට වෙලාවට වහනවා. දැන් මේ ළමය දොරටුවෙන් මෙහා පැත්තෙ, තාත්ත එහා පැත්තෙ. ඒ කාලෙ තිබ්බච ක්‍රමවලට අනුව නුවර දොරටුව වහල ඒක යක්ෂයන්ට භාර කරනවා. ඊට පස්සෙ එතනට කිසි කෙනෙකුට එන්න බෑ. ආවොත් අර යක්ෂයින්ට බිලි ගන්න පුළුවන්. දැන් මේ ළමයට යන්න තැනක් නැති නිසා එතනම නිදා ගත්තා. ඒ වෙලාවෙ අර අධිගෘහිත යක්ෂය ඇවිත් මේ ළමයව බිලිගන්න හැදුවා. ඒ ළමයත් දැනගත්ත තමන් බිලිගන්නයි හදන්නෙ කියල. දැන් ඉතින් මොකද කරන්නෙ තාත්තත් නෑ, කෑ ගහල කියන්න කෙනෙකුත් නෑ. මේ වෙලාවෙදි අර තමන්ගෙ යාළුව සෙල්ලම් කරන

කොට දිනන විදිය මතක් වෙලා, නමෝ බුද්ධාය... නමෝ බුද්ධාය... කියල හයියෙන් කෑ ගැහුවා. මේකෙ මොකක් හරි බේරුමක් තියෙනව කියල මේ ළමයට වුනත් අර වචනෙ ගැන විශ්වාසයක් තිබුණා. මගේ මිත්‍රයටත් බේරුමක් තියෙනව නම් මටත් ඒක ඇතිනෙ, නැති වෙන්න බැනෙ කියල ඒ අදහසේ ඉඳගෙන තමයි මේ ළමය අර විදියට කෑ ගැහුවෙ. එහෙම නැතිව යථාර්ථය දැකල නෙවෙයි. දැන් මෙහෙම කෑ ගහන කොට අර යක්ෂය වෙව්ලන්න පටන් ගත්තා. ඊට පස්සෙ විගහට අර ළමයගෙ තාත්තගෙ වෙස් ගත්තා. ඊළඟට සැවැත් නුවර රජතුමා ළඟ තිබ්බ්ච ආහාර, පියාගෙ වෙස් මවාගෙන යක්ෂයගෙ සෘද්ධි බලයෙන් ගෙනත් මේ ළමයට කන්න දුන්නා. ළමයව එළි වෙනකල් තාත්ත වගේ ආරක්ෂා කළා. අපිට යන්න වෙලාවක් නෑ, අපි උදේට යමු කියල මේ ළමයගෙ බිය සැක දුරු කරල සනසල එළිවෙනකල් ආරක්ෂා කරගෙන හිටියා. එළිවෙලා දොර අරින කොටම මේ යක්ෂයත් අතුරුදන් වුණා. දැන් මේ මොකුත් නොදන්න තාත්ත ඇවිත් ළමයට කියනව, හරි වැඩේනෙ පුතේ වුනේ මට කරන්න දෙයක් නෑ, මං දැනුවත්ව ගියා නෙවෙයි කියල. ඇයි ඉතින් තාත්ත මාව රැක්කනෙ, මට කන්නත් දුන්නනෙ කියල මේ ළමය කියනවා. පස්සෙ විස්තරේ ඇහුවම තමයි දැනගත්තෙ මේ විදියට රැකුනෙ බුද්ධ ආශිර්වාදය නිසා කියල. එතකොට මේ නමෝ බුද්ධාය කියන වචනයත් අසනීපයකදි, කරදරයකදි මොන තරම් නම් පිහිටට එනවද ?

මේ නිසා තමයි **ධජග්ග සූත්‍රයේදී බුදුන් වහන්සේ දේශනා කළෙත් බයක්, තැති ගැන්මක්, ලොමුඩෑහැ ගැන්මක් ඇති වුනොත් උන් වහන්සේ සිහි කරන්න, ඒකාන්තයෙන්ම ඒ බය, තැති ගැනුම් නැති වෙනව කියල.** මොකක් නිසාද? තථාගතයන් වහන්සේ රාග, ද්වේශ, මෝහ ක්ෂය කළ නිසා බය නෑ, තැති ගැනෙන්නෙ නෑ, පලා යන්නෙ නෑ. දැන් මෙතනදි උන් වහන්සේ කිව්වෙ නෑ, මේ රැකවරණය තියෙන්නෙ උන් වහන්සේ ජීවත් වෙනකල් විතරයි කියල. නුඹලට මෙහෙම ප්‍රශ්නයක් වුනොත් තථාගතයන් වහන්සේ සිහි කරන්න කියලයි කිව්වෙ. එතකොට බුද්ධ ශ්‍රාවකයන් ඉන්නෙ බුදුන් වහන්සේ ජීවමානව වැඩ ඉන්න කල් විතරක් නෙවෙයි. ඊට පස්සෙත් ඉන්නවා. එතකොට මේ **ධජග්ග සූත්‍රය කියන්නෙ කල්ප අවසානය දක්වාම ක්‍රියාත්මක වෙන සූත්‍රයක්. ඒ දක්වාම ඒ බුද්ධ වචනයේ බලය තියෙනවා. කවද හරි බෞද්ධයෙක් අධිෂ්ඨාන කළොත් ඒ බලය ගන්න පුළුවන්.** හැබැයි කර්ම ශක්තිය ක්‍රියාත්මක වෙලා විපාක එන එක වෙනම දෙයක්. ඒවට යටත්ව බේරෙන්න පුළුවන් කියන එකයි මේ කියන්නෙ. එහෙම නැතිව තමන්ට එන කර්ම විපාකවලින් බේරෙන්න පුළුවන් කියන එකක් නෙවෙයි මේ කියන්නෙ. බුදුන් වහන්සේටත් දෙව්දත් ථෙරගෙ ගල් පෙරලීමෙන් බේරෙන්න බැරි වුණා. ඒක වළක්වන්න බැරි කර්ම විපාකයක්. එහෙම දෙයක් නෙවෙයි මේ කියන්නෙ. බේරෙන්න පුළුවන් හේතුවක් තියෙනව නම්, අර බුද්ධ ශක්තිය ඇදිල ඇවිත් ක්‍රියාත්මක වෙනවා. ඒක විශේෂයක්.

ඇත්ත වශයෙන්ම එදා (2012.12.12) පැහැදිලිව දැකගන්න ලැබුණු දෙයක් තමයි, අර වාහනයක ගමන් කරන කොට බඳ පටිවලින් බැඳගත්ත වගෙයි, විශ්වයේ තිබ්බ්ච වායු මණ්ඩලය කැළඹෙන්නෙ නැතිව තියාගන්න පුළුවන් විදියට බුද්ධ ශක්තිය ක්‍රියාත්මක වෙච්ච බව. ඒකෙන් තමයි ලෝකය බේරුනේ. නමුත් යථාර්ථය සහිත මේ කරුණු කාරණා කොච්චර කිව්වත් ලෝකයේ සමහරු මේවට හිනාවෙයි, පිළිගන්න එකක් නෑ. පිළිගත්තත් නැතත් මම දැක්ක දේ තමයි මේ කිව්වෙ. ඒ කියන්නෙ 2012.12.21 ලෝකයට මහ විනාසයක් වෙන්න තිබ්බ්ච දවසක්. සමහර අය දත්ත ගෙනහැර පෙන්නුවෙත් ඒ විනාසය ගැන. ඒක බොරු නෙවෙයි. නමුත් ඒක වුනේ නැත්තෙ මොකද කියල තෝර ගන්න බැරි වුණා. මම මේ කිව්වෙ ඒක වැළකිච්ච හැටි. මෙහෙම වෙන්න තියෙන විනාසයන් වළකින ක්‍රමයකුත් ලෝකයේ තියෙන බව හුඟ දෙනෙක් දන්නෙ නෑ. ඒ අය භෞතික විද්‍යාව මතම පදනම් වෙලා අනාවැකි පළ කරනවා. නමුත් අර වළකින ක්‍රමය නවීන විද්‍යාවටවත් අහු නොවෙන ගුප්ත ක්‍රමයක්. එහෙම අහුවුනානම් ඒකත් ඒ අය කියනවා. නමුත් ඒක විද්‍යාවට අහු වෙන්නෙ නෑ. සමහරු, වෙන්න තිබ්බ්ච විනාසය පිළිබඳ අනාවැකි කිව්ව මිසක් ඒක වළකින හැටි කියපු නැති නිසා තමයි ඒ සමහර අයගෙ අනාවැකි ගැන තිබ්බ්ච විශ්වාසය බිඳිල ගැටලු මතු වුණේ.

**දැන් මේ වගේ බුද්ධ ශක්තිය ක්‍රියාත්මක වෙන කොට බාහිරින් එන මොනම බලවේගයකින්වත් ඒක යටකරන්න බෑ. ඒ බුද්ධ ශක්තිය නිසා ලෝකෙ අකම්ප්‍ය වෙනවා.** එදා වෙන කල්ම විශ්වයේ තිබ්බ්ච අඳුරු කළු කිරණ ස්වභාවය මේ සිද්ධියෙන් පස්සෙ නැති වෙලා ගිහින් හැම තැනම ආලෝකමත් වුණා. ලෝකෙ තනිකරම දියමන්තියක් වගේ වුණා. ලෝකය වෙලාගත් අඳුරු කිරණ ඔක්කොම කැපිල ගිහින් දියමන්තියෙ එළිය වගේ හැම තැනම එළිය වුණා. ඒකෙන් ලෝකෙට රැකවරණය ලැබුණා. ඒක තමයි අන්තිමට ක්‍රියාත්මක වුණේ. නමුත් මේ සිද්ධිය ලෝකයේ මිනිස්සුන්ගෙ මස් ලේ සහිත භෞතික ඇසට දර්ශනය වෙච්ච දෙයක් නෙවෙයි, සමාධි දර්ශනයක්.

දැන් මෙතනදි ලෝකය උත්තර ධ්‍රැවයට සාපේක්ෂව දෙපැත්තට අංශක 6.5 බැගින් දෝලනය වෙන ක්‍රියාවලියක් ගැන ලෝක සම්මතයේ බොහෝ උගත්තු දැන ගෙන හිටියෙ නෑ. මේ ක්‍රියාවලිය අවුරුදු 50,000 කට සැරයක් සිද්ධ වෙන දෙයක්. ඒක චක්‍රයක්. මේ චක්‍රය සෘෂිවරුත් පෙන්වා දීල තියෙනවා. නමුත් ඒක අද සැඟවිලා. ඒ කියන්නෙ අවුරුදු 50,000 ක් ඉක්මවා යන කොට පෘථිවිය එක අන්තයකට දෝලනය වෙලා නැවතිලා, නැවතත් අනිත් අන්තය දෙසට ගමන් කරන්න හැරෙනවා. ඒ හැරිච්ච ගමන් තවත් අවුරුදු 50,000 ක් ඒ විදියට අනිත් අතට දෝලනය වෙනවා. ඒ 50,000 ත් ඉවර වෙන කොට නැවතත් අනෙක් අතට හැරිල දෝලනය වෙනවා. හරියට ඔරලෝසුවෙ බට්ට වගේ. දැන් මෙහෙම දෝලනය වෙලා මහමෙරේ උත්තර ධ්‍රැවයට අංශක 6.5 කින් ඇලවෙලා යනවා. ඒ කියන්නෙ පෘථිවියේ චුම්භක උතුර අංශක 6.5 කින් දැන් වෙනස් වෙලා තියෙන්නෙ. වෙනත් විදියකින් කියනව නම් නිරිත දිසාවට හැරිල. තවත් අවුරුදු 50,000 ක් ගියාම තමයි මේ නිරිත දිසාවෙන් නැවතත් හැරිල එන්නෙ. ඉතින් අවුරුදු 50,000 ත් 50,000 ට යන චක්‍රයක් තමයි මේ තියෙන්නෙ.

මේ ලෝකය මහමෙර වටේ මේ විදියට ක්‍රියාත්මක වෙමින් ගමන් කරන කොට මේ වෙලාවටම දස දහසක් සක්වලත් ඒත් එක්කම ගමන් කරනවා. එහෙම ගිහින් මේ දස දහසක් සක්වලත් මේ වෙලාවටම අනෙක් අතට නැවතත් හැරෙනවා. ඒ කියන්නෙ අර සිද්ධ වෙන්න තිබ්බ්ච විනාසය මේ ලෝකෙට විතරක් නෙවෙයි, දස දහසක් සක්වලටම බලපානවා. අර බුද්ධ ශක්තිය නිසා තමයි මේ දස දහසක් සක්වලම බේරුණේ. නැත්නම් මහ විනාසයක් වෙන්නෙ. හැබැයි මේ දස දහසක් සක්වල කියන්නෙ අපට සීමා කරන්න පුළුවන් මට්ටම. අනිත් දස දහසක් සක්වලවල් පොකුරු පිටින් ගමන් කරන්නෙත් මේ විදියටම තමයි. නමුත් **බුද්ධ ආරක්ෂාවක් පිහිටන්නෙ නැති ඒ වගේ සමහර දස දහසක් සක්වල තියෙන සමතුලිතතාව මේ ක්‍රියාවලියෙන් බිඳ වැටෙනවා.** ඒ අනෙක් දස දහසක් සක්වලත් අවුරුදු 50,000 කට වරක් මේ වගේ විනාසයක් සිද්ධ වෙනවා. එහෙම සිද්ධ වුනයි කියල අපට ඒක ආරංචි වෙන්නෙ නෑ. ඒක දැක බලා ගන්න ක්‍රමයකුත් නෑ. ඒ තරම් අපේ විෂය පථයෙන් ඈතයි.

මේ වගේ අවුරුදු 50,000 කට සැරයක් මෙහෙම ක්‍රියාවලියක් සිද්ධ වෙලා විනාස වෙන නිසා තමයි ජන

ගහනය වුනත් කවද හරි එක්තරා මට්ටමකට ගිහින් නතර වෙන්නෙ. ඒ වගේම නවීන විද්‍යාව වුනත් එක්තරා මට්ටමක් අභිබවා යන්න බැරි වෙනවා. ඒ මට්ටමට එන කොට අර වගේ චක්‍රයක් ඇවිත් වැනසෙනවා. මෙහෙම අවුරුදු 50,000 න් 50,000 ට විනාස වෙලා නැවතත් වැදි යුගයක් එනවා. ඊට පස්සෙ නැවතත් වැද්දො වගේ නිර්වස්ත්‍රව ඉඳල කාලයක් ගිහින් තමයි අවුරුදු 50,000 ක් යන කොට නැවතත් මේ වර්තමානය වගේ කාලයක් එන්නෙ. එතනින් පස්සෙ තවත් අවුරුදු 50,000 ක් යනකොට නැවතත් ඒ ක්‍රියාවලියම සිද්ධ වෙනවා. එතකොට නැවතත් නවීන විද්‍යාව අවසන් වෙනවා. මේ නිසා නවීන විද්‍යාව කියන එක අග තැන්පත් වෙලා ඉහළට යන්නෙ නෑ. ඒකත් එක්තරා මට්ටමකට සීමා වෙනවා. ඒ වගේම බුද්ධෝත්පාද කාලයකනම් අවිද්‍යාවෙන් අග තැන්පත් වෙලා පහළට යන්නෙත් නෑ. ඒකත් සීමා වෙනවා. ඒ බුද්ධ ශක්තිය නිසා.

ඉතින් මේ කාලවලදි මිනිස්සු මැරෙනව තමයි. ඒක ඉතින් ලෝක ස්වභාවය හැදිල තියෙන හැටි. නමුත් බුද්ධ ශක්තිය පවතින කාලයක අර සමතුලිතතාවය ඇවිත් විනාස නොවී, ඉන්න මිනිස්සුන්ට ඒකෙන් රැකවරණයක් ලැබෙනවා. **මේ බුද්ධ ශාසනය පවතින කාලයක් නිසා මෙහෙම රැකවරණයක් ලැබිල බේරුනාට වෙනත් කාලවලදි නම් මහ විනාසයක් වෙන්න පුළුවන්. දැන් මේ විදියට වුනත් අවුරුදු 50,000 න් 50,000 ට බුද්ධ ශක්තිය මතුවෙලා ඇවිත් රැකවරණය සැලසෙන අවස්ථා එන්නෙ අවුරුදු කෝටි ප්‍රකෝටි ගණනකටම කිහිපයයි.** මොකද බුද්ධ ශාසනයක් පවතින කාලයක් කියන්නෙ ලෝකය පැවතිලා තියෙන කාලයත් එක්ක බැලුවොත් ඇසිපිල්ලක් ගහන මොහොතක් වගේ සුළු කාලයක්. බොහෝ කොටම තියෙන්නෙ බුද්ධ ශූන්‍ය කාල වකවානු. ඉතින් මේ වගේ අති දුර්ලභ අවස්ථාවක් තමයි 2012.12.12 සිද්ධ වුණේ. ඒ කියන්නෙ අර වගේ චක්‍රයක් හෙවත් යුගයක් තමයි මේ අවසන් වුණේ. මායාවරුන්ගෙ දින දර්ශනය අවසන් වුනෙත් ඔය එක චක්‍රයක් අවසන් බව පෙන්වන්න. නමුත් ඒක වැරදි විදියට තමයි හුඟක් අය තේරුම් අරගෙන තිබුණෙ. **මේ බුද්ධ ශක්තිය, බුද්ධ ශාසනය පවතින මේ කාලයේ තවමත් විනාස නොවී තියෙන නිසා ලෝකෙට අර වගේ විනාසයක් වෙන්නෙ නෑ. මිනිස්සු දැනගෙන හිටියත් නැතත් ඒ ශාසන ආරක්ෂාව මුළු ලෝකෙටම ලැබෙනවා.** නමුත් ලෝකයේ මිනිස්සු මේ බුද්ධ ශාසනයේ තියෙන වටිනාකම දන්නෙ නෑ.

හැබැයි මේ ආරක්ෂාව, රැකවරණය ලැබෙන්නත් හේතු වාසනා තියෙන්න ඕන. ඒ වගේම ඉල්ලීමක් කරන්නත් ඕන. උදාහරණ විදියට මිනිස්සු රටේ නායකයන්ගෙන්, ගමේ රටේ තියෙන ප්‍රශ්නවලට විසඳුම් ඉල්ලනවා. එතකොට කරන්න පුළුවන් දෙයක් නම් ඒ අය ඒක හොයල බලල විසඳුම් දෙනවා. හැබැයි මිනිස්සු කට පියාගෙන සද්ධ නොකර හිටියොත් රටේ නායකයො දන්නෙ නෑ එහෙම ගැටළු තියෙනව කියල. ඒ නිසා කවුරු හරි ගිහින් ඉල්ලීමක් කරන්න ඕන. එහෙම නැත්නම් ඒක ක්‍රියාත්මක වීමක් වෙන්නෙ නෑ. බුද්ධ ශක්තියත් මේ වගේ නිශ්චලයි. යම් කිසි කෙනෙක් ඉල්ලීමක් කළොත්, කරුණාව මෛත්‍රිය මුල් කරගෙන ඒක ක්‍රියාත්මක වෙනවා. එහෙම නැත්නම් නිශ්චලයි. ඉල්ලීමක් කළොත්, ඒ ඉල්ලීමට හේතු තියෙනව නම් ඉටු කිරීම තමයි බුද්ධ ශක්තියේ ස්වභාවය. නමුත් මේ කාරණය හුඟ දෙනෙක් දන්නෙ නෑ. හේතු තියේ නම් ක්‍රියාත්මක වෙනව මිසක්, ලෝක සත්වයාගෙ පවුවලට මුක්කු ගහන්න ලොවුතුරා බුදුන් වහන්සේ පහළ වෙන්නෙ නෑ. මොකද එහෙම වුනොත් ඒක කවද කරල කවද ඉවර කරන්නද? ඒක කරන්න බැරි දෙයක්. නමුත් යම් කිසි කෙනෙක්ගෙ, විශේෂයෙන් බෞද්ධයෙක්ගෙ සාධාරණ හේතු සහිත ඉල්ලීමක් තියෙනව නම්, ඒක කරන්න පුළුවන් දෙයක් නම් ඒක ඉෂ්ට කරල දෙනවා. ඒකට ඉල්ලීමක් තියෙන්න ඕන. එහෙම ඉල්ලීමක් තියෙන්න ඕන නිසා තමයි, නුඹලට බයක් තැති ගැන්මක් ලොමුඩැහැ ගැන්මක් ඇති වුනොත් මාව සිහි කරන්න කියල උන් වහන්සේම කිව්වෙ. එහෙම නැතිව නිකන්ම උඹල උඹලගෙ පාඩුවෙ හිටපල්ල, මම උඹලට ඕනම වෙලාවක රැකවරණයට ඉන්නව කියල එහෙම දේශනා කළේ නෑ. එතකොට ඒ රැකවරණය, උන් වහන්සේ සිහි කළාම ලැබෙන දෙයක් බව පැහැදිලිවම පෙන්වල තියෙනවා.

අදත් බෞද්ධයෙක් නම්, කවුරුහරි ගහන්න මරන්න එන කොට බුදු අම්මෝ, බුදු අප්පෝ කියල කෑ ගහනවා. අමා මෑණියන් වහන්සේ, බුදු පියාණන් වහන්සේ කියන එක තමයි මේ විදියට ව්‍යවහාරයේ පහසුවට කෙටි කරල තියෙන්නෙ. වදපු අම්ම ගැනවත්, ජාතක කරපු තාත්ත ගැනවත් නෙවෙයි මේ කියන්නෙ. බෞද්ධයින් ප්‍රධාන වශයෙන්ම මේ විදියට සිහි කරන්නෙ බුදුන් වහන්සේ ගැන. හැබැයි බෞද්ධ නොවන අනෙක් අයටත් පෞද්ගලිකව ලෝකයේ උපරිම රැකවරණය දෙන්නෙ තමන්ගෙ අම්ම තාත්ත. මගෙ පුතාට, දුවට රැකවරණ වෙන්න ඕන, කරදරයක් වෙන්න එපා කියල කියන කොට විහිදෙන චිත්ත කිරණින් රැකවරණයක් ලැබෙනවා. ඉතින් ඒ නිසාම පෞද්ගලිකව තමන්ගෙ අම්ම තාත්ත සිහි කළත් ඒකෙ යම් කිසි බලයක් තියෙනවා. නමුත් බෞද්ධයො ඊට වඩා ඉක්මවා ගිය බලයක්, ශක්තියක් බුදුන් වහන්සේ වෙතින් දකිනවා. තමන්ටත්, ලෝකයේ සියල්ලන්ටමත් බුදුන් වහන්සේ අම්ම තාත්ත වගේ කියල දකිනවා. ඒ නිසා උන් වහන්සේ සිහි කරල බුදු අම්මෝ, බුදු අප්පෝ කියල කෑ ගැහුවම එතන මහ ශක්තියක් ක්‍රියාත්මක වෙනවා.

කොහොම නමුත් මේ බුද්ධ ශක්තිය නිකරුණේ ක්‍රියාත්මක වෙන්නෙ නෑ. බයක්, තැති ගැන්මක්, ලොමු ඩැහැගැන්මක් ආපු ගමන් සිහි කළොත් ඒ ශක්තිය ඇදිල එනවා. බෞද්ධයෙකුට ඒක විශේෂයි. රැකවරණයට මීට වඩා තවත් සිහි වෙන්න කෙනෙක් නෑ. ඒ ශක්තිය ඇදිල ඇවිත් දස මාර බලය පවා බිඳිල යනවා. හැබැයි දස මාර බලය බිඳෙනව කියල මෙතනදි කිව්වට ඒ අය (මාර සේනාව) ලෝකෙ විනාස කරන්න ලෑස්ති වෙලා නෑ. ලෝක විනාසෙදි ඒ අයටත් බුදුන්ගෙම පිහිටයි. එතකොට ඒ අයත් අනේ සාදු කියනවා. ඒ රැකවරණය ලෝකෙට ලැබෙන කොට මාර දිව්‍ය පුත්‍රයත් සතුටු වෙනවා. අනේ ලෝකෙට විනාසයක් වෙන්න යන්නෙ! අපි මොකද කරන්නෙ! මේ හැඟීමෙන් තමයි ඒ අයත් ඒ වෙලාවට ඉන්නෙ. ඒ නිසා එදා වෙච්ච සිද්ධියේදි මේ වසවර්ති මාරයා ඇතුලු මාර දෙව්වරු පිරිසත් සන්තෝස වුණා. ලෝකයට රැකවරණය බුදුන්ගෙන් සැලසුනා කියල ඒ අයටත් චිත්ත ප්‍රසාදයක් ඇති වුණා. දැන් කෙනෙකුට මේ කතාව ඇහුවම මේ මොන විකාරයක්ද කියල හිතෙන්න පුළුවන්. මොකද වසවර්ති මාරයා ගැන අහල තියෙන්නෙ එක පැත්තක් විතරයි. ඒ කියන්නෙ බුදු දහමට විරුද්ධ බලවේගයක් විදියට විතරයි. කාරණය ඇත්ත. නමුත් දියේ ගිලෙන්න ඉන්න මිනිහ පිදුරු ගහෙත් එල්ලෙනව වගේ ලෝකය විනාස වෙනව කියන්නෙ ඒ අයගෙත් විනාසය බව දන්න නිසා, ඒ වෙලාවට බුද්ධ රැකවරණයේ එල්ලෙනවා. ඕක තමයි යථාර්ථය. ඉතින් වසවර්ති මාරයා ඇතුලු පිරිසටත් එහෙම රැකවරණයක් ලැබෙනව නම් අනෙක් අය ගැන කවර කතාද? එදා දිව්‍ය, බ්‍රහ්ම ආදීන් පවා ඒ බුද්ධ රැකවරණය ලැබීම ගැන හුඟක් සතුටු වුණා. ඒ අයත් දන්නව මේ අවුරුදු 50,000 ක යුගය අවසානයේ, වෙන්න තිබ්බ විනාසයෙන් බේරුනේ බුද්ධ ශක්තිය නිසා කියල. නමුත් අපේ මිනිස්සු ඒක දන්නෙ නෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ගන්ධබ්බයා හෙවත් අන්තරාභවිකයා සම්බන්ධ ගැටලුව නිවැරැදි දහම් ඇසින් ...

ගන්ධබ්බයා, මනෝ කායිකයා (ඇස්ට්‍රල් බොඩි) කියල සාමාන්‍ය ව්‍යවහාරයේ අපට අහන්න ලැබෙන, බුදු දහමේ හැඳින්වීමට අනුව (මෙකල අන්තරාභවික යැයි පවසන) සංජාතික අවස්ථාව ගැන මේ කාලයේ බොහෝ කොටම කතා බහ වෙනවා. විශේෂයෙන් නවීන විද්‍යාවේ දියුණුවත් සමග මේ පිළිබඳව පර්යේෂණ කරන්න උගතුන් පවා බොහෝ උනන්දු වෙන ආකාරයක් දක ගන්න පුළුවන්. නමුත් බුදු දහම ගැන යම් කරුණු කාරණා දන්න පින්වත් පිරිස් අතර මේ සම්බන්ධයෙන් මේ වෙන කොට යම් යම් මත ඉදිරිපත් වෙලා තියෙනවා. ඒ මතයන් මොනව වුනත්, බුද්ධ දේශනාව අනුව මේ පිළිබඳව නිවැරදි කරුණු කාරණා හේතු සහිතව දන ගැනීම තමයි වැදගත් වෙන්නෙ. මේ ඒ පිළිබඳව කෙරෙන විග්‍රහයක්.

ථේරවාදී භික්ෂූන් වහන්සේලා අන්තරාභවයක් නොපිළිගැනීම පිළිබඳ මූලික ඓතිහාසික කරුණු වාර්තා වෙන්නෙ, බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ක් පමණ ඉක්ම ගිය පසු සිදු කරන ලද තෙවැනි ධර්ම සංගායනාවෙන්. ඒ කියන්නෙ මොග්ගලීපුත්ථතිස්ස මහ රහතන් වහන්සේ ප්‍රමුඛ දහසක් සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා අතර ඇති වෙච්ච සාකච්ඡාවක ප්‍රතිඵල විදියට සංගායනාරූඪ වෙච්ච **කතා වත්ථුප්‍රකරණය** නම් ග්‍රන්ථයේ පෙන්වන අන්තරාභව කතාවෙන්. පූර්ව ශෛලිය සහ සම්මිතිය නිකාය වාසීන්ගෙ අන්තරාභව කථාව පිළිගැනීම ධර්ම විරෝධී බව පෙන්වමින්, මොග්ගලීපුත්ථතිස්ස තෙරුන් වහන්සේ කරුණු ඉදිරිපත් කර ඇති බව තමයි ඒ පොතේ සඳහන් වෙන්නෙ. පූර්ව ශෛලිය කියන්නෙ, පෙර පටන් තමන් නොසෙල්වෙන ගලක් (ශෛල්‍යයක්) වගේ හෙවත් වෙනස් නොවෙන පිරිසක් කියන මතය දරපු පිරිස. සම්මිතිය නිකාය වාසීන් කියන්නෙ, යම් සම්මතයක් තියෙනව නම් ඒක කඩන්නෙ නෑ කියන ලෝක සම්මතයේ හිටපු පිරිස. විදර්ශනා කරන්න ගියත් ඒ අය සම්මතයට අදාලව සත්වයෙක්/පුද්ගලයෙක් ඉන්නවා කියන දෘෂ්ටියේ ඉන්නව මිසක්, නුවණින් තේරුම් අරගෙන හේතු ඵල දහමක් පිළිගන්නෙ නෑ. පොතක තිබුණ නම්, සම්මත කරගෙන තිබුණ නම් ඒ මතයේම එල්බ ගෙන ඉන්නවා.



මොග්ගලීපුත්ථතිස්ස තෙරුන් වහන්සේ ඇතුළු ථේරවාදී (ථේර කියන්නෙ තිර හෙවත් ස්ථිරත්වයට පත් කියන අදහස) භික්ෂු පිරිස සකවාදී (ධර්මයට අනුකූල) පිරිස ලෙසත්, පූර්ව ශෛලිය සහ සම්මිතිය (මේ දෙකම මහායානයට අයත්) පිරිස පරවාදී හෙවත් ධර්ම විරෝධී අදහස් දරන පිරිස ලෙසත් අරගෙන, දෙපස සම්මුඛව කරුණු ඉදිරිපත් කරමින්, විසඳමින් නිගමනයකට පැමිණි විදියට අන්තරාභව කතාව ලියල තිබුණත්, පරවාදී කියන කිසිම පිරිසක් ඒකට සම්බන්ධ වෙලා තියෙන බවට සාධක නෑ. සකවාදී පිරිසම පරවාදී පිරිසගේ ප්‍රශ්න සහ පිළිතුරු සපයන පිරිස විදියට අදහස් දක්වමින් කරපු විසඳුමක් ගැන තමයි කතා වත්ථුප්‍රකරණයේ සඳහන් වෙන්නෙ. මේ අනුව පරවාදීන් දකපු අන්තරාභවය ලෙස සකවාදී හෙවත් ථේරවාදී භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් කරල තියෙන අන්තරාභව විස්තරය තමයි මේ :-

1. පරවාදීන් අන්තරාභවයක් ඇතැයි පිළිගනී.
2. එම පරවාදීන් පිළිගත් අන්තරාභවය කාම භවයට අයත් නොවේ.
3. රූප භවයට ද අයත් නොවේ.
4. ඒ අතරට ද අයත් නොවේ.
5. අරූප භවයට ද අයත් නොවේ.
6 රූප භවය හා අරූප භවය අතරට ද අයත් නොවේ.
7. නිරය, ප්‍රේත, තිරිසන්, අසුර යන යෝනිවලට ද අයත් නොවේ.
8. පංච ගතියටද (නිරය, ප්‍රේත, තිරිසන්, මිනිස්, දේව) අයත් නොවේ.
9. සත්ත විඤ්ඤාණස්ථිතියට (හිත පිහිටන ස්ථාන හතක්) අයත් නොවේ.
10. නව සත්තා වාසයට (සත්ත්වයන් වාසය කරන ස්ථාන) අයත් නොවේ.
11. ප්‍රතිසන්ධියට පැමිණීමක් නැත.
12. එසේ පැමිණ සිටින කෙනෙක් ද නැත.
13. මෙහි හට ගැනීමක්, දිරීමක්, මරණයක්, චුතියක් හෝ උපතක් නැත.
14. මෙහි රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධ නැත.
15. අන්තරාභවයට පැමිණෙන කර්මයක් නැත. සත්ත්වයෙක්ද නැත.
16. සියලු සත්ත්වයන්ටම අන්තරාභවයක් නැත. (එනම් සමහර සතුනට ඇත).
17. ආනන්තරික පුද්ගලයාට අන්තරාභවයක් නැත.
18. නිරයෝපගත, අසඤ්ඤසත්වෝපගත, අරූපෝපගත පුද්ගලයාට අන්තරාභවයක් නැත.
19. අන්තරා පරිනිබ්බායී පුද්ගලයාට අන්තරාභවයක් ඇත.
20. උපහච්ච පරිනිබ්බායී (මැරෙන මොහොතෙදි අරිහත්වයට පත්වන), අසංඛාර පරිනිබ්බායී (සංඛාර වශයෙන් මතු භවයක් ගොඩ නගන්නෙ නැති මානසිකත්වයට පත්වෙලා ඉන්න, භව ගතිය මිසක් නව ගතියක් ගොඩ නැගෙන සංඛාර ඇති නොවන තත්ත්වය), සසංඛාර පරිනිබ්බායී (සංඛාර වශයෙන් ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා කියන මේ 5 න් එකක් වර්ධනය කරන අවස්ථාව) පුද්ගලයන්ට අන්තරාභවයක් නැත.

පරවාදීන් පිළිගත් අන්තරාභවයේ ස්වභාවය මෙබන්දක් විදියට අරගෙන, ඒක ධර්මානුකූල නොවන බවට පෙළ දහමින් කරුණු පෙන්වීමෙන් තමයි සකවාදීන් හෙවත් ථේරවාදී භික්ෂූන් ☞

වහන්සේලා විසින් මුළා මතයක් බිඳ හැරල තියෙන්නෙ. නමුත් මේ කාලයේ අන්තරාභවය කියල කරුණු ගෙන හැර දක්වන පින්වතුන්ගේ අන්තරාභව සංකල්පය මීට හාත්පසින්ම වෙනස්. මේ නිසා එහි සත්‍යතාව හොයන්න කථාවත්ථුප්‍රකරණයේ තියෙන අන්තරාභව සංකල්පය බිඳ හෙළපු ක්‍රම රටාව ඇඳගන්න යාම ගැළපෙනවද කියල හිතල බලන්න ඕන. මේ පෙන්වන්නෙ එබඳු අන්තරාභවයක් ඇත යන්නක් පෙන්වන්න නෙවෙයි, අද යම් යම් අය ඉදිරිපත් කරන අන්තරාභව සංකල්පය කෙබඳු එකක්දැයි දැන ගැනීමට කරුණු ඉදිරිපත් කිරීමක්. ඒ කරුණු නම්,

1. දස අකුසල් ඇසුරු කරපු, භාවිතා කරපු, බොහෝ විට භාවිතා කරපු, ඒ මිසදිටුව අත් නොහැර ඒ ලබ්ධියේ ඉඳල මියගිය කෙනෙක්, ඔසවාගත් බරක් බිම දමන්නා සේ, දියට දැමූ ගලක් යට යන්නා සේ නිරයගතවීම සිදු වෙනවා. නිරයේ උපන් ඒ පුද්ගලයාට, නිරයේ උපන් තැන් පටන් එහි වසන තුරු අන්තරාභව සැරිසැරීමක් නෑ.

2. දස කුසල් ඇසුරු කරපු, භාවිතා කරපු, බොහෝ භාවිතා කරපු සම්මා දිට්ඨිකයෙක් නිදා පිබිදියා සේ දෙව් ලොව, බඹ ලොව උපදිනවා. දෙව් ලොව, බඹ ලොව උපන් තැන් පටන් එවැන්නෙක් අන්තරාභවයක කල් ගත කිරීමක් නෑ.

3. මිනිස් හෝ තිරිසන් මස් ලේ කයක් ඇති සත්ත්ව කොට්ඨාසයක උපතට අවස්ථාව ලැබෙන තුරු කර්මජ, චිත්තජ සූක්ෂම කයකින් යුතුව, මනුස්සයෙක් වෙලා හිටපු කාලයේදී කරපු දුසිල්කම් නිසා දුස්සීල දුර්ගන්ධයට ගැළපෙන සියුම් දුගඳ හෝ සිල්වත් වැඩ කළා නම් සීල සුගන්ධයට ගැළපෙන සියුම් සුගඳ (මල්, මුල්, ගෙඩි, සුවඳ) ආදී කර්මානුරූපව ලැබෙන ගන්ධාහාරයකින් යැපෙන කාමාවචර (කාමයේ හැසිරෙන) සත්ත්ව අවස්ථාවකට තමයි අද අන්තරාභවිකයා කියල හඳුන්වන්නෙ. ගාන්ධර්ව කියන පිරිසටත් ගන්ධබ්බ (ගන්ධයේ එල්බ ගෙන සිටින්නා) කියල කිව්වත් ඒ දේව කොට්ඨාස මීට පටලවා නොගත යුතුයි. ඒ දේව කොට්ඨාසය චාතුර්මහාරාජික කියන පහළම දෙව් ලොවට අයිති, මිනිස් ලොව වෘක්ෂ ආදියට අරක් ගත් මල් සුවඳ, මුල් සුවඳ, ගෙඩි සුවඳ (පළතුරු) ආදී නොයෙක් සුවඳ වර්ග අවශෝෂණය කර ගෙන ජීවත් වෙන, අනෙකුත් දෙව් පිරිසට ආවතේව කරන දේව පිරිසක්. සුදුසු ගැබක් හිමිවන තුරු කර්ම මූලිකව සියුම් කයකින් ජීවත් වෙන ගන්ධබ්බ කොටසකට තමයි අද අන්තරාභවිකයා කියල කියන්නෙ.

මජ්ඣිම නිකායේ 3 වන කාණ්ඩයේ විභංග වර්ගයට අයත් අරණ විභංග සූත්‍රයේ (494 පිටුව) පෙන්වා තියෙන විදියට, යම් වචනයකින් කතා කරන කොට ඒ වචනයට මූලිකව දුන් අර්ථයක් අරගෙන තර්කවාදී නොකර, ඒ ඒ වචනයට ඒ ඒ කාලයේ යම් ජනපදයක පින්වතුන් පවසන අර්ථය වටහාගෙන, ඒ අනුව කතා කිරීම සුදුසු බවයි බුදුන් වහන්සේ පෙන්වා වදාළේ. ජනපද නිරුක්තිය අභෝසි කරන්න එපා කියල දේශනා කළෙත් මේ නිසා. උදාහරණ විදියට පත්ත හෙවත් පාත්‍රය හඳුන්වන්න ඒ ඒ ජනපදවල පාතී, විත්ත, සරාව, ධාරෝප, පොණ, පසීලව ආදී නම් භාවිතා කරනවා. මේ විදියට ලෝක ව්‍යවහාරය නොඉක්මවා එයින් පෙන්වපු අදහස තේරුම් අරගෙන ව්‍යවහාර කළ යුතු බව පෙන්වා තියෙනවා.

ඒ වගේම යම් යම් වචනවලට, පෙර ව්‍යවහාර කරපු අර්ථයන්ට හාත්පසින්ම වෙනස් අර්ථයනුත් අද භාවිතා කරන බව දැකගන්න තියෙන කාරණයක්. උදාහරණ විදියට ''අරහං'' **කියන උතුම් බුදු ගුණ වදන ''ඕක මට අරහං'' කියල අසත්පුරුෂ අර්ථයෙනුත් අද භාවිතා කරනවා. මේ විදියටම ලෝකයෙන් එතෙර වෙන අදහසින් භාවිතා කරන ''ලෝකෝත්තර'' කියන උතුම් අදහස ''ඕක මහ ලෝකෝත්තරය'' කියල අසත් පුරුෂයන් හඳුන්වන්නත්, ඇබිත්තක් හෙවත් ලෝක ආසාවන්ගෙන් කුඩා කොටසක් අල්ල ගත් පුද්ගලයා හඳුන්වන්න භාවිතා කරපු ''ඇබිත්තයා'' කියන වචනය අද කෙනෙකු පහත් කර හඳුන්වන්නත්, තණ්හාවෙන් ගොඩක් අල්ල ගත්තු කෙනෙක් හඳුන්වන්න එදා ගොඩයා (ගොඩක් කෙරෙහි යාවුණා) කියල භාවිතා කරපු වචනය, අද ගම්වල ඉන්න නූගත් වැසියන් හඳුන්වන්නත් භාවිතා කරනවා.** ඒ වගේම දැනට වසර පනහකට පමණ ඉස්සර බරක් ඉස්සීමට ''උස්සනවා'' කියල භාවිතා කරපු වචනය, අද ස්ත්‍රියක් පැහැර ගෙන යාම සහ යම් භාණ්ඩයක් හොරකම් කිරීම හඳුන්වන්න භාවිතා කරන ආකාරයත් දකින්න තියෙනවා.

මේ වගේ මහායානික අන්තරාභවිකයා කියල පෙන්වපු අදහසක් නෙවෙයි අද අන්තරාභවිකයා කියල බොහෝ අය හඳුන්වන්නෙ. යම් මනුස්සයෙක් මියගියාට පස්සෙ මිනිස් හෝ තිරිසන් හෝ මස් ලේ සහිත කරජ කයකින් උපත ලබන තුරු, ඒ අතර සූක්ෂම කයකින් ඉන්න කාලයක් ගැන තමයි අද අන්තරාභවයක් කියල කතා කරන්නෙ.

ඒ නිසා මේ කතා කරන්නෙ යක්ෂ, ප්‍රේත, දේව වගේ සූක්ෂම කයක් තියෙන, එබඳු සූක්ෂම රූප කලාපවලින් හැදිච්ච ඇස, කන, නාසය, දිව, කය ආදී ඉන්ද්‍රියන් සහිත ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා ආදිය තියෙන, මිනිස් කනට නෑසුණත් දෙවියන් භූතාදීන් වගේ කතා කරන්න පුළුවන් සත්ත්ව ස්වභාවයක් ගැන, ඒ වගේ මනෝමය කායික අවස්ථාවක් ගැන. පංචස්කන්ධය වටහා නොගත්තම මනෝමය කය පංචස්කන්ධයට අයිති නොවන බවත්, එබඳු කයකින් යාම ඒම, කතාබහ කිරීම කළ නොහැකි බවත්, මස් ලේ සහිත කරජ කයක් නැත්නම් කතාවක් හෝ ක්‍රියාවක් කළ නොහැකි බවත් හිතාගෙන මිසදිටු අදහස් ඇති වෙන්න පුළුවන්. මේ නිසා අන්තරාභවිකයා කියල අද අදහස් කරන සත්ත්ව ස්වභාවය තේරුම් ගන්න පළමුව සූක්ෂම කායික, මනෝමය කායික අවස්ථා ගැන තේරුම් අරගන්න ඕන. දෙවියන්, ප්‍රේතයන්, යක්ෂයන් කියන සූක්ෂම කායික සත්ත්ව කොටසක් ගැන බුදු දහමේ සඳහන් වෙනව වගේම යක්ෂ, ප්‍රේත වගේ අය ගඳ සුවඳ වගේ සූක්ෂම ආහාරත්, උසස් පෙළේ දෙවියන් අමෘතය නම් ආහාරයකුත් අරගෙන යැපෙන බවත්, මේවා සූක්ෂම වූ කබලිංකාර ආහාර බවත් බුදු දහමේ පෙන්වා තියෙනවා. (කබලිංකාර ආහාර කියල අද අර්ථ දක්වන්නෙ කන බොන, කැබලි කර කන ආහාරවලටට. නමුත් මෙහි නියම අර්ථය තමයි කය බලිංකාර කිරීම, බලි කිරීම හෙවත් කය ලස්සන කර ගෙන, උස් මහත් කර ගෙන, කය වැඩීමට ආසාවෙන් ආහාර ගැනීම.)

මනෝමය කායිකයො කියන්නෙ මීටත් වඩා සූක්ෂම ශරීර තියෙන සත්ත්ව කොටසක්. සුගතිගත මනෝමය කායිකයො කියන්නෙ චිත්ත ප්‍රීතිය ආහාර කරගෙන එයින් නැගෙන චිත්තජ කයකින් ජීවත් වෙන බඹ ලෝ වැසි රූපාවචර (රූපයේ හැසිරෙන) බ්‍රහ්මයින්. එබඳු අති සූක්ෂම කායික බ්‍රහ්මයෝ පවා යාම් ඒම් කළ හැකි, කතා කළ හැකි, සවන් දිය හැකි, සිතිය හැකි, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන සූක්ෂම පංචස්කන්ධයකින් යුක්තයි. සහම්පති ආදී බ්‍රහ්මයන් නිතර බුදුන් වහන්සේ හමු වෙලා කරපු කතා, සාකච්ඡා, වන්දනා කිරීම් ආදිය ත්‍රිපිටක ග්‍රන්ථවල බොහෝ තැන්වල පෙන්වා තියෙනවා. මනෝමය කයකින් කතා කළ හැකි බවට සාක්ෂි අවශ්‍ය පින්වතුන්ට, අංගුත්තර නිකායේ 5 වන කාණ්ඩයේ 148 පිටුවේ එන අනුරුද්ධ සූත්‍රය සහ 284 පිටුවේ එන පරිස සූත්‍රයෙන් ඒ බව දැනගන්න පුළුවන්. ඒ වගේම තුදු පච්චේක බ්‍රහ්ම නම් මනෝමය කායික බ්‍රහ්මයෙක්, කෝකාලික නම් පෘථජ්ජන භික්ෂුවකට අවවාද කළ බවට සාක්ෂියක් අංගුත්තර නිකායේ 6 වන කාණ්ඩයේ 307 පිටුවේ එන කෝකාලික සූත්‍රයෙන් ලබා ගන්න පුළුවන්. චිත්තජ රූපයම ඝනීභවනය කරගෙන පෘථජ්ජන මනුස්සයින් ඉදිරියේ පෙනී සිටීමේ හැකියාව මේ බ්‍රහ්මයන්ට පවතින බව මේ වගේ කරුණුවලින් පැහැදිලි වෙනවා. ඒ වගේම **සැරියුත් මහ රහතන් වහන්සේගේ දිවැසට පවා නොපෙනිච්ච ප්‍රේතයින් හිටපු බවත් තේරුම් ගන්න ඕන. ගිජුකුළුපව්ව පාමුල මහා දුක් ගිනි විඳිමින් සැරිසරන ප්‍රේත රැලක් දැක්කෙ බුදුපියාණන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ පමණක් බව පෙළ දහමේ සඳහන් වෙනවා.** ඒ සූක්ෂම කායික ප්‍රේතයින්ටත් පංචස්කන්ධය

තියෙනවා. මේ විදියට පංචස්කන්ධයට අයිති දේවල්වත් නොදැන, විදර්ශනා වඩල කොහොමනම් යථාවබෝධයක් ලැබෙනවද කියල හිතල බලන්න ඕන.

මීළඟට විඤ්ඤාණය කියන්නෙ මොකක්ද කියල මනාව වටහාගත යුතුයි. විඤ්ඤාණයක යාම් ඒම්, සැරිසැරීම් කොහොමද කියල තේරුම් ගන්න ඕන. සංයුක්ත නිකායේ 3 වන කාණ්ඩයේ 96 පිටුවේ උපය වර්ගය බීජ සූත්‍රයේ මෙහෙම සඳහන් වෙනවා. ''යෝ භික්ඛවේ ඒවං වදෙය්‍ය අඤ්ඤත්‍ර රූපා අඤ්ඤත්‍ර වේදනාය අඤ්ඤත්‍ර සඤ්ඤාය අඤ්ඤත්‍ර සංඛාරේහි විඤ්ඤාණස්ස ආගතිං වා ගතිං වා චුතිං වා උප්පත්තිං වා වුද්ධිං වා විරූළහිං වා වේපුල්ලං වා පඤ්ඤපෙස්සාමීති නේතං ඨානං විජ්ජති - මහණෙනි යමෙක්, මම රූපය හැර, වේදනාව හැර, සංඥාව හැර, සංඛාරයන් හැර විඤ්ඤාණයාගේ යාම හෝ ඒම හෝ චුතිය හෝ උප්පත්තිය හෝ වැඩීම හෝ නැගීම හෝ පැතිරීම හෝ පනවන්නෙමි'යි කියා නම් තෙල කරුණ විද්‍යමාන නොවේ''

මේ නිසා විඤ්ඤාණය ගැන කතා කරන හැම විටම ඉහත කියපු සිද්ධාන්තය සිහි තබාගත යුතුයි. මේ කාරණය වටහා ගන්න මේ උපමාවත් තේරුම් ගැනීම වටිනවා. ''අද උදේ ජයපාල අපේ ගෙදර ඇවිත් මට තෑගි බෝගත් ගෙනත් දීල කතා කර කර ඉඳල ගියා.'' දැන් මේ කතාව අහපු මුළා වෙච්ච කෙනෙකුට පණ්ඩිත මානයෙන් මේ විදියට විතණ්ඩවාදී තර්ක දෙකක් ඉදිරිපත් කරන්න පුළුවන්. ''ජයපාල කියන්නෙ නාමයක්. නාමයට එන්නවත්, තෑගි බෝග දෙන්නවත්, කතා කරන්නවත්, යන්නවත් බෑ. ඒ නිසා මේ කතාව පිළිගන්න බැරි බොරුවක්.'' මේ එක මෝඩ තර්කයක්. අනෙක් තර්කය තමයි, ''ජයපාල කියන්නෙ නාමයක්. ඒ නාමය පැමිණි බවත්, තෑගි බෝග දුන් බවත්, කතා කළ බවත්, ආපසු ගිය බවත් කියල තියෙන නිසා නාමයකට එසේ කළ හැකි බව පිළිගන්න පුළුවන්.'' මේ තමයි දෙවැනි මෝඩ තර්කය. නමුත් යථාර්ථය නම්, ජයපාල කියන නාමය මුල් කරගෙන කතා කළත් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ සහිත වූවෙකුගේම ක්‍රියාවක් පැමිණීම වශයෙනුත්, තෑගි බෝග දී කතා කිරීම යෑම් වශයෙනුත් සිද්ධ වෙලා තියෙන බව තේරුම් ගන්න ඕන. මේක හොඳට වැටහෙන කරුණක් නිසා ජයපාල කියන නම මුල් කරගෙන කතා කළත් ගැටලුවක් නැති බව තේරුම් ගන්න පුළුවන්. මේ විදියට විඤ්ඤාණයක යාම ඒම, සැරිසැරීම ආදිය ගැන කියන කොට රූප, වේදනා, සංඥා, සංඛාර සමගම ඒක සිද්ධ වෙන බව තේරුම් ගන්න ඕන.

යමෙක් මස් ලේ කයක් අතහැරල මැරිල, නැවතත් මස් ලේ කයක් ලබන කල් අතර කාලයක සැරිසරන සූක්ෂම කායික අවස්ථා ගැන දැන ගන්න ත්‍රිපිටකයේ නොයෙක් තැන්වල සාධක පෙන්වා තියෙනවා. ඒ පිළිබඳව දැන ගන්න ඉස්සෙල්ල විඤ්ඤාණය පිළිබඳ කරුණුත් දැන ගත යුතුයි. මජ්ඣිම නිකායේ පළමු වන කාණ්ඩයේ 602 පිටුවේ එන මහා තණ්හාසංඛය සූත්‍රයේ පෙන්වා තියෙන, සාතී නම් භික්ෂුවකට බුද්ධ දේශනා වරදවා අර්ථ ගෙන මුළා අදහසක් පහළ වුණා. ඒ කියන්නෙ, ඒ විඤ්ඤාණයම දිවෙනවා, සැරිසරනවා, ඒ විඤ්ඤාණයෙන්ම කතා කරනවා, වේදනා විඳිනවා, කුසලාකුසල කර්මයන්ගේ විපාක විඳිනවා කියල. බුදුන් වහන්සේ මේ ගැන විමසල ඒ භික්ෂුවට නිග්‍රහ කරල මේ විදියට දේශනා කළා. ''නානු මයා මෝඝ පුරිස අනෙක පරියායේන පටිච්ච සමුප්පන්නං විඤ්ඤාණං වුත්තං අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවෝති - මෝඝ පුරුෂය, මා විසින් නන් අයුරින් විඤ්ඤාණය පටිච්ච සමුප්පන්න යැයි ප්‍රත්‍යය විනා විඤ්ඤාණ සම්භවයක් නැතැයි වදාරන ලද්දේ නොවේද?'' (වැඩි විස්තර සූත්‍රය කියවා දැනගන්න පුළුවන්) මේ විදියට විඤ්ඤාණ හට ගන්න හැටි පටිච්ච සමුප්පන්නව දැන ගන්න ඕන.



ලොවුතුරා බුද්ධත්වයට පත් බුදු පියාණන් වහන්සේ උදාන ගාථාවක් විදියට අනේක ජාති සංසාරං .... ආදී ලෙසින් දේශනාවක් කරල තියෙනවා. එතනදී මේ කය ගෘහයක් ලෙසත්, කය නමැති ගෙය හදන වඩුවා තණ්හාව ලෙසත් දැකල, ඒ තණ්හාව ක්ෂය කරපු නිසා නැවත කය නම් ගෘහය හැදීම කෙළවර වෙන බවත් දේශනා කරල තියෙනවා. ඒ වගේම ධ්‍යානලාභී භික්ෂුවක් චුතූපපාත ඥානයෙන්, චුතවන උපදින සත්ත්වයන් දකින හැටි මේ විදියට විස්තර කරල තියෙනවා. (මජ්. නි. 1 - 649 පිටුව - මහා අස්සපුර සූත්‍රය) ගෙවල් දෙකක දොර දෙකක් අතර සිටින ඇස් ඇති පුරුෂයෙක්, ගෙට වදින්නා වූත්, ගෙයින් බැස යන්නා වූත්, ඔබ මොබ සක්මන් කරන්නා වූත්, ගෙයින් ගෙට වදනා වූත් මිනිසුන් යම් සේ දකින්නේ ද, එසේම මිනිස් ඇස ඉක්ම වූ දිවැසින්, මියයන - උපදින, හීන-ප්‍රණීත, සුවර්ණ-දුර්වර්ණ, සුගති - දුර්ගත සත්ත්වයන් යථා කර්මෝපගතව එසේ සැරිසරන අයුරු දකිනවා. මෙතනදී ගෙට ඇතුළුවන, පිටවන, ඔබ මොබ සැරිසරන අවස්ථාව මොකක්ද කියල හොයල බලන්න ඕන. ඒ වගේම බුදුන් වහන්සේ බෝ මැඩදී බුදු වෙන්න පෙර, චුතූපපාත ඥානයෙන් ලෝ සතුන් දෙස දිවැසින් බලද්දි, හතරමං හන්දියක ඉඳගෙන බලන කොට කඩවලට ඇතුළුවන, පිටවන, වීදිවල සැරිසරන මිනිසුන් දකිනව වගේ, මියයන - උපදින සත්ත්වයන් දැකපු බව පෙන්වා තියෙනවා. මෙතනදී කඩවලින් පිටවෙලා වීදිවල සැරිසරන විදියට දැකපු අවස්ථාව මොකක්ද කියල හොයල බැලීම වටිනවා. ඒ වගේම බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් මෙහෙම අහනවා.

''විඤ්ඤානංචහි ආනන්ද මාතු කුච්ඡිං න ඔක්ඛමිස්සථ අපිනුකෝ නාම රූපං මාතු කුච්ඡිං සමුච්චිස්සථාය - ආනන්දය විඤ්ඤාණය කර්මානුරූපව මවු කුසකට ගොස් ඇතුළු වන්නේ නැත්නම් නාම රූපයක් මවු කුසෙහි පහල වේද ?'' ''නෝ හේතං භන්තේ - නැහැ. එහෙම වෙන්න බෑ ස්වාමීනි.'' ''විඤ්ඤානංචහි ආනන්ද මාතු කුච්ඡිං ඔක්ඛමිත්වා වොක්ඛමිස්සථ අපිනුකෝ නාම රූපං ඉත්ථත්ථාය අභිනිබ්බත්ථාය - ආනන්දය විඤ්ඤාණය මවු කුසට ඇතුළුව නැවතත් මවු කුසෙන් ඉවත්ව යන්නේ නම්, නාම රූපය මවු කුස තුළ වැඩේද?'' ''නෝ හේතං භන්තේ - නැත, එය නොවන්නේය ස්වාමීනි.''

මේ දහම් පාඨයන් අනුව මවු කුසට ඇතුළුවන, පිටවන, සැරිසරන සත්ත්ව අවස්ථාවක් තියෙන බව සනාථ වෙනවා. රූපය කියල මස් ලේ සහිත ඝන කයකට පමණක් සීමා නොකර, සූක්ෂම කායික රූපස්කන්ධත් තියෙන බව තේරුම් ගන්න ඕන. දීඝ නිකාය (1) 388 පිටුවේ එන පොට්ඨපාද සූත්‍රය අනුව ''තයෝ මේ පොට්ඨපාද අත්ථ පටිලාභෝ'' පොට්ඨපාදය ආත්මභාව තුනක් තියෙනව කියල විග්‍රහ කරන තැන, ''මනෝමය අත්ථ පටිලාභෝ රූපි සබ්බංග පච්චංගී අභිනින්ද්‍රියෝ'' කියල රූපී වූ සියලු අඟපසඟ සහිත, සියලු ඉන්ද්‍රියන් සහිත මනෝමය වූ ආත්මභාව ප්‍රතිලාභයක් ඇති බවත් පෙන්වා තියෙනවා. අද සමහර පින්වතුන් අන්තරාභවිකයා කියල හඳුන්වන්නෙ මෙබඳු සූක්ෂම කායික අවස්ථාවක් ගැන. මේක තුන්වන ධර්ම සංගායනාවෙදි විවාදයට ගත්තු මහායානිකයන් හඳුන්වපු අවස්ථාවක් නොවන බව සැලකිය යුතුයි. ඒ වගේම සංයුක්ත නිකායේ (1) 223 පිටුවේ ☞

එන මාර සංයුත්තයේ ගෝධික තෙරුන්ගේ දේහය අසල උඩ යට වට විපරම් කරමින් දුමාරයක් ලෙස හැසිරුණු වසවත් මරුන්, උන්වහන්සේගේ විඤ්ඤාණය පිහිටි තැනක් හෝ ගිය තැනක් නොදැක සොයපු බවත්, උන්වහන්සේ නොපිහිටි විඤ්ඤාණයෙන් පිරිනිවන් පෑ බවත් පෙන්වා තියෙනවා. ඉතින් කෙනෙක් මියගියාම, අතරක පෙනෙන්න දෙයක් නැතිවම සැතපුම් ගණනක් හෝ දුර මවු ගැබක පටිසන්ධි වෙනව නම්, (ලෝක සම්මත කතාව අනුව) ලෝකයේ විෂය පවත්වන (ලෝකය හොඳයි කියන) මාර දිව්‍ය පුත්‍රයා ගෝධික හිමියන්ගෙ දේහය ළඟ මොනව හොයන්නද? එහෙම හොයන්නෙ යන එන කෙනෙක් කොහේ හරි විද්‍යමාන වෙන නිසා. ඒ කියන්නෙ එහෙම ක්‍රමවේදයක් තියෙන නිසා. අත්බැවකින් අත්බැවකට සම්බන්ධ අතරක් ගැන බුදුන් වහන්සේ දේශනා කරල නෑ කියන පින්වතුන්ට, පෙළ දහම් පොත්වලින් මේ සාක්ෂි පෙන්වන්න පුළුවන්.

ඛුද්දක නිකාය (1) 294 පිටුවේ එන චතුත්ථ නිබ්බාණ සූත්‍රයේ මෙහෙම පෙන්වා තියෙනවා. ''භවයෙන් භවයට යාමක්, ඒමක් නැති කල්හි චුති උප්පත්ති නොවේ. චුති උප්පත්ති නැති කල්හි මෙහි ද නොවේ. එහි ද නොවේ. මේ දෙක අතරෙහි ද නොවේ.'' මෙතනදී, අතර අවස්ථාවක් නැත්නම් ''මේ දෙක අතරෙහි ද නොවේ'' කියල දේශනා කළේ මොකද කියල හිතල බලන්න ඕන. ඛු. නි. (1) 144 පිටුවේ බාහිය සූත්‍රයෙන් ''තතෝ ත්වං බාහිය නේවිධ න හුරං න උභයමන්තරේ ඒසේවන්තෝ දුක්ඛස්සාතී'' බාහිය එවිට මෙහි ද නොවේ, එහිද නොවේ, ඒ අතරෙහි ද නොවේ, මේ දුකෙහි කෙළවරයි කියල දේශනා කරල තියෙනවා. අතර කතාව (අන්තරාභව) පිළිගන්න අකමැති වෙච්ච පැරණි ආචාර්යවරු ඒක මහායානික මතයක් විදියට බැහැර කරමින් ''මෙහි'' යනු කාම ලෝකයත්, ''එහි'' යනු අරූප ලෝකයත්, ''ඒ අතර'' යනු රූප ලෝකයත් විදියට අර්ථ පෙන්වා තියෙනවා. නමුත් මේ කාරණයේ යථාර්ථය හිතල බලන්න ඕන.

මේ සියලු කරුණු වසන් කරල, චුතිය හා උප්පත්තිය අතර, අතරක් නැතැයි පෙන්වන්න උත්සාහ කළත්, ඒ උත්සාහයන් අභිබවමින්, ''අතර'' තේරුම් ගැනීමට දේශනාවක් සංයුක්ත නිකාය (4) 700 පිටුවේ කුතුහලසාලා සූත්‍රයේ පෙන්වා තියෙනවා. එතනදී වච්ඡගොත්ත පරිබ්‍රාජක බුදුන් වහන්සේගෙන් මෙහෙම අහනවා. ''යස්මිංපන හෝ ගෝතම සමයේ ඉමංච කායං නික්ඛිපතී සත්තෝච අඤ්ඤතරං කායං අනුප්පන්නෝ හෝති ඉමස්ස පන භවං ගෝතමෝ කිං උපාදානස්මිං පඤ්ඤාපේතී - භවත් ගෞතමයන් වහන්ස, යම් කිසි සත්වයෙක් මේ සිරුර අතහැර දමයි, අන් කයකට ද පැමිණුනේ නැත. එකල්හි භවත් ගෞතමයන් වහන්ස කුමක් උපාදානය කොට පනවන්නේද?'' බුදුන් වහන්සේගේ පිළිතුර තමයි මේ. ''යස්මිං ඛෝ වච්ච සමයේ ඉමංච කායං නික්ඛිපතී. සත්තෝච අඤ්ඤතරං කායං අනුප්පන්නෝ හෝති, තමහං තණ්හූපාදානං වදාමි. තණ්හාහිස්ස තස්මිං සමයේ උපාදානං හෝති - වච්ච සත්වයෙක් මේ කය අතහරිනවා. වෙනත් කයකට ගියෙත් නෑ. මම, එවිට තණ්හා උපාදානය කර සිටින බව කියමි.'' මෙතන දී බුදුන් වහන්සේ සත්වයෙකුගේ මරණයත්, යළි උපතත් අතර, අතරක් තියෙන බවත්, ඒ කාලයේ තණ්හාව උපාදාන කරගෙන ඉන්න බවත් පැහැදිලිව දේශනා කරල තියෙනවා.

බුදුන් වහන්සේ මේ විදියට මරණයත්, යළි උපතත් අතර කාලයක් තියෙන බව පැහැදිලි කරල තියෙද්දිත්, අන්තරාභවය මහායානිකයන්ගේ අදහසක් විදියට සලකල යථාර්ථය ප්‍රතික්ෂේප කිරීම කණගාටුවට කරුණක්. තුන්වැනි ධර්ම සංගායනාවෙදි ප්‍රතික්ෂේප කරල තියෙන්නෙ මෙබඳු යථාර්ථවත් අන්තරාභවයක් නෙවෙයි, මහායානිකයන් හිස් ප්‍රලාප අදහස්වලින් ගොඩනගාගත් අන්තරාභව වාදයක්. ඒ නිසා විමසුම් නුවණකින් තොරව අන්තරාභවය කියන වචනය පමණක් අරගෙන, පැරණි අටුවාචාරීන් වහන්සේලා මේ යථාර්ථය ප්‍රතික්ෂේප කරල තියෙනවද කියල විමසා බැලීම වටිනවා.

කර්මක්ෂය, ආයුක්ෂය, උභයක්ෂය, උපච්ඡේදක කියල මරණ 4 ක් බුදු දහමේ විස්තර කරනවා. මේ හැම මරණයකින්ම පස්සෙ, කුඩැල්ල එක තැනක් අත් හැරල තවත් තැනක් අල්ලනව වගේ, අතරක් නැතිවම නැවත උප්පත්තියකට යනව නම්, උපච්ඡේදක (හදිසි අනතුරකදී කය බිඳීමෙන්) සහ කර්මක්ෂය කියන මරණ දෙක අතර තියෙන වෙනස මොකක්ද ? දැන් ඒක විග්‍රහ කරන්න ගියාම හිර වෙනවා. මොකද ඒ කතාව පිළිගත්තොත් මෙහෙම මරණ 2 ක් විග්‍රහ කරන්න බෑ. ඒ වගේම ආයුෂ ඉවර වෙන මොහොතෙ කර්මයත් ක්ෂය වුනොත් ඒක උභයක්ෂය මරණයක් විදියට හඳුන්වනවා. දැන් එතකොට හැම මරණයක් පාසාම අතරක් නැතිවම උපතක් සිදුවෙනවයි කියල කිව්වොත්, මේ මරණ දෙක අතර වෙනස පැහැදිලි කරන්නත් බැරි වෙනවා. කොටින්ම කියනව නම් මේ හතරම එකක් කියල පිළිගන්න වෙනවා. නමුත් බුදු දහම තුළ පැහැදිලිවම මරණ 4 ක් පෙන්වල තියෙනවා. අන්තරාභව කතාව ප්‍රතික්ෂේප කරන උදවියට මේවට උත්තර දෙන්නත් වෙනවා.

**''යෝ පටිච්ච සමුප්පාදං පස්සති, සෝ ධම්මං පස්සති''** කියන බුදු වදන අනුව, යම් තැනක තණ්හා උපාදාන විද්‍යමාන වෙනව නම්, ධර්ම චක්‍රය අනුව විමර්ශනය කරල නියම තතු වටහා ගන්න ඕන. විභංග ප්‍රකරණයේ හතර ආකාරයකින් ක්‍රියාත්මක වෙන පටිච්ච සමුප්පාද චක්‍රය තුළින් මේ ධර්ම කරුණු විසඳ ගන්න ඕන. ඒ හතර ආකාර පටිච්ච සමුප්පාද මාතෘකා නම්,

1. හේතු පටිච්ච සමුප්පාදය 2. ප්‍රත්‍ය පටිච්ච සමුප්පාදය 3. සම්ප්‍රයුත්ත පටිච්ච සමුප්පාදය 4. අඤ්ඤ මඤ්ඤ පටිච්ච සමුප්පාදය

මේවායේ අදහස කෙටියෙන් කියනව නම් අවිද්‍යා, සංඛාර, විඤ්ඤාණ, නාම රූප, සළායතන, ස්පර්ශ, වේදනා, තණ්හා, උපාදාන කියන මේවා එකිනෙකට හේතුකාරකව සම්බන්ධ වෙලා ගොඩනැගීම තමයි හේතු පටිච්ච සමුප්පාදය කියල කියන්නෙ. එකිනෙකට ප්‍රත්‍ය වෙමින්, විවිධ ආධාරයන් සමග සම්බන්ධ වෙමින් ගොඩනැගීම ප්‍රත්‍ය පටිච්ච සමුප්පාදය. එකිනෙක සමග යෙදෙමින් ගොඩනැගීම සම්ප්‍රයුත්ත පටිච්ච සමුප්පාදය. එකිනෙක අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙන් ගොඩනැගීම අඤ්ඤ මඤ්ඤ පටිච්ච සමුප්පාදය. මේ විදියට පෙන්වා තියෙන්නෙ, ඉහත කියපු කරුණු එකිනෙකට සම්බන්ධ වෙලා ගොඩනැගෙන ආකාර හතර ගැන.


යම් සිතක් අවිද්‍යා සහගතව ගොඩනැගෙනවද, ඒ සිත සමගම සංඛාර, විඤ්ඤාණ, නාම රූප, සළායතන, ස්පර්ශ, වේදනා, තණ්හා, උපාදානත් ගොඩ නැගෙනවා. ඒ නිසා මේ කය මැරිල මතු කයක් ලබන තුරු අතරෙහි තණ්හා උපාදාන වෙනව නම්, ඒ තණ්හා උපාදාන හේතු ඵලය පමණක් පවතින දහම් රටාවක් නෑ. යම් තැනක තණ්හා විද්‍යමාන වෙනව නම්, ඒක වේදනා ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. වේදනා ස්පර්ශ ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. ස්පර්ශයෝ සළායතන ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. සළායතන නාම රූප ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. නාම රූප විඤ්ඤාණ ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. විඤ්ඤාණ සංඛාර ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. සංඛාර අවිද්‍යා ප්‍රත්‍යයෙන්ම විය යුතුයි. මේ කය මරණයේ දී බහා තබා මතු කයකට සම්බන්ධ නොවෙච්ච අතර කාලය තණ්හා උපාදානය නිසා පවතින බව තමයි බුද්ධ දේශනාව. ඒ දේශනාව පිළිගන්නව නම් තණ්හා උපාදාන ගොඩ නැගෙන තැනම වේදනා, ස්පර්ශ, සළායතන, නාම රූප, විඤ්ඤාණ, සංඛාර, අවිද්‍යා ක්‍රියා සම්පිණ්ඩනය වෙලා තියෙන හැටි වටහගන්න ඕන. මේ සම්පිණ්ඩනයෙන් නිපදවුණේ සත්ත්වයෙක්මයි. ඒ සත්ත්වයාට තමයි ගන්ධබ්බ කියන්නෙ. තණ්හා උපාදාන කරල තියෙන නිසා කාම ලෝකයට අයිති කාම තණ්හා උපාදාන වෙලා තියෙනවා. වේදනා නිසා තණ්හා වන බැවින් වේදනා සහිතයි. ස්පර්ශ නිසා වේදනා වන බැවින් ස්පර්ශ සහිතයි. සළායතන නිසා ස්පර්ශ වන බැවින්

☞

සලායතන සහිතයි. නාම රූප නිසා සලායතන වන බැවින් නාම රූප සහිතයි. විඤ්ඤාණ නිසා නාම රූප වන බැවින් විඤ්ඤාණ සහිතයි. සංඛාර නිසා විඤ්ඤාණ වන බැවින් සංඛාර සහිතයි. ඒ නිසා කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර විද්‍යමාන විය යුතුයි. එතකොට ක්‍රියා කරන්න, කතා කරන්න, හිතන්න හැකියාව ඒ ගන්ධබ්බයාට තිබිය යුතුමයි.

**උසස් ධ්‍යාන අභිඥා සහිත අරිහතුන් වහන්සේලා, දික් කළ අතක් වක් කළ සැණින් බඹ ලොවට ගිහින් බ්‍රහ්මයන් සමග කතා කළ බව පෙළ දහමේ මනාව පෙන්වා තියෙන නිසා, මනෝමය කායික දේවතාවන්ට කයක් නැතැයි කියනව නම්, කයක් නැතිව කතා කරන්න, ක්‍රියා කරන්න බැහැයි කියනව නම්, ඒක රූප කායන්ගේ ස්වභාවයවත් තේරුම් නොගෙන මුළාවෙන් කරන නිගමනයක්.** මේ වගේ රූපාවචර බ්‍රහ්ම දේවතාවන්ගෙ කයටත් වඩා ඕලාරික (ඝනීභවනය) වෙච්ච කයක් තමයි ගන්ධබ්බයන්ට තියෙන්නෙ. චුතුපපාත ඥානයෙන් ලෝ සතුන් දෙස බලන කොට ගෙට ඇතුළුවන, ගෙයින් පිටවන, පාරේ සැරිසරන මිනිසුන් හා සත්ත්වයන් දකින විදියට දිවැසින් දකින්නෙ මේ ගන්ධබ්බ සත්වයන් බව තේරුම් ගන්න ඕන. (අං. නි. (5) හි 294 පිටුව - භූමිචාල සූත්‍රය) බෝසතාණන් වහන්සේලා තුසිත දෙව් ලොවින් චුත වෙලා සිහි ඇතිවම, නුවණ ඇතිවම මවු කුසට ඔක්කන්ති වෙන බව පෙන්වා තියෙනවා. ඒ වගේම පූර්වේනිවාසානුස්සති ඥානයෙන් පෙර අත්බැව් බලන කොට, කෙනෙක් යම් ගමකට ගිහින් ඒ ගමින් තව ගමකට ගිහින් මේ විදියට නැවත තමන් හිටපු ගමට ඇවිත් සිහිකරන කොට, මම මේ ගමට ආවෙ මීට ඉහත ගමක ඉඳල, එහිදී මේ මේ දේවල් ආහාර විදියට ගත්තා, මේ මේ අය සමග කතා බහ කළා, මේ මේ දේ කළා .... ආදී වශයෙන් පෙර අත්බවයන් දකින ආකාරයත් බුදු දහමේ මනාව පෙන්වා තියෙනවා.

රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන පහ, දම්වැලක පුරුක් සම්බන්ධය වගේ එකට එක බැඳිල පෙනෙන විදර්ශනා නුවණ නැති නිසා, ක්ෂණයක් පාසා හේතුඵල ලෙස ගොඩනැගෙමින්, මොහොතින් මොහොත බිඳෙමින් ක්‍රියාත්මක වෙන පංචස්කන්ධ ක්‍රියාදාමය නොවැටහෙන නිසා, ලෝ සතුන් ඒකට ''මම'' කියන සංඥාව අනාදියේ පටන් පහළ කරමින් ආත්ම දෘෂ්ටියට පත් වෙලා පංචස්කන්ධය ''මම''යි කියල ගන්නවා. ''මම'' කියන්නෙ පංචස්කන්ධය කියල ගන්නවා. පංචස්කන්ධය තුළ ''මම වෙමියි'' කියල ගන්නවා. මා තුළ පංචස්කන්ධය ඇතැයි කියල ගන්නවා. මේ විදියට එක ස්කන්ධයකට හතර ආකාරය බැගින් පංචස්කන්ධය ඇසුරින් විසි ආකාරයක ''මම ඇත'' කියන අවිද්‍යාවේ දෘෂ්ටියට පත්වෙනවා. මේකට තමයි සත්කාය දිට්ඨිය කියන්නෙ. උපතේ පටන් මියයන කල් ඉන්න කෙනෙක් විදියට පෙනුණත්, මියයන කොට එතනින් සූක්ෂම කායිකව යන කෙනෙක් විදියට පෙනුණත්, ගැබකට යන තුරු අතර සැරිසරන විදියට පෙනුණත්, ගැබකට ඔක්කන්ති වෙන විදියට පෙනුණත්, නැවත මස් ලේ කයකින් උපතකට ඇවිත් යළි ජීවත් වෙන සත්වයෙක් විදියට පෙනුණත්, අනාදි සසරේ පටන් මේ විදියට එන බව පෙනුණත් මේ හැම තැනම සිදු වෙලා තියෙන්නෙ හේතු ඵල ලෙස ක්ෂණයක් පාසා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ මාත්‍ර පහළ වෙමින් බිඳෙමින් හේතු ඵල වශයෙන්ම යළි යළි ගොඩනැගෙමින්, දම්වැල් පුරුක් එකට ඇඳී දම්වැල විදියට එකක් පෙනෙනව වගෙයි, පංචස්කන්ධ ක්‍රියාදාමයක් විද්‍යමාන වීම පමණයි.



විදර්ශනා නුවණින් මේ කාරණය අවබෝධ කර ගත්තම, අතීතයේ හිටපු විදියට පෙනුණෙ ''මම'' කියල කෙනෙක් නෙවෙයි මේ ක්‍රියාදාමයම බවත්, දැන් ඉන්න විදියට පෙනෙන්නෙත් ''මම'' කියල කෙනෙක් නෙවෙයි, මේ ක්‍රියාදාමයම බවත්, මතු අනාගතයේ පහල වෙනව නම් ඒත් ''මම'' කියල කෙනෙක් නෙවෙයි මේ ක්‍රියාදාමයම බවත් අවබෝධ වෙන්න ඕන. ඊට පස්සෙ ''මම'' කියල කතා කළත්, ''මට'' කියල කිව්වත්, ''මගේ'' කියල කිව්වත් ඒක ලෝක ව්‍යවහාර කතාවකට සීමා වෙනවා. ඒක ආත්ම දෘෂ්ටියකින් ගන්නෙ නෑ. හේතුඵල විදියට, හටගෙන බිඳෙන මේ වැඩපිළිවෙළ තුළ නිච්ච වූ කිසිවක් පහල නොවන හැටිත්, හේතුඵල ධර්මතාව අනුව ගොඩනැගෙන බිඳෙන ධර්මතාවක් නිසා තමන් කැමති අකමැති විදියට සිදු නොවන්නක් බවත්, මේ යථාර්ථය නොදන තමන් කැමති සේ පවත්වන්න යෑමෙන් වෙහෙසක්ම, දුකක්ම ගොඩනැගෙන බවත්, මේ පංචස්කන්ධ ක්‍රියාදාමය කොච්චර කලක් පැවතුණත් අසාරත්වයෙන්, දුක් දාහයෙන් කෙළවර වෙනව මිසක් කිසිම සාරත්වයක් ඇති නොවන බවත් යළි යළි සිහි කරන කොට, ''මම'' කියන සංඥාව දුරුවෙමින් අස්මි මානය යම් දිනක සහමුලින්ම දුරුවෙනවා. එදාට අරිහත්වය කියල කියනවා. පංචස්කන්ධයේ ඡන්දරාගයෙන් මිදුණු ඒ උතුමාට භවයට හේතුවෙන උපාදාන පහළ වෙන්නෙ නෑ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධ වෙනවා. භව නිරෝධයෙන් ජාති නිරෝධ වෙනවා. ජාති නිරෝධයෙන් ජරා, මරණ ඇතුළු මතු හට ගන්න තියෙන සියලු දුක් නිරෝධ වෙනවා. මේ තමයි විමුක්තිය.

අස්මි මානය කියන්නෙ ''මම වෙමි'' කියන අදහස. උදාහරණයක් විදියට කවුරුහරි ගහන්න ආවොත්, මම බේරගනියෝ කියල කෑ ගහන්නෙ මේ කියන අස්මි මානය නිසා. නමුත් රහතන් වහන්සේනමක් මරන්න ආවත් ජීවිතාසාවෙන්, මරණ භයෙන් කෑ ගහන්නෙ නෑ, දුවන්නෙ නෑ. ඒ අස්මි මානය දුරු කරපු නිසා. හැබැයි නිකරුනේ දුක් විඳින්න කැමති නැති නිසා හෝ කෙනෙක් කෙරෙහි අනුකම්පාවෙන් දුවල බේරෙන්න පුළුවන්. උදාහරණ විදියට තමන් මරන්න එන කෙනා ආනන්තරීය පාප කර්මයක් කරගන්න නිසා ඒ පුද්ගලයා කෙරෙහි අනුකම්පාවෙන් ඒ අවස්ථාව මග හරින්න පුළුවන්.

**මේකට හොඳ උදාහරණ කිහිපයක් තියෙනවා. මුගලන් මහ රහතන් වහන්සේ මරන්න හොරු කණ්ඩායමක් අවස්ථා හතරකදී උත්සාහ ගත්තා. මුල් අවස්ථා තුනේදීම උන් වහන්සේ ඒකෙන් මග හැරල බේරුණේ, නිකරුනේ වේදනාවෙන් පීඩිතවීමේ අකමැත්තත්, හොරුන් කෙරෙහි අනුකම්පාවත් කියන කාරණා දෙක මුල් කරගෙන. නමුත් ඒක වළක්වන්න බැරි කර්ම විපාකයක් කියල දැන ගත්ත නිසා, හතරවන අවස්ථාවෙදි නිහඬ වෙලා ඒ අවස්ථාවට මුහුණ දුන්නා.**

**ඒ වගේම සැවැත් නුවර එක්තරා වීදියක පිණ්ඩපාතෙ වැඩීමෙන් බුදුන් වහන්සේ වැළකිලා හිටියා. මොකද ඒ වීදියේ හිටපු එක්තරා යක්ෂණියක් උන් වහන්සේ දකින කොටත් තරහෙන් දත් කුරු කන්න පටන් ගන්නවා. ඉතින් ඒ යක්ෂණිය ප්‍රමුඛ යක්ෂ රැළ කෙරෙහි අනුකම්පාවෙන් උන් වහන්සේ ඒ වීදියේ පිණ්ඩපාතෙ වැඩියෙ නෑ.**

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

13 වන කොටස

බ්‍රහ්ම ලෝක විස්සේ පොදු ස්වභාවය ගැනත්, ඒවායින් අරූපාවචර බ්‍රහ්ම ලෝක 4 ගැනත්, රූපාවචර බ්‍රහ්ම ලෝකවලින් අසඤ්ඤ සත්ත තලය ගැනත් යම් පමණකට විස්තර කිරීමක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. අමතර දැන ගැනීම සඳහා රූපාවචර බ්‍රහ්ම ලෝක 16 න් ඉතිරි පහළොවේ ස්වභාවය ගැන නිරුක්ති සහිතව විස්තර කිරීමක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.

දැන් මේ රූපාවචර බ්‍රහ්ම ලෝක 16 ගත්තම ඒවා අයිති වෙන දැහැන් හෙවත් ධ්‍යාන තල 4 ක් තියෙනවා. ඒ තමයි පළවෙනි, දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි ලෙස එන දැහැන් තල 4. මෙයින් පළවෙනි දැහැන් තලයට අයිති වෙන්නෙ බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය සහ මහා බ්‍රහ්ම කියන බ්‍රහ්ම ලෝක 3. පරිත්තාභය, අප්පමාණාභය, ආභස්සරය කියන බ්‍රහ්ම ලෝක 3 දෙවන දැහැන් තලයට අයිති වෙනවා. පරිත්ත සුභ, අප්පමාණ සුභ, සුභ කිණ්හක කියන බ්‍රහ්ම ලෝක 3 තුන්වන දැහැන් තලයටත් වේහප්පල, අසඤ්ඤ සත්ත සහ පංච සුද්ධාවාස (අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සීය, අකනිට්ඨා) කියන බ්‍රහ්ම ලෝක 7, හතරවන දැහැන් තලයටත් අයිති වෙනවා. මේ විදියට තමයි මේ රූපාවචර බ්‍රහ්ම ලෝක 16 පිහිටන්නෙ.

**මේ රූප ලෝක 16 ගත්තම ඒවායේ ඉන්න බ්‍රහ්මයින්ට සියුම් කිරණමය කයක් තියෙන්නෙ. ඒ සියුම් කය දෙවියන්ට පේන්නෙත් නෑ. නමුත් බ්‍රහ්මයින්ට, බ්‍රහ්මයින් දකින්න පුළුවන්. හැබැයි ඒ දකින්නෙත් තමන්ගෙ තලයෙ ඉන්න බ්‍රහ්මයින් සහ එයින් පහළ තලවල ඉන්න බ්‍රහ්මයින් විතරයි. තමන්ට ඉහළින් පිහිටි බ්‍රහ්ම තලවල ඉන්න බ්‍රහ්මයින් දකින්න පහළ තලවල ඉන්න බ්‍රහ්මයින්ටත් බෑ.** උදාහරණ විදියට පළවෙනි දැහැන් තලයේ බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම කියන ලෝකවල ඉන්න බ්‍රහ්මයින්ට ඒ එකිනෙක ලෝක තුනේ ඉන්න බ්‍රහ්මයින්ගෙ රූප කාය දැක බලා ගන්න පුළුවන්. නමුත් ඊට ඉහළින් තියෙන දෙවන, තුන්වන, හතරවන දැහැන් තලවල




බ්‍රහ්මයින් දැක බලා ගන්න ඒ අයට බෑ. ඊළඟට දෙවන තලයේ ඉන්න අයට තමන්ට පහළින් තියෙන පළවෙනි තලයේ බ්‍රහ්ම ලෝක තුනත්, තමන්ගෙ තලයේ බ්‍රහ්ම ලෝක තුනත් දැකබලා ගන්න පුළුවන්. එයින් ඉහළ 3 - 4 කියන දැහැන් තලවල ඉන්න බ්‍රහ්මයින් ඒ අයට දැක බලා ගන්න බෑ. මෙහෙම ගිහින් හතරවන දැහැන් තලයෙ ඉන්න බ්‍රහ්මයින්ට මේ සියලුම ලෝක බලා ගන්න පුළුවන්. බ්‍රහ්මයෙකුට තවත් බ්‍රහ්මයෙක් බලාගන්න පුළුවන් වෙන්නෙත් මේ විදියට තමයි. ඒ වගේම බ්‍රහ්ම ලෝකවල ඉන්න බ්‍රහ්මයින්ට පහළ ලෝකවලට ගැලපෙන කයක් මවාගෙන එන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා තමයි අර පසුගිය කලාපයෙන් පෙන්වා දුන් ආකාරයට මහා බ්‍රහ්මයා දේව කයක් මවාගෙන සක්‍ර දෙවියන්ගෙ සුදම් සභාවට ආවෙ. ඒ එන කොටත් එළිය විතරයි පේන්නෙ. ඒ තරම් අති සියුම්.

දැන් මේ බ්‍රහ්ම ලෝකවලින් පහළින්ම තියෙන්නෙ පළමු දැහැන් තලයට අයිති බ්‍රහ්ම පාරිසජ්ජය. පරිස කියන්නෙ පිරිස කියන අර්ථය. ඒ කියන්නෙ එතනින් ජනිත වන බ්‍රහ්මයින්ගෙ සේවක පිරිස්. මේ පළවෙනි දැහැන් තලය ගත්තමත් හීන, මධ්‍යම, ප්‍රණීත කියල අවස්ථා 3 ක් තියෙනවා. හීන මට්ටමින් පළවෙනි දැහැන වැඩිච්ච පිරිස තමයි මේ බ්‍රහ්ම පාරිසජ්ජයේ ඉන්නෙ. ඊළඟට මධ්‍යම මට්ටමින් වැඩිච්ච අය තමයි බ්‍රහ්ම පුරෝහිත ලෝකයේ ඉන්නෙ. පුරෝහිත කියන්නෙ හිත පිරුණු කියන එක. ඒ කියන්නෙ යම්කිසි උපදෙස් දෙන්න පුළුවන් දැනුමක් තියෙන පිරිස. බ්‍රහ්ම පාරිසජ්ජ පිරිසට උපදෙස් දෙන්නෙ මේ අය තමයි.

ඊළඟට පළවෙනි දැහැන ප්‍රණීත අන්දමින් වැඩිච්ච අය මහා බ්‍රහ්ම ලෝකයේ උපදිනවා. ඒකෙ තමයි මූලික ප්‍රධාන පාලක බ්‍රහ්මයො ඉන්නෙ. ඒකෙ නායකයා තමයි මහා බ්‍රහ්ම කියල බක බ්‍රහ්ම ආදී වශයෙන් කියන්නෙ. ඒ කියන්නෙ ලෝක ආරම්භයේ දී පළවෙනි දැහැන් තලයේ ඉස්සෙල්ලම පහළ වෙච්ච බ්‍රහ්මයා. ඒ වගේ මහා බ්‍රහ්ම අය විවිධ කොටස් විදියට තවත් ඉන්නවා. ඒ කියන්නෙ ඒ හැම කෙනෙක්ම මහා බ්‍රහ්ම කියන කොට්ඨාශයට අයිති වුනාට ඒ ඒ කොටස්

පාලනය කරන වෙනම නායකයො ඉන්නවා. හරියට එක තාත්ත කෙනෙක්ගෙ දරුවන් වගේ තමයි. මීට අමතරව උසස් බ්‍රහ්මයින්ටත් පොදුවේ මහා බ්‍රහ්ම කියල සම්මතයක් විදියට හඳුන්වනවා. නමුත් ඒක මේ කාරණයට සම්බන්ධ නෑ. ඒ වගේම මේ බ්‍රහ්ම ලෝකවල, දිව්‍ය ලෝකවල වගේ අණ පනත් දෙන්නෙ නෑ. මහා බ්‍රහ්මය තමයි මේ පළවෙනි දැහැන් තලයේ තියෙන බ්‍රහ්ම ලෝක 3 ටම අධිපති වෙලා ඉන්නෙ. එතන උපදින කොටත් මහා බ්‍රහ්මයා ළඟ ඇකයේ උපදින අය දරුවො වගෙයි. බ්‍රහ්ම පුරෝහිත වගේ අය උපදින්නෙ ඊට ගැලපෙන මාළිගාවෙ වෙනත් තැන්වල. බ්‍රහ්ම සේවක පිරිස් පහළ වෙන්නෙ ඒවායේ අවට. මේ වගේ උපදින ස්ථානය අනුව තත්වය වෙනස් වෙනවා.

ඊළඟට දෙවෙනි දැහැන් තලයේ පළවෙනි එක තමයි පරිත්තාභය කියන බ්‍රහ්ම ලෝකය. ආභ කියන්නෙ යම්කිසි තැනක පිහිටි නිදහස් බව, ආලෝක ස්වභාවය. පරිත්ත කියන්නෙ යම් කිසි පිළිවෙලකට කුඩා ප්‍රමාණයකට කැටි කළා කියන අර්ථය. ඒ කියන්නෙ කුඩා ආලෝකයක්. උදාහරණයක් විදියට යම්කිසි කෙනෙක් කර්මස්ථානයක් වඩනවා. ඒක තව තවත් වඩාගෙන යනකොට ශක්තිය විහිදෙනවා. ඒ ආලෝක ශක්තිය තමන්ගෙ වටා හෝ තමන් ඉන්න පන්සල වටේ විහිදෙනවා. ඒ විදියට සීමා වෙච්ච ප්‍රමාණයකට විතරයි ඒ කිරණ ශක්තිය විහිදෙන්නෙ. වැඩෙන මට්ටමට අනුව තමයි ඒක සිද්ධ වෙන්නෙ. මේ වගේ ස්වභාවයක් තමයි පරිත්තාභයේ තියෙන්නෙ. දැන් මේ දෙවන දැහැන් තලයෙත් අර වගේම හීන, මධ්‍යම, ප්‍රණීත කියල අවස්ථා 3 ක් තියෙනවා. එයින් හීන මට්ටම හෙවත් අඩු මට්ටම තමයි පරිත්තාභයේ තියෙන්නෙ. අප්පමාණාභයේ තියෙන්නෙ මධ්‍යම මට්ටම. දැන් මෙහෙම කර්මස්ථානයක් වඩා ගෙන යන කොට සමහර වෙලාවට අප්‍රමාණව ඈතටත් ඒ කිරණ ශක්තිය විහිදෙනවා. දෙවන දැහැන වැඩිපුර වැඩුනම එහෙම වෙනවා. ඒක තමයි අප්පමාණාභය කියන්නෙ. ඊළඟට උපරිමයටම වඩන කොට ප්‍රණීත මට්ටමට එනවා. ඒ තමයි ආභස්සර ලෝකය. ඒ කියන්නෙ සම්පූර්ණයි. හැම තැනම සුද්ධ වෙලා සීමාවක් කරන්න බෑ. දෙවන දැහැනින් එන උපරිම මට්ටම තමයි මේ.

ඊළඟට තුන්වන දැහැන් තලයෙත් මේ විදියටම හීන, මධ්‍යම, ප්‍රණීත කියල අවස්ථා 3 ක් තියෙනවා. එයින් හීන මට්ටම තමයි පරිත්ත සුභ කියන්නෙ. සුභ කියන්නෙ චිත්ත ස්වභාවය. 3 වන දැහැන් තලයෙ තියෙන්නෙ මෙත්තා ගුණයෙන් නැගෙන චිත්ත ප්‍රසාදය. චිත්ත ප්‍රසාදය ටිකක් හෙවත් හීන මට්ටමට වඩපු අය තමයි මේ බ්‍රහ්ම ලෝකෙ ඉන්නෙ. සුභ කියන චිත්ත ස්වභාවය ටිකයි (පරිත්ත) මේ ලෝකෙ තියෙන්නෙ. තවත් ටිකක් වඩන කොට මධ්‍යම මට්ටමට එනවා. ඒක තමයි අප්පමාණ සුභ කියන්නෙ. මෙතනදී චිත්ත පාරිසුද්ධිය තමයි වැඩි. 3 වන දැහැන් තලයේ උපරිම හෙවත් ප්‍රණීත මට්ටම තමයි සුභ කිණ්හක කියන්නෙ. ඒකෙන් පූර්ණත්වයට ගියපු අවස්ථාවෙ තියෙන ක්ෂීණ බව දුරු කරපු කියන අදහස තමයි කිණ්හක කියන්නෙ. ක්ෂීණ භාවය ක්ෂය කරපු සුභය තමයි ඒ. ඒ කියන්නෙ කිසිම තැනක අඩුවක් නෑ, සුභයෙන් පූර්ණයි.

දැන් මේ හීන, මධ්‍යම, ප්‍රණීත



කියන අවස්ථා තමයි එකිනෙකට සණීභවනය වෙලා තියෙන්නෙ. ඒකෙන් තමයි දැනගන්නෙ මොන බ්‍රහ්ම ලෝකෙද කියල. පළවෙනි දැහැන වඩපු කෙනාට ඒ දැහැනට ආසන්නම හතුරු සේනාව තමයි පංච නීවරණ කියන්නෙ. එතකොට පළවෙනි දැහැන හීන අන්දමින් නම් තියෙන්නෙ, කොච්චරවත් පංච නීවරණයන්ට නැඹුරු වෙනවා, නැවතත් ඉවත් වෙනවා. එහෙම ඉන්න ස්වභාවයක් තමයි හීන මට්ටමේ තියෙන්නෙ. ඊළඟට මධ්‍යම මට්ටම තියෙන කෙනාට පළවෙනි දැහැනට සම වැඩුනම එතැනින් උඩට යන්නෙත් නෑ, පහළට එන්නෙත් නෑ. ඒ කියන්නෙ ඒකෙම ඉන්න පුළුවන්. ඒ විදියට අධිෂ්ඨාන කරල පැය ගාණක් හරි ඉන්න පුළුවන්. ප්‍රණීත අවස්ථාවෙදි හැම වෙලේම පළවෙනි දැහැනින් ඉහළට තියෙන දෙවන දැහැන අරමුණු වෙනවා. ආපහු පළවෙනි එකටම එනවා. ඒ විදියට තවත් ටිකක් උඩට යන්න බලනව මිසක් පළවෙනි දැහැනින් පල්ලෙහාට එන්නෙ නෑ. මේ ක්‍රමයට තමයි හීන, මධ්‍යම, ප්‍රණීත කියන අවස්ථා තියෙන්නෙ.

ඊළඟට සිවුවන දැහැන් තලය හීන, මධ්‍යම, ප්‍රණීත කියල වෙනසක් නෑ. ඒක පූර්ණ තලයක්. ඒ සිවුවන දැහැන් තලයෙත් පළමුවෙන්ම පිහිටි බ්‍රහ්ම ලෝකය තමයි වේහප්ඵල කියන්නෙ. වේහ කියන්නෙ වෙහෙසෙන කියන ස්වභාවය. වේහප්ඵල කියන්නෙ වෙහෙසෙන ස්වභාවයක් නෑ කියන එක. ඒ කියන්නෙ කය පවත්වන්නවත් වෙහෙසක් නෑ, දරා සිටින්න වෙහෙසක් නෑ. බොහොම සැහැල්ලුයි. මොකද ආලෝක පිඬක් තමයි කය වෙනුවට තියෙන්නෙ. වේහප්ඵලයේ ඉන්න අය කයක් මවා ගත්තොත්, ඒ මවා ගත්තු කයට තමයි ඉඳ ගන්න ආසන තියෙන්නෙ, ස්වභාවික කයට නෙවෙයි. ඒ කියන්නෙ ඒ ආලෝක පිඬෙන් කය විවිධාකාරයෙන් හදාගෙන, සනීභවනය කරගෙන අතපය දික් කරනකොට එතනදි වෙහෙසක් එනවා. එහෙම නැතිව ස්වභාවික කයට කායික වෙහෙසක් නෑ.

සිවුවන දැහැන් තලයේ ඊළඟට පිහිටපු අසඤ්ඤ සත්ත ලෝකය ගැන පසුගිය කලාපයෙන් විස්තර කළා. ඊළඟට සිවුවන දැහැන් තලයේ ඉහළින්ම පිහිටල තියෙන්නෙ පංච සුද්ධාවාස කියන බ්‍රහ්ම ලෝක 5. ඒ කියන්නෙ අනාගාමී වෙච්ච උදවිය ගිහින් උපදින බ්‍රහ්ම ලෝක 5. අනිත් බ්‍රහ්ම ලෝකවල වගේ නෙවෙයි මේ 5 සම්පූර්ණයෙන්ම ලෝකෝත්තර පැත්ත මුල් කරගෙන තමයි පිහිටන්නෙ. මේ පහෙනුත් පහළින්ම තියෙන අවිහය කියන සුද්ධාවාස බඹ ලොව ගත්තොත්, වෙහෙස නැති කියන අර්ථය තමයි අවිහය කියන වචනයෙන් පෙන්වන්නෙ. විහ කියන්නෙ වෙහෙස. අවිහය කියන්නෙ වෙහෙස නැති. හැබැයි මේක අර කලින් කියපු වේහප්ඵල කියන බඹ ලෝකයෙන් වෙනස් වෙනවා. ඒ කියන්නෙ වේහප්ඵල බ්‍රහ්ම ලෝකෙදි වෙහෙස නැති වෙලාම නෙවෙයි, තදංග වශයෙන් යටපත් වෙලා තමයි තියෙන්නෙ. හරියට රබර් බෝලයක් දිය යට දාල පාගගෙන ඉන්නව වගෙයි. පාග ගෙන ඉන්නකල් දිය යටම තියෙනවා. අත හැරිය හැටියෙම නැවතත් උඩට එනවා. මේ වගේ වේහප්ඵල බඹ ලොවෙත් ආයු කාලය ගෙවිල ඉවර වුණාම අර වෙහෙස නැවතත් එනවා. නමුත් අවිහයේදී එහෙම නෙවෙයි. එතනින් ආයු කාලය ඉවර වුනොත් ඊට ඉහළින් තියෙන සුද්ධාවාස බඹ ලොව උපදිනව මිසක් තවත් පහළට යන්නෙ නෑ. ඒ නිසා කායික වෙහෙස එන්න එන්නම තවත් අඩු වෙනවා. මේක තමයි වෙනස. ඒ කියන්නෙ කායික වෙහෙසක් ☞

නැත්තෙම නෑ කියන එක නෙවෙයි. **මොකද කයක පැවැත්මක් තියෙනව නම් වෙහෙස අනිවාර්යයෙන්ම එනවා. නමුත් විශේෂයෙන් තියෙන කායික වෙහෙසක් නෑ. උදාහරණ විදියට තෙල් බෝතලයක තෙල් ඉවර වුනාම අපි කියනව තෙල් නෑ කියල. හැබැයි පුළුං කෑල්ලක් දාල පිහදාල බැලුවොත් පොඩ්ඩක් හරි තියෙනවා. ඒ කියන්නෙ තෙල් තිබුණට ඒක වත් කරන්න පුළුවන් මට්ටමක නෑ. ඒ නිසා නෑ කියනවා. හැබැයි අර වගේ පිහදාල ගන්න තරම්වත් තෙල් කඳුලක් නැත්නම් එතන නැත්තටම නෑ. මේ විදියට නෑ සහ නැත්තටම නෑ කියන්නෙ අවස්ථා 2 ක්. රූපාවචර බ්‍රහ්ම ලෝකවල කායික වෙහෙසත් මේ වගේ. ඒ වෙහෙස නැත්තටම නැති වෙලා නෑ.** රූපාවචර බ්‍රහ්ම ලෝක සියල්ලේම කායික වෙහෙස ටිකක් හරි තියෙනවා. හැබැයි අරූප බ්‍රහ්ම ලෝකවල කායික වෙහෙසක් ඇත්තෙම නෑ. මේ දෙකටම මානසික වෙහෙස පොදුයි. නමුත් පරිනිර්වාණයේදී මේ කායික මානසික වෙහෙස නැත්තටම නෑ. කොහොම හරි ශ්‍රද්ධාව තමයි මේ අවිහ සුද්ධාවාස බඹ ලොවේදි අග්‍ර වෙන්නෙ. සද්ධාව නිසා පැහැදීම තියෙනවා. ඒ නිසා වෙහෙස දැනෙන්නෙ නෑ.

ඊළඟට දෙවන සුද්ධාවාස බඹ ලොව තමයි අතප්ප කියන්නෙ. තප්ප කියන්නෙ තවනවා, තර්පනය කරනවා කියන එක. එහෙම නැත්නම් තෙරපෙන ස්වභාවය. අතප්ප කියන්නෙ තැවෙන්නෙ නෑ, තෙරපෙන්නෙ නෑ කියන එක. ඒ කියන්නෙ උහුලන්න පුළුවන්. මොකද වීර්ය අධික නිසා. අනාගාමී වෙච්ච අයගෙන් වීර්යාධික අය තමයි මේ අතප්පයේ ගිහින් උපදින්නෙ. වීර්ය නිසා ඕන දෙයක් දරන්න පුළුවන්. තැවීමක් නෑ.

තුන්වෙනි සුද්ධාවාසය තමයි සුදස්සය කියන්නෙ. ඒ කියන්නෙ සුද්ධ දර්ශනය. එතන සතිය හෙවත් මනා දර්ශනය අධිකයි. ඒ සතිය නිසා යහපත් දේවල් දර්ශනය කරනවා. චතුරාර්ය සත්‍ය දර්ශනය බොහොම පැහැදිලියි. එතකොට තමයි හැම වෙලේම සතියෙන් ඉන්නෙ. හතරවෙනියට තියෙන සුදස්සී කියන සුද්ධාවාස බ්‍රහ්ම ලෝකෙ සමාධිය උපරිමයි, සුද්ධයි. මනා සේ දර්ශනය නිතරම බලපවත්වනවා. සුදස්සයටත් වඩා වැඩියි. වැඩි නිසා තමයි සුදස්සී කියල කියන්නෙ. මේ විදියට ගිහින් ඉහළම සුද්ධාවාස බඹ ලෝකය තමයි අකනිටා කියල කියන්නෙ. කෙලවරටම, නිෂ්ඨාවටම ගියා කියන එකයි ඒකෙන් කියන්නෙ. ප්‍රඥාව තමයි එතනදි අධික වෙන්නෙ.

දැන් මේ විදියට ශ්‍රද්ධාව, වීර්ය, සතිය, සමාධිය, ප්‍රඥාව කියන ඉන්ද්‍රියන් 5 මුල් කරගෙන තමයි සුද්ධාවාස බ්‍රහ්ම ලෝක 5 ක්‍රියාත්මක වෙන්නෙ. ඒ කියන්නෙ එක සුද්ධාවාසයක එක ඉන්ද්‍රියක් අග්‍ර වෙනවා. අනෙක් ඒවා නැතුව නෙවෙයි. නමුත් මොකක් හරි එකක් ප්‍රධාන වෙනවා. මේ 5 ගත්තම අවිහයේ ඉඳන් ඉහළට යන්න යන්න ශාන්තියත් වැඩියි. නමුත් ඒවායේ ඉන්න එකම මගඵල ලබපු දෙන්නෙක් අතර මගඵලවල වෙනසක් නෑ. ඒ වුණාට අර කියපු ඉන්ද්‍රිය නානත්වය නිසා වෙනසක් තියෙනවා. එතකොට මේ සුද්ධාවාස 5 ට යන එක තීරණය වෙන්නෙ මනුස්ස ලෝකයෙන් චුත වෙනකොට ඒ පුද්ගලයට තිබ්බ්ච ශක්තිය හා ඉන්ද්‍රිය නානත්වය මත. උදාහරණ විදියට අනාගාමී වෙලා චුත වෙච්ච කෙනෙක් ශ්‍රද්ධාව අධික නම් එක පාරටම අවිහයට යන්න පුළුවන්. වීර්ය අධික තවත් කෙනෙක් එක පාරටම



අතප්පයට යන්න පුළුවන්. එහෙම නැත්නම් ප්‍රඥාව අධික වෙලා අකනිටාවටම යන්නත් පුළුවන්. පංච සුද්ධාවාසවල ඉපදෙන එක ක්‍රමයක් තමයි මේ.

එහෙම නැත්නම් අවිහයේ ඉපදිච්ච කෙනෙක් එතන ඉඳල අතප්පය, සුදස්සය, සුදස්සීය, අකනිටා කියන බ්‍රහ්ම ලෝකවලට පියවරෙන් පියවර යන්නත් පුළුවන්. ඒ කියන්නෙ අවිහයේ ඉපදිච්ච කෙනෙක් අවිහයට හිමි ආයු කාලය ගත කරල ඉවර වුණාම ඊළඟට වීර්ය ඉන්ද්‍රිය ඒකාන්තයෙන්ම වැඩෙන්න ඕන. ඒක ධර්මතාවයක්. මොකද අවිහයට ගියේ ශ්‍රද්ධා ඉන්ද්‍රිය වැඩිල තිබ්බ්ච නිසා. එතකොට ඒකාන්තයෙන්ම නිරායාසයෙන්ම ඊළඟට එන්නෙ වීර්ය ඉන්ද්‍රිය. ඒකෙන් ඊළඟට අතප්පයට යනවා. එතනට හිමි ආයු කාලය ඉවර වුණාම ඊළඟට වැඩෙන්නෙ සති ඉන්ද්‍රිය. ඒකෙන් සුදස්සයට යනවා. ඊළඟට පිළිවෙලින් සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රියන් වඩාගෙන සුදස්සිය, අකනිටා කියන සුද්ධාවාසවල ගිහින් උපදිනවා. අකනිටාවෙන් ගමන කෙළවර වෙනවා.

හැබැයි අවිහයට ගියපු කෙනෙක් අරිහත් ඵලයට පත්වෙන්න අකනිටාවට යන්නම ඕන නෑ. අවිහයේ ඉඳගෙනමත් පුළුවන්. නමුත් ඒකෙන් කෙළවර නොකර තවත් ප්‍රමාද වුනොත්, ඒ වෙන කොට ආයු කාලයත් ගෙවිල ඉවර නම් තමයි අර විදියට පියවරෙන් පියවර යන්නෙ. මේ විදියට කෙනෙක් අවිහයේ ඉපදිලා, එතනදිම අරිහත්වයට පත්වෙලා සසර ගමන කෙළවර කරන්නත් පුළුවන්. තවත් කෙනෙක් අතප්පයේ ඉපදිලා එතනින් අරිහත්වයට පත්වෙලා සසර ගමන කෙළවර කරන්නත් පුළුවන්. මේ විදියට එක පාරටම මේ 5 න් මොකක හරි ඉපදිලා අරිහත්වයට පත්වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් මුලින් එකක ඉපදිලා ඊළඟට තවත් එකකට, දෙකකට හෝ අකනිටාවටම යනකල් ගිහින් රහත් වෙලා සසර ගමන කෙළවර කරන්නත් පුළුවන්. පුද්ගලයගෙ ඉන්ද්‍රිය මේරීම අනුව තමයි ඒ ගත වෙන කාලය තීරණය වෙන්නෙ. අවිහයට අයිති ආයු කාලය ඉවර වුනොත් සහ අරිහත්වයට පත්වෙලත් නැත්නම් කෙලින්ම එතනින් චුත වෙලා අතප්පයට යනවා. එතනිනුත් ඉවර කරගන්න බැරිව ආයු කෙළවර වුනොත් සුදස්සයට යනවා. මෙහෙම ගිහින් අවසානයේ තමයි අකනිටාවට යන්නෙ.

මේ විදියට යන ක්‍රම 2 න් එකක් මනුස්ස ලෝකෙදි වඩන ඉන්ද්‍රිය නානත්වය අනුව තීරණය වෙනවා. එතැනදි ඉන්ද්‍රිය වැඩිච්ච ප්‍රමාණය අනුව එක පාරටම මේ 5 න් එකක ගිහින් උපදිනවා. එහෙම නැත්නම් එකින් එකට යන්නත් පුළුවන්. හැබැයි සුදස්සියට ගියපු කෙනෙක් එතනින් අකනිටාවට යනව මිසක් නැවතත් සුදස්සයට එන්නෙ නෑ. ඒ වගේම අකනිටාවට ගියපු කෙනෙක් එතැනින් නැවත ආපස්සට පැමිණීමක් නෑ. ගමන එතනින්ම ඉවරයි. ඒ කියන්නෙ ඉහළ සුද්ධාවාසයකට ගියපු කෙනෙක් එතනින් පහළට පැමිණීමක් නෑ. ඉහළ සුද්ධාවාසයකට ගියපු කෙනෙක් අරිහත්වයට පත් නොවී ආයු කෙළවර වුනොත්, යන්න තියෙන ඊළඟ බඹ තලයට යනව මිසක් එතනින් පහළ බඹ තලයකට එන්නෙ නෑ. අකනිටාවට

ගියපු කෙනෙක් ආයු කාලය ඉවර වෙන කොටම අරිහත්වයට පත් වෙනවා.

හැබැයි එහෙම අරිහත්වයට පත්වුනේ නැත්නම් එතැනින් පස්සෙ එන්නෙ පශ්චිම භවික චිත්තය. ඒ කියන්නෙ හුඟක්ම ප්‍රමාද වුනොත්. මාන, උද්දච්ච, අවිද්‍යා බිඳිල තිබුනෙ නැත්නම් සහ කාම රාග, රූප රාග, අරූප රාග කියන 3 ත් බිඳිල ගියානම්, අකනිට්ඨාවෙ ඉන්න කෙනෙක් අරිහත්වයට පත් නොවී ආයු කාලය ඉවර වුනොත්, මාන - උද්දච්ච - අවිද්‍යා 3 ට පිහිටන්න පරිසරය නැතිව යනවා. මොකද ඒ 3 නිකම් පිහිටන්න බෑ. ඒකටත් පරිසරයක් අවශ්‍යයි. ඒ පරිසරය ගොඩ නැගුවෙ නැත්නම් නාම - රූප ධර්ම ගොඩ නැගෙන්නෙ නෑ. යම් තැනක කාම රාග, රූප රාග, අරූප රාග කියන 3 ම නැත්නම් නාම රූප ධර්ම ගොඩ නගන්න විදියක් නෑ. උප්පත්ති පටිලාභය එතන නෑ. එතකොට පරිසරය නැති නිසා එතැනින් චුත වෙනවා. චුත වුනාට පස්සෙ යන්න තැනක් නෑ. ඒකට පශ්චිම භවික අවස්ථාව කියල කියනවා. මේක මතු උපතක් බලාපොරොත්තුවෙන් සැරි සරන අවස්ථාවක් නෙවෙයි. පශ්චිම භවික කියන්නෙ භවය අවසානය. අරිහත්වයෙන් ලැබෙන ප්‍රතිඵලයක් ඇත්ද, ඒකම තමයි මෙතනින් ලැබෙන්නෙ. වෙනස තියෙන්නෙ අරිහත් ඵලය ලබපු කෙනෙක් මාන, උද්දච්ච, අවිද්‍යා කියන 3 ජීවමාන අවස්ථාවෙදිම ඉවර කරල ඉන්නෙ. නමුත් පශ්චිම භවික අවස්ථාව ගත්තොත් මේ කියන සංයෝජන ධර්ම 3 අවසාන මොහොතෙදි තමයි ඉවර වෙන්නෙ. ඒ ඉවර වෙන්නෙත් පිහිටන්න තැනක් නැති නිසා. එතකොට පිරිනිවන් පෑවා හා සමානයි. දැන් අමුතුවෙන් කරන්න දෙයක් නෑ.

පිරිනිවන් කියන්නෙ නිවනින් පිරුණා කියන එක, කෙලෙස් නැති කිරීමෙන් පූර්ණ වුනා කියන එක. වාන හෙවත් කෙලෙස්වලින් නිවුනා කියන අර්ථයෙන් තමයි නිර්වාණ කියල කියන්නෙ. මාන, උද්දච්ච, අවිද්‍යා තියෙනව නම් කෙලෙස් නිවිල නෑ, පූර්ණ වෙලා නෑ. නිර්වාණය තියෙනවා. නමුත් පරිනිර්වාණය එන්නෙ නෑ. පරිනිර්වාණය වෙච්ච කෙනාගෙ අවසානයයි, පශ්චිම භවිකයගෙ අවසානයයි දෙකම එකයි. පශ්චිම භවික කෙනාටත් මතු උපතක් නෑ. පිරිනිවන් පාපු කෙනාටත් මතු උපතක් නෑ. පශ්චිම භවිකයා පිරිනිවන් පානව කියල කියන්නෙත් ඕකම තමයි. වචන 2 ක්. පිරිනිවන් පාන්නෙ රහතන් වහන්සේ. රහත් නොවී පශ්චිම භවයට යන අයත් ඉන්නවා. පිරිනිවන් පාන කෙනාට කයත් එක්ක ඉඳෙද්දිම සියලු දේ ප්‍රහීනයි. නමුත් පශ්චිම භවිකයාට කයත් එක්ක ඉන්නකල් මාන, උද්දච්ච, අවිද්‍යා 3 තියෙනවා. ඒ තුන නාම රූප ධර්මවලින් තොරව පිහිටන්න විදියක් නෑ. තණ්හා උපාදානවලින් තොරව නාම රූප ධර්ම පිහිටන්න විදියක් නෑ. එතකොට කාම, රූප, අරූප කියන තුන් භවයම අරමුණු කලේ නැත්නම් ඒ පුද්ගලයාට මතු භවයක් නෑ. ඒ කියන්නෙ උප්පත්ති පටිලාභීත්වය ඉවරයි. දැනට භව පටිලාභීත්වය විතරයි තියෙන්නෙ. ඒකත් කර්ම ශක්තියෙන් ගෙනාපු භවයේ ආයුස ඉවර වෙන කොට අවසන් වෙනවා. මේ භව පටිලාභී අවස්ථාවෙදි භවයයි, ජාතියයි (මතු උපත) දෙකම එකට ඉවර වෙන්නෙ සුද්ධාවාසවලදි. ඒක මනුස්ස ලෝකෙදි වගේ නෙවෙයි. මනුස්ස ලෝකෙදි නම් භවය ඉතිරි වෙලා ජාතියෙන් (උප්පත්තියෙන්) මිදෙන්න පුළුවන්. ඒ භව පටිලාභය තියෙන නිසා තමයි මනුස්ස ලෝකෙ සමහර අය අන්තරාභවිකව ඉන්නෙ. නමුත් පංච සුද්ධාවාස ගත්තම සුද්ධාවාසවලින් චුත වෙන කොට එහෙම අන්තරාභවික අවස්ථාවක් නෑ, කෙලින්ම ඊළඟ සුද්ධාවාසයට යනවා. එනම් පටිසන්ධිය. ඒ කියන්නෙ උප්පත්ති පටිලාභය. ඒ අය සූක්ෂම කයකින් තමයි කොහොමත් ඉන්නෙ. ඒක උප්පත්තියත් එක්කම පවතින්න තියෙන නියමිත කාලය පවතිනවා. භවය යම් තාක් දිගයිද උප්පත්තියත් ඒ තාක් කල් දිගයි. නමුත් මනුස්ස ලෝකයේ අපට එහෙම ඉන්න බෑ. පිරිනිවන් පාන කල් භවය දිගටම තියෙනවා. නමුත් පැවැත්මට කය දුර්වල නිසා සහ උප්පත්තිපටිලාභීත්වයක් නැත්නම් රහත් නොවෙච්ච සමහර අයට අන්තරා පරිනිබ්බායී අවස්ථාවක් තියෙනවා.

ඊළඟට මේ සුද්ධාවාස බ්‍රහ්ම ලෝක 5 ගත්තම ඒවායේ ආයු කාලයත් එකිනෙකට වෙනස්. වැඩිම ආයු කාලයක් තියෙන්නෙ අකනිට්ඨාවෙ. අවිහයේ තමයි අඩුම ආයු කාලයක් තියෙන්නෙ. ඉහළට යන්න යන්න ක්‍රමයෙන් ආයු කාලය වැඩි වෙනවා. අෂ්ඨාංග, නවාංග, අරිය ආදී වශයෙන් පෙන්වන උපෝසථ සූත්‍රවල එකින් එකට මේ දිව්‍ය බ්‍රහ්ම ලෝකවලට හිමි ආයුෂ ප්‍රමාණයන් විස්තර කරල තියෙනවා.

දැන් සුද්ධාවාස 5 න් අනාගාමී ඵලය හෝ එයින් එහාට ගියපු මගඵල ලාභීන් හැරෙන්න බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය වගේ අනෙක් බඹ ලෝකවලත් සෝවාන්, සකෘදගාමී අය ඉන්න පුළුවන්. හැබැයි ඒ අය එතනින් චුත වෙලා නැවතත් කවදාවත් දේව මනුස්ස ලෝකවලට එන්නෙ නෑ. එතන ඉඳෙද්දි අනාගාමී වුනොත් කෙලින්ම අර සුද්ධාවාසවලට යනවා. ඒ කියන්නෙ ක්‍රමයෙන් ඉහළට යනව මිසක් ආපස්සට එන්නෙ නෑ. එහෙම නැත්නම් දැනට ඉන්න බ්‍රහ්ම ලෝකයේ ඉඳගෙනම අරිහත් ඵලයට පත්වෙන්නත් පුළුවන්. උදාහරණ විදියට බ්‍රහ්ම පාරිසජ්ජයේ ඉන්න කෙනෙක් ඒකෙ ඉඳගෙනම රහත් වෙලා එතනදිම පිරිනිවන් පාන්නත් පුළුවන්. එහෙම නැත්නම් අනාගාමී වෙලා සුද්ධාවාස 5 ට ගිහින් එතනදි රහත් වෙලා පිරිනිවන් පාන්නත් පුළුවන්. හැබැයි බ්‍රහ්ම පාරිසජ්ජය වගේ සුද්ධාවාස නොවන බඹ ලොවක ඉන්න කෙනෙක් සෝවාන් හෝ සකෘදගාමී හෝ වෙලා ඉඳල එක පාරටම අරිහත් වුණොත් පිරිනිවන් පාන කල් ඒ බඹ තලයේම ඉන්නවා. නැවත පටිසන්ධියක් නෑ. නමුත් බ්‍රහ්ම පාරිසජ්ජයේ ඉන්න කෙනෙක් සකෘදගාමී වෙලා ඉඳල අනාගාමී වෙලා අත්භව කෙළවර චුත වුනොත් කෙලින්ම පංච සුද්ධාවාසයට යනව මිසක් වෙන තැනකට යන්නෙ නෑ. එතනදි අරිහත් වෙන්න පුළුවන්. හැබැයි මනුස්ස ලෝකයේ ඉඳල අනාගාමී වෙන අය අතරින් කාන්තාවන් කෙලින්ම පංච සුද්ධාවාසයට යන්නෙ නැතිව මුලින්ම වේහප්ඵල වගේ චතුර්ථ ධ්‍යාන තලයක ඉපදෙන බව අභිධර්ම ප්‍රදීපිකාවේ සඳහන් වෙනවා. එතනින් අරිහත්වයට පත් නොවී චුත වුනොත් ඊළඟට තමයි පංච සුද්ධාවාසයට යන්නෙ. පිරිමි අය නම් කෙලින්ම මනුස්ස ලෝකයෙන් චුත වෙලා පංච සුද්ධාවාසයට ගිහින් උපදිනවා. (මේ පිළිබඳ විස්තරයක් අන්තරා භවිකයා සම්බන්ධ ලිපි පෙළින් ඉදිරියේදී බලාපොරොත්තු වන්න.)


දැන් මේ බ්‍රහ්ම ලෝකවල තියෙන නිදහස් සුවයක් ගැන මේ ලිපියෙන් විස්තර වුනාට, ඒ සියලුම සුවයන් අත් විඳින්න වෙන්නෙ අර පසුගිය කලාපයෙන් විස්තර කරපු දුක් ස්වභාවයන්ට යටත්ව කියන කාරණයත් තේරුම් ගන්න ඕන. මොකද මේ තුන් භවයෙම දුකක් නැති කිසිම තැනක් නෑ. ඒක අඩු වැඩි වශයෙන් මේ හැම ලෝකයකම පවතිනවා. ඒ නිසා සුවය වුනත් සාපේක්ෂව පවතින එකක් මිසක් පූර්ණ නිදහස් සුවයක් මේ කිසිම ලෝකයකින් ලබාගන්න පුළුවන් වෙන්නෙ නෑ. ඒක ලැබෙන්නෙ නිවනෙදි විතරයි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# පත අට එකට ඉන්දවීම ...



මස් ලේ කයක් සහිත මනුස්සයාට ඇතිවන විවිධ ලෙඩ රෝගවලට බෙහෙත් හේත් හඳුන්වා දුන් පැරණි අෂ්ටාංග ආයුර්වේදය (යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍ර, මෝහන, නර්තන ... ආදී වශයෙන් හැඳින්වෙන අංග 8 ක එකතුවක්), හෙළ වෙදකම.... ආදී නම්වලින් හැඳින්වෙන වෙද හෙදකම් සාස්ත්‍රයේ පුරෝගාමීන් වුණේ එදා හිටපු සෘෂිවරුන්. එතකොට මේ සෘෂිවරුන් කියන්නෙ වෙන කවුරුවත් නෙවෙයි, පෙරුම් පුරන බෝසත්වරු. බෝසත්වරු කිව්වම ලොවුතුරා බුදු, පසේ බුදු, ශ්‍රාවක බුදු කියන මේ තුන්තරා බෝධියෙන්ම පෙරුම් පුරන බෝසත්වරු අයිති වෙනවා. බුදුන් වහන්සේ පහළ වෙන්න පෙර, මේ සමාජයේ ජීවත් වෙච්ච මනුස්සයින්ට ලෞකික ගුණ ධර්ම තුල පිහිටල යහපත් විදියට ජීවත් වෙන්න මග පාදා දුන්නෙ මේ සෘෂිවරුන්. මේ නිසා එදා හිටපු සෘෂිවරුන් කිසිම ගුරු මුෂ්ටියකින් තොරව, මෙලොව වශයෙන් යහපත අභිවෘද්ධිය උදා කරගන්න පුළුවන් ලෞකික වන්නා වූ විවිධ යහපත් ක්‍රම මනුස්සයින්ට දායාද කළා. ඒ විදියට ආපු දායාදයක් (දිය යුතු දේවල්) තමයි මේ වෙදකම කියන්නෙ.

නමුත් පසුකාලීනව මනුස්සයා විවිධ ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජුවීම නිසා අර එදා හිටපු සෘෂිවරු දුන්න ඒ වෙදකම් ශාස්ත්‍රයෙත් වටිනා කොටස් හංගගෙන, ඒවාට විවිධ මතිමතාන්තර කාවද්දල, ඒ ක්‍රමවේදය විවිධ විපරීතයන්ට භාජනය කළා. හරියට බුදුන් වහන්සේ පෙන්වා දුන් නිවන් දකින දහම පසුකාලීනව විවිධ මතිමතාන්තරවලින් අර්ථ විපරීතයන්ට ලක් වුණා වගේම තමයි. **ලෝකයට පහළ වෙන උතුම් සත්පුරුෂයන් විසින් මනුස්සයාගේ යහපතට හඳුන්වා දෙන මේ හැම දෙයක්ම, පසුකාලීනව මේ ආකාරයට විවිධ ලාභ, කීර්ති, ප්‍රශංසා හෝ මුලාව නිසා විපරීතයන්ට ලක්වීම, පොදුවේ ලෝකයේ හැම තැනම දකින්න තියෙන දෙයක්.** කොහොම හරි මේ පැරණි වෙදකමටත් අද වෙන කොට ඒක තමයි සිද්ධ වෙලා තියෙන්නෙ. එතකොට ඒකෙ ප්‍රතිඵලය තමයි, ඒ කරන බේත් හේත් ප්‍රත්‍ය වෙන්නෙ නැතුව යන එක. එතකොට බලාපොරොත්තු වෙච්ච ප්‍රතිඵල නොලැබී යාම නිසා, මිනිස්සු ඒ වෙදකමටත් ඒවා කරන උදවියටත් දොස් කියනවා. නමුත් එදා තිබ්බ්ච වෙද හෙදකම් පටලවා ගැනීම තමයි ඇත්ත වශයෙන්ම සිද්ධ වෙලා තියෙන්නෙ. දැන් මේ හෙළිදරව් කරන්න උත්සාහ කරන්නෙ අපේ පැරණි වෙදකමේ ඒ විදියට තිබිල සැඟවිලා ගියපු වටිනා මූලධර්මයක්.

යම්කිසි කසායක්, බේතක් හදාගන්න කොට පත අට එකට හිඳිනවා කියල කියමනක් අද වෙන කොට භාවිතා කරනවා. ඒ කියන්නෙ වතුර කෝප්ප 8 ක් යොදාගත් බේත් ඖෂධ ටිකේ ප්‍රමාණය කෝප්ප 1 දක්වා හිඳෙන කල් රත්කර ගන්න කියන එක තමයි ඒකෙන් අදහස් කරන්නෙ. නමුත් මේ කතාවෙ මූලධර්මය මොකක්ද, ඒකෙන් ඇඟවෙන කාරණය මොකක්ද කියන එක පැහැදිලි කරන්නෙ නෑ. මෙතනදී දහමේ එන ''ඒවං උපසංහරති'' කියන උපමා සංසන්දනයෙන් කරුණු පහදා ගැනීම මේ වෙදකමෙත් එන දෙයක්. උදාහරණ විදියට **යම්කිසි රාජ්‍යයක් සතුරන්ගෙන් බේරගෙන ජයග්‍රහණය කරල, දැහැමි සාමකාමී පාලනයක් ගෙනියන්න පුද්ගල පිරිස් 8 ක්** ප්‍රධාන වශයෙන් අවශ්‍ය වෙනවා. ඒ අට **පිරිස පැරණි රාජ්‍යවලත් හිටියා. රජතුමා, බිසව, පුරෝහිත, මහ ඇමති, සෙන්පති, ඔත්තුකරුවො, සොල්දාදුවො සහ කසල සෝදකයො තමයි මේ අට පිරිස. මේ අට පිරිස සමගියෙන් එකට එකතු වුනාම සතුරන් ජය අරගෙන රාජ්‍යය ගෙනියන්න පුළුවන්කම ලැබෙනවා.**

මෙන්න මේ වගේම තමයි අපේ කය කියන රාජ්‍යය බැක්ටීරියා, වෛරස් ... ආදී විසබීජත් එක්ක සටනක් ගෙනියනවා. එතකොට මොකක් හරි ලෙඩක් හැදුනම ඒක සනීප කරන්න ඒකට අවශ්‍ය කරන සටන්කාරයො ටික අදාල තැන්වලට යවන්න ඕන. ඒ සටනින් අපි පරාජය වුනොත් අපේ ඇඟට රෝග ලක්ෂණය දැනෙනවා. ඒ වෙලාවට බේතක් දෙනව කියන්නෙ, අර කියපු අට පිරිස අට ආකාරයකින් ශක්තියක් දෙන එක. එතකොට ඒ අට එකතු කරල යම්කිසි ගුලියක් හරි පෙත්තක් හරි කසායක් හරි හදල බොන්න දුන්න නම්, අර අට පිරිසගේ ක්‍රියාකාරීත්වයෙන් ඒ බේත ප්‍රත්‍ය වෙලා, විසබීජ කියන සතුරන්ගෙන් කය කියන රාජ්‍යය ආරක්ෂා වෙනවා. ඒකට ඒ බේත තුල මේ කියන අට පිරිස අඩංගු වෙන්න ඕන. මෙතනදී අට පිරිස කියල සංකේතවත් කරන්නෙ ගුණ අටක්. ඒ කියන්නෙ **රාජ්‍යයක ඉන්න අර අට පිරිසගේ තියෙන ගති ගුණ ස්වභාවයන් අට තමයි මේ බෙහෙත්වලත් අඩංගු වෙන්නෙ.**

සමහර වෙලාවට අරළු වගේ බේතක් ගත්තම මේ අටම ඒකෙ තියෙනවා. ඒ වගේම බුළු, නෙල්ලි ආදියෙත් එකක් විතරක් නෙවෙයි අර 8 න් කිහිපයක්ම අඩංගු වෙන්න පුළුවන්. එතකොට අට පිරිස හදන්න මේ වගේ කිහිපයක්

එකට එකතු කරනවා. ඒ කියන්නෙ ඒ වගේ ඔසු වර්ගවල එකිනෙකට සම්බන්ධතාවයන් තියෙනවා. ඉතින් අරළු, බුළු, නෙල්ලි, තල් සූකිරි ආදිය ගත්තම සමහර විට මේ හතරෙනුත් බෙතක් හදන්න පුළුවන්. එතකොට අර අට පිරිසම එකට ඉන්නවා. දැන් මේ එකට ඉන්න කොට ඒක වෙනම විග්‍රහ කරන්න ගියොත් හරි අමාරුයි. මොකද දැන් මේ හැදිච්ච බෙත් මිශ්‍රණයේ අර අට පිරිසම ඉන්නවා. එතකොට ඒ අට පිරිස හැඳෙන්නෙ මේ විදියට මිශ්‍ර කළාම. ඉතින් මොන බේතෙ අහවලා ඉන්නවද කියල හරියටම කියන්න අමාරුයි. කොහොම හරි අරළු බිව්වම බඩ විරේක වෙනවා. ඒ විරේක වෙන්නෙ කසල සෝදකය ඒකෙ ඉන්න නිසා. ඒ කියන්නෙ පුද්ගලයෙක් නෙවෙයි, කසල සෝදක ගුණය ඒ බේතෙ තියෙන නිසා. ඒ බඩ විරේකයෙන් යම් කිසි රෝගයක් සනීප වෙනව නම් ඉතිරි හත් දෙනත් (ගුණ 7 ත්) අරළුවල ඉන්නවා. මොකද කසල සෝදකයට විතරක් තනියෙන් රාජ්‍යයක් සුද්ධ කරල පවත්ව ගෙන යන්න බෑ. එයා ඉන්නෙ අන්තිමට. ඒ නිසා අර අනෙක් හත් දෙනාගෙ සහයෝගයත් අනිවාර්යෙන් අවශ්‍යයි. එතකොට තමයි රාජ්‍යය ජයග්‍රහණය ලැබුව වෙන්නෙ. මෙන්න මේ වගේ අරළු බිව්වම බඩ විරේක වෙලා රෝගය සනීප වුනයි කියන්නෙ අරළු ඇතුලෙ කසල සෝදකය ඇතුලු අනිත් හත් දෙනත් ඉන්නවා කියන එක.



එතකොට මුලින්ම අරළු ගත්තම අනෙක් සියලු ඖෂධ අතර මූලික ඔසුවක් වෙනවා. ඒ කියන්නෙ රජ්ජුරුවෝ වෙනවා. ඊළඟට මේ අරළුවල යම්කිසි ආකාරයක ඇලෙන බැඳෙන ගතියක් තියෙනවා. ඒ ගතිය නිසා යම්කිසි තැනක තියෙන්නා වූ ඒ අල්ලා ගැනීමේ ශක්තිය තමයි බිසව කියන්නෙ. ඊළඟට පුරෝහිත කියන්නෙ යම්කිසි ආකාරයකින් විවිධාකාර රෝගවලට ප්‍රත්‍ය වෙන ශක්තිය. ඒ ශක්තිය අරළුවල ගැබ්වෙලා තියේ නම් ඒක පුරෝහිත වගේ තමයි. ඊළඟට මහ ඇමති කියන්නෙ යම්කිසි ප්‍රධාන මෙහෙවරක් කරන්න, සටන මෙහෙයවීමට පිරිස ප්‍රධාන වශයෙන් ගොනු කරන තැනැත්තා. ඒ සේනාව හෙවත් පිරිස ක්‍රියාත්මක කරවන්නෙ සෙන්පති. යම්කිසි රෝගයක් ගැන කියන කොට සියලු ආකාරයෙන් ඒකට අවශ්‍ය කරන දේ ඔක්කොම එක තැනකට කොටු කර ගන්න, ඔක්කොම එක පොදියට සේනාවක් වශයෙන් ඇදල ගැනීමේ ශක්තියක් ඒකෙන් ලැබෙනවා. එතකොට ඒ විසබීජ තියෙන තැන් බලල ඔත්තුව දෙන්නෙ ඔත්තුකරුවෝ. එහෙම ඔත්තුව දීල අල්ල ගෙන, විසබීජ දක්ක ගමන් අණ දීමේ ශක්තියක් ඒකෙන් ලැබෙනවා. ඊළඟට සොල්දාදුවෝ හෙවත් මුර භටයින්ට ඒ අණ ලැබුනම ඒ විසබීජ අල්ලගෙන මරනවා. ඊළඟට විසබීජ මැරුවට පස්සෙ මරපු තැනින් අපද්‍රව්‍ය වශයෙන් පිට කරන්නෙ කසල සෝදකයො. එතකොට එක අරළු ගෙඩියක මේ ගුණ 8 ම තියෙනවා.

දැන් මෙතනදී රජතුමා තමයි සටන මෙහෙයවන මූලිකයා. රජතුමා නැත්නම් මේ එකක්වත් නෑ. ඒක රාජ්‍යයක් නෙවෙයි. අරළු කියන වචනයෙන් යමක් හඳුන්වනවද ඒ හඳුන්වන දේ තමයි ප්‍රධාන වෙන්නෙ. ඒකෙ රසය තමයි බිසව වෙන්නෙ. දැන් මේ ආදී වශයෙන් තමයි මේ අට පිරිස දායක වෙන්නෙ. මේ අට එකට ඉන්දවන එක තමයි බෙහෙතෙදි කරන්නෙ. **පැරණි අෂ්ටාංග ආයුර්වේදයේ මේ ''ඉන්දවා'' කියන වචනය තමයි පසු කාලයක ''හිඳවා'' කියල හදාගෙන තියෙන්නෙ.** ඒ කියන්නෙ වතුර පත් 8 ක් දාල ඒක 1 ක් දක්වා හිඳ ගන්නවා. නමුත් එතනදී සමහර විට බේතෙ තියෙන නියම ඖෂධ ශක්තිය අධික රත්වීම නිසා ඉවත් වෙන්න පුළුවන්. හැබැයි ඒ කාරණය කවුරුවත් දන්නෙ නෑ. ඉතින් කසායක් හදනව කියල මෙහෙම කළාම අර විදියෙ හානියක් වෙන ස්වභාවයක් ඒකට තියෙනවා. ඒ කාරණය අපිට ඔප්පු කරන්න පුළුවන් අවස්ථාවක් තියෙනවා.

දැනට මේ බටහිර බේත් ආදියත්, ඒ වගේම ගුලි, කල්ක ආදියත් ගත්තම ඒවා අමු බේත් අරගෙන තමයි හදල තියෙන්නෙ. එහෙම නැතිව අටක් එකට හිඳවල නෙවෙයි. එතකොට ඒවායේ වැඩිපුර ඖෂධ ශක්තියක් අර කසායට වැඩියෙන් තියෙනවා. දැන් මේකට වතුර පත 8 ක් දාල 1 ට හිඳින්න ගියාම වෙන්නෙ අර ඖෂධ ශක්තිය අඩු වෙන එක. එහෙනම් අට එකට හිඳවන්නෙ නැතිව, එකට ඉන්දෙව්වම ලැබෙන උපරිම බලයෙන් ලෙඩ රෝග සනීප කරන්න පුළුවන්.

එහෙනම් **අරළු ගන්න කොට පත 8 ක් දාල 1 ට හිඳවන්නෙ නැතිව, අමු අරළු ගෙඩියක් හැපුව නම් වඩා හොඳයි. ඉස්සර හිටපු මිනිස්සු අරළු ගෙඩියක් හක්කෙ තියාගෙන හප හපා ඒකෙ තියෙන කහට ගතිය කටේ තියා ගත්තා.** දත් දිරුවෙත් නෑ, ලෙඩක් ආවෙත් නෑ. ඒ තරම් ශක්තියක් ඒකෙ තිබුණා. ඒ කියන්නෙ අර අට පිරිස හෙවත් ගති 8 එකට ඉන්දෙව්වා. ඒකෙන් විශාල ශක්තියක් ලැබුණා. නමුත් පසු කාලයේ තමයි මේ ඉන්දවා කියන එක හිඳවා කියල වෙනස් වුණේ. දැන් වතුර කෝප්ප 8 ක් දාල ඕක 1 ක් වෙනකල් හිඳිනවා. නමුත් බේතෙ නියම ඖෂධ ශක්තිය ගන්න නම් අට එකට ඉන්දවන්න ඕන. සමහර විට එක ඔසුවක එක අංසයකින් මේ අටම තියෙන්න පුළුවන්. සියලු අංසවලින් නෙවෙයි. රෝගය අනුවත් ඒක වෙනස් වෙන්න පුළුවන්. මොකද විවිධ රෝගවලට අවශ්‍ය කරන ප්‍රතිශක්තිය, ඖෂධ ශක්තිය වෙනස්.

දැන් මේ වගේ අවස්ථාවක මේ අට ගන්නෙ යමක් නැති කරන්න, නිරෝධ කරන්න. එතකොට තුන් ලෝකයේ තියෙන භයානකම රෝගය තමයි භව රෝගය. දැන් මේ භව රෝගය නැති කරන්න බෙහෙත් ඖෂධ දුන්නෙ බුදු පියාණන් වහන්සේ. ඒකට අවිද්‍යා නිරෝධය, සංඛාර නිරෝධය, විඤ්ඤාණ නිරෝධය, නාම රූප නිරෝධය..... ආදී වශයෙන් කියන පටිච්ච සමුප්පාදයේ අංග 12 ම නිරෝධ වෙන්න ඕන. එතකොට තමයි භව රෝගය සංසිඳෙන්නෙ. මෙන්න මේ 12 සංඛ්‍යාව අරගෙන තමයි කයේ රෝග නිවාරණයට ගන්න කසාය ආදිය හදන කොටත් කලං 12 ක් ගන්නෙ. මොන ඖෂධ වර්ග ගත්තත් ඒවායේ ප්‍රමාණයන්ගේ එකතුව කලං 12 යි.

උදාහරණ විදියට ඖෂධ වර්ග 24 ක් ගන්නව නම් එකකින් කලං 1/2 බැගින් ගන්න ඕන. ඖෂධ වර්ග 12 ක් ගන්නව නම් එකකින් කලං 1 බැගින් ගන්න ඕන. වර්ග 8 ක් ගන්නව නම් කලං 1 1/2 බැගින් ගන්න ඕන. 6 ක් ගත්තොත් කලං 2 බැගින් ගන්න ඕන. 4 ක් ගත්තොත් කලං 3 බැගින්. 3 ක්

ගත්තොත් කලං 4 බැගින්. 2 ක් ගත්තොත් කලං 6 බැගින්. 1 ක් ගත්තොත් ඒකෙන් කලං 12 ම ගන්න ඕන. මේ ආදී වශයෙන් ගන්න කොට කලං 12 ඉක්මවන්න බෑ. මේ විදියට ඒ එක එක වර්ගයේ ඖෂධවලින් අර 8 පිරිස එකට ඉන්දවල තිබුණ නම්, ඒවායේ එකින් එකට ඒ 8 පිරිසට අයිති ගුණයන් තියෙනවා. එතකොට මේ කලං 12 කැටි කරපු ඖෂධය සර්ව සම්පූර්ණයි. ඒක විශේෂයක්. දැන් මේ විදියට කලං 1/2, 1, 1 1/2, 2, 3, 4, 6, 12 වශයෙන් අපිට අවශ්‍ය ගණන් යොදා ගන්න පුළුවන්. හැබැයි කලං 5 ක් ගන්න බෑ. මොකද එතකොට 12 ක් හැදෙන්න විදියක් නෑ. කලං ගණන දශම ගණන්වලින් ආවට ඖෂධ වර්ග දශමවලින් එන්න විදියක් නෑ. මේ විදියට කලං 5 කියල ගත්තොත් ඖෂධ වර්ග 2.4 ක් විය යුතුයි. නමුත් ඒක වෙන්න විදියක් නෑ. මේ නිසා කලං 5 කියල ගාණක් හැදෙන්නෙ නෑ. මේ දීපු සංඛ්‍යා ටිකට විතරයි කලං ගණන ගණන් ගන්නෙ. මේ නිසා කලං 5 සමව එන විදියට කිසිම කෙනෙක් බේත් වට්ටෝරුවකට ලියන්නෙ නෑ. එහෙම ලියපු පුස්කොල පොතක්වත් හොයාගන්න නෑ.

හැබැයි මෙතනදී එක බෙහෙතකට අවශ්‍ය හැම වර්ගයකින්ම කලං 5 බැගින් ගන්න බැරි වුණාට, වර්ග දෙකකින් කලං 5 බැගින් අරගෙන ඉතිරි කලං 2 වෙනත් වර්ගයකින් හෝ වර්ග දෙකකින් ගන්න පුළුවන්. උදාහරණ විදියට අරළු කලං 5 යි, බුළු කලං 5 යි ගත්තොත්, ඉතිරි කලං 2 වෙනත් වර්ගයකින් හෝ දෙකකින් ගන්න පුළුවන්. මේ නිසා කලං 5 යොදා ගන්නව නම් මේ ක්‍රමයට තමයි යොදා ගන්න වෙන්නෙ. කලං 7, 8 ආදී සංඛ්‍යාත් මේ මූල ධර්මයට අනුව යොදා ගන්න පුළුවන්. මොකද මේ කලං 12 අරගෙන තියෙන්නෙ බෙදෙන ගණනකින් නිසා මේ ක්‍රමය පසු කාලීනව වැහිල ගියා.

මෙතනදී **කලඳ කියල කියන්නෙ කලාවක් ඉන්දවනවා කියන එක. කලාවක් කියන්නෙ එක්තරා කොටසක්. එහෙම නැත්නම් මිම්මක්. ඒ මිම්ම ඉන්දවනවා කියන එකයි කලඳ කියන්නෙ. මේක තමයි කලර් (Colour) කියල ඉංග්‍රීසියෙන් කියන්නෙත්.** රතු පාට එක විදියක්, නිල් පාට එක විදියක්, කහ පාට එක විදියක්. මේ විදියට එක එක කලාවන්. ඒ නිසා තමයි කලර් කියන්නෙ. ඉංග්‍රීසි භාෂාව ඇතුළු ලෝකයේ තියෙන ඕනෑම භාෂාවක වචනයකට හෙළ බසින් නිරුක්ති දෙන්න පුළුවන් බව මේ දහම් සඟරාවේ පළ වෙච්ච නිරුක්ති ලිපි පෙළෙන් මේ වෙන කොටත් ඔප්පු කරල තියෙන නිසා මේ කාරණය දැන් ගැටළුවක් වෙන්න විදියක් නෑ.

එතකොට මේ විදියට කලං ගණන ගන්න හේතුවක් තියෙනවා. මේ කියපු විදියට භෞතික වශයෙන් එදා හිටපු මූලික බ්‍රාහ්මණ පිරිස හෙවත් මහ සෘෂිවරු පෙන්වා දීපු ලෞකික පටිච්ච සමුප්පාදය බුදුන් වහන්සේ පහළ වෙන්න පෙරත් තිබුණා. එතකොට ලෝකෝත්තර පටිච්ච සමුප්පාද අර්ථය තමයි බුදුන් වහන්සේ පෙන්වා දුන්නෙ. ලෞකික පටිච්ච සමුප්පාදයේ අර්ථයන් තිබ්ච්ච නිසා ඒ අය බොහෝ කොටම ඒ දහම් අර්ථයන්ට අනුකූල වන්නා වූ භෞතික ක්‍රියාකාරකමක් ඒ අනුසාරයෙන් ගෙතුවා. එහෙම ගොතා ගැනීමේ ප්‍රතිඵලයක් තමයි කලං 12 ක් අරගෙන බෙහෙත් ඖෂධ සකස් කර ගැනීමේ ක්‍රියාවලිය.

උදාහරණ විදියට අරළු කලං 6 යි, සුදු සූකිරි කලං 6 යි කුඩු කරල අරගෙන තැඹිලි ගෙඩියක ඇස්ස කපල තැඹිලි වතුරට දාල, නැවතත් ඇස්ස වහල හවස පිනි බාන තැනක තියනවා. ඊට පස්සෙ උදේට ඒ තැඹිලි වතුර ටික අරගෙන පෙරාගෙන බොන්න ගන්නවා. එහෙම බිව්වට පස්සෙ ටික වෙලාවක් ආහාර නොගෙන උණු වතුර, තේ වගේ දේවල් බිව්වම බඩ විරේක වෙලා සුද්ද වෙනවා. මේ ක්‍රමයෙන් තුන් දොස් කැපෙනවා. හැබැයි මේක දියවැඩියාව තියෙන අයට සුදුසු නෑ. මේ ඉස්සර තිබ්ච්ච ක්‍රමයක්.

ඊළඟට අට එකට ඉන්දවනව කියල එකක් හදාගත්තෙ අරි අටඟි මග අරගෙන සමාධියට (සමයට) පත්වෙලා රෝග සමනය කරන්න එකක් හදන්න පුළුවන් කියන එක. ඒ කියන්නෙ අරි අටඟි මග අනුගමනය කරල සමාධිය කියල එකක් පහළ කරගන්න පුළුවන්. එතකොට අරි අටඟි මග කියන මේ අට එකට ඉඳවන්න ඕන. හිඳවල හරියන්නෙ නෑ. සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය .... කියන මේ අට එකට හිඳවන්න බෑ. ඉඳවන්න පුළුවන්. එතකොට අට එකට ඉන්දවල දෙනකොට එතන හිඳින්න දෙයක් නෑ. එහෙම අටම එකට ඉන්දවල කසාය ලැබෙනකල් විතරක් උණු කරනවා. එහෙම නැත්නම් කුඩු අරගෙන ගුලි හදා ගන්නවා. මේ වගේ අවශ්‍ය පදමට ගන්නව මිසක් අට එකට හිඳෙන තරම් බොහෝ ප්‍රමාණයක් රත් කරන්න ගියොත් ඖෂධ ශක්තිය නැති වෙනවා. ඒ නිසා රත් කරන්න ඕන, අවශ්‍ය ප්‍රමාණයට මිසක් අටක් එකට හිඳෙන ආකාරයට නෙවෙයි. නමුත් අට එක දක්වා හිඳින නිසයි අද මේ හෙළ වෙදකමට තැනක් නැති වෙලා තියෙන්නෙ. ඉතින් පුළුවන් නම් දන්න කෙනෙක් මේ කාරණය පරීක්ෂණයක් කරල තේරුම් ගන්න උත්සාහ කරනව නම්, මේ කියන කාරණාවල සත්‍ය අසත්‍යතාවය හොයාගන්න පුළුවන්.

***වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :***

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සගරාවේ 24 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාරමහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ රාජ් නිල්මිණී විජේවික්‍රම මහතා - ගොඩගම ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ඩබ්. ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායකවූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ♦සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය ඇතුළු පවුලේ සැම - කඩවත - රු. 10,000/- ♦ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 6,970/- ♦ තුසිත නාකන්දල මහතා - මහනුවර- රු. 6,000/- ♦ අමිත් හඳුගොඩ ☞

මහතා - අත්තිඩිය - රු.5,000/-♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනෙවිය - මහරගම - රු. 5,000/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා - පොල්ගහවෙල - රු. 5,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 3,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ නීල් මුණසිංහ මහතා - පොල්ගස්ඕවිට - රු. 3,000/- ♦ නන්ද සුදුසිංහ මහතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦ වසන්ත අබේසිංහ මහතා සහ පත්මා කහදුව මහත්මිය - කහතුඩුව - 2,500/- ♦නලින් සේකර මහතා සහ ඩබ්. ප්‍රේමවතී මහත්මිය - වළල්ලාවිට - රු. 2,500/- ♦ නිරෝෂ් සපරමාදු මහතා - කොච්චිකඩේ - රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ දර්ශන පෙරේරා මහතා - පිළියන්දල - රු. 1,500/- ♦ එස්.ඩී. පුණ්‍යවතී මහත්මිය - පිළියන්දල - රු. 1,500/- ♦ ගයාන් ගුණරත්න මහතා ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,150/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ - රු. 1,000/- ♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ♦ කේ.ඒ.උපාලි ජිනදාස මහතා - ගැටහැත්ත - රු. 1,000/- ♦ පී.වී. පත්මසිරි මහතා - කිතුල්ගල - රු.1,000/- ♦ ධනුෂ්ක ජයවර්ධන සහ කල්ප ජයවර්ධන මහත්වරු ඇතුළු පවුලේ සැම - කඩුවෙල - රු. 1,000/- ♦ රමණී වික්‍රමසූරිය සහ තිලකා වික්‍රමසූරිය මහත්මීන් ඇතුළු පවුලේ සැම - කඩුවෙල - රු. 1,000/- ♦ කේ. අමරතිලක මහත්මිය - මහරගම - රු.1,000/- ♦ කුසුම් ගම්ලත් මහතා - හාල්දඩුවන - රු.1,000/- ♦ශමීන් බණ්ඩාර මහතා - උඩුබැද්දෑව - රු.1,000/- ♦ශ්‍යාමල් බණ්ඩාර මහතා-කුරුණෑගල - රු. 1,000/-♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය- බොරලැස්ගමුව - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ නන්දනී කරස්නාගොඩ මහත්මිය - රදාවාන - රු.1,000/- ♦ ජී.ඩී. සුනිල් රණසිංහ මහතා - ගොඩගම - රු.1,000/- ♦ අමිල සතරසිංහ මහතා - ග්‍රෑන්ඩ්පාස් - රු.1,000/- ♦ ශශිකා කරවිට මහත්මිය - හෝමාගම - රු.1,000/- ♦ එස්. ගුණවර්ධන මහත්මිය - හෝමාගම - රු.1,000/- ♦ ජනූ විමුක්ති ලංකේෂ්වර පුතා - තිස්සමහාරාමය - රු.1,000/- ♦ මහසෙන් ලංකේෂ්වර මහතා - බෙන්තොට - රු.1,000/- ♦ ඩී. මාලනී මහත්මිය - බෙන්තොට - රු.1,000/- ♦ තුෂාර දෙළුම්දෙණිය මහතා - වැලිවේරිය - රු.1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුර සම්පත් මහතා, ලාල් කෝට්ටේගොඩ මහතා, සිරිල් කෝට්ටේගොඩ මහතා - කළුතර, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය, යමුනා පෙරේරා මහත්මිය - පිළියන්දල, නිමල් අත්තනායක මහතා - වැල්ලම්පිටිය, අයි. සේනානායක මහත්මිය - නෑදුන්ගමුව, එම්. සේනානායක මහත්මිය - ජා ඇල, චන්ද්‍රා දයදේව මහත්මිය - වල්ගම්මුල්ල, ජී.බී. ඩිශාන්ත මහතා - කඩුවෙල, රු. 10,000/- ♦ වෙනත් පිංවතුන්ගෙන් ලද මුදල් පරිත්‍යාග - රු.320/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 120,440/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 22,958/- ♦ සම්පූර්ණ වියදම - රු. 255,458/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,
හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,
අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,
දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ
අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද
නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත
බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනයඃ webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්ඃ**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගයඃ නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

# සසර ගනු-දෙනු...



සකි ඔබ මේ කවිය කියවන මොහොතෙ පවා
දකිනට ඇත මැරෙන සත තව සතෙකු ලවා
රකිනට වෙර දරන පණ නල උදය හවා
හැකි වෙද නිම කරනු ගනුදෙනු මෙලෙස ගෙවා

කැපි කැපි කෙටී කෙටී මැරෙනා සතුන් නෙක
හැපි හැපි තිදොස් තුළ හදවත කරන් වක
තොපි හිටපියව් පළිගන්නට කියන් රැක
කිපි කිපි සැරී සරයි ලොව අවිදුවෙන් දැක



තුන් ලොව හැම තැනම ඇති මේ කැපෙන ගතී
සුන් නොම වේ දකින තෙක් සත් දහමෙ පැතී
වෙන් වෙන විටදී පළිගන්නට සිතද ඇතී
උන් නොනැවතී යළි මතු උපතකට යතී









එක් සතෙකුගේ දත් පහරින් මියෙන සත
දක්නට ඇස් දෙකට අපමණ ලොවෙහි ඇත
දැක්කෙම නැතත් නොපෙනෙන සත වැඩිම වෙත
බොක්කම කන්න ඉපදුන සත අඩුද නැත





පෙර භවවලත් මේ ලෙස ගනුදෙනු කළද
හැර ගිය බවක් නැත ගියමුත් කප කෙළද
විරසක වෙලා හිටිමුත් සසරෙහි නොලද
කරගත යුතු දෙයක් ඇත මේ කය මළද







නිමා නොවන සසරෙහි ගනුදෙනු නේක
අමා දම් නොදැක පියවෙද කවදාක
පමා නොවී නුවණින් සිහි කර ඒක
තමා ගැනම විමසනු තතු දැක ලෝක

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# සසර පුරුදු







තිබුණොත් පුරුද්දක් එය කළෙකකි පෙරත
යෙදුණොත් හේතු ඇති තැන එය යළි පුරත
හැදුණොත් කයක් පැවතී කලකදී දිරත
මැරුණොත් උපන් තැන පෙර පුරුදුම දරත

හොඳ හෝ නරක දෙකටම එක ලෙස යනෙන
සදනා පුරුදු ඇත හැම දෙනටම දැනෙන
විඳවා දුක සැපත දෙක උපදින තැනෙන
නොදවා හුරුව සසරෙහි එත යළි සැණෙන

තිරිසන් මිනිස් දෙවි බඹ හැම ලොව සතට
සිරිතෙන් පෙර වැඩූ පුරුදුම එති සිතට
චරිතෙන් නැගෙන විට එපුරුදු හොඳ අතට
චරිගෙන් කුමක් වුව එය වෙයි මතු සෙතට

නරක හුරුව තිබුණොත් එන විට පෙර දී
තුරක අතර නැතිවම යන තැන පරදී
වරක දැනුණ විට පුරුදුද ලෙස වැරදී
දුරක නොයා අත හැර ගනු හැකි වෙර දී

යහපත් පුරුදු පමණක් හුරු කර ගන්න
දහමක් ඇත ලොවේ පෙර මුනිවරු දුන්න
සහයක් අරන් වැඩුවොත් එපුරුදු ගොන්න
පහනක් විලස එයි මතු එළි කඳ දෙන්න

සසර පුරුදු යහපතටම හරව ගෙන
නිතර හුරු කළොත් හේතුවෙ එලය දැන
අතර මගදී දුරු වී බාධකද එන
එතෙර වනු පිණිස එයි පෙර කරපු පින

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 98/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී